# The SIGNALLER

SRI LANKA SIGNAL CORPS JOURNAL - 2019





ශ්‍රී ලංකා සංඥා බලකාය 75 වන සංවත්සරය සැමරීමට සමගාමීව 2018 නොවැම්බර් මස 28 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද සම්මන්ත්‍රනය සඳහා සහභාගී වූ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හා දෙස් විදෙස් නියෝජිතයින් සමූහ ඡායාරූපයකට පෙනී සිටි අවස්ථාව.



ශ්‍රී ලංකා සංඥා බලකාය විසින් 2018 නොවැම්බර් මස 28 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් විවෘත කරන ලදුව එය නැරඹීමේ අවස්ථාව



ශ්‍රී ලංකා සංඥා බලකායට වසර 75ක් සපිරීම නිමිත්තෙන් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 19 දින සපැමිනි යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එන්යූඑම්එම්ඩබ් සේනානායක ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී යූඑස්ඒසීජීඑස්සී වෙත පිරිනමන ලද සම්මාන පෙළපාලිය




ශ්‍රී ලංකා සංඥා බලකාය 75 වන සංවත්සරයට සමගාමීව 2018 නොවැම්බර් මස 28 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද "සයිබර් අවකාශය සදාතනික යුධ පෙරමුණ" සම්මන්ත්‍රණයේ පැවති සාකච්ඡා වටයේ මුලසුන මේජර් ජෙනරාල් එන්එම් හෙට්ටිආරච්චි ඩබ්ලිව්එස්වී යූඑස්පී පීඑස්සි එච්ඩීඑම්සී විසින් හෙබවූ අවස්ථාව




ශ්‍රී ලංකා සංඥා බලකායට වසර 75ක් සපිරීම නිමිත්තෙන් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 19 දින සන්ද්‍යාවේ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එන්යූඑම්එම්ඩබ් සේනානායක ආර්ඩබ්පී ආර්එස්පී විඑස්වී යුඑස්පී යුඑස්ඒසීජීඑස්සී ප්‍රධානත්වයෙන් සහ සංඥා බලකාධිපති, ප්‍රධාන සංඥා නිලධාරී සහ අනෙකුත් සේවයේ යෙදී සිටින නිලධාරින්ද , විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේද සහභාගීත්වයෙන් කොළඹ හිල්ටන් හෝටලයේ දී පවත්වන ලද රාත්‍රී සාදය

# "The Signaller" සඟරාවේ ගමන් මග

# 1998 සිට 2019 දක්වා .....































































# කතුවැකිය

ශ්‍රී ලංකා සංඥා බලකායට වසර 76 ක් සපිරෙන මේ අවස්ථාවේ වාර්ෂිකව පලකරනු ලබන ''ද සිග්නලර්'' සඟරාවේ ප්‍රධාන සංස්කාරක වශයෙන් කටයුතු කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකමි.

1998 වර්ෂයේ ආරම්භ වී මෙම සඟරාව එළිදැක්වීම දක්වා ආගමන් මඟ පිළිබදව ඉතා ආඩම්බරයෙන් සිහි කිරීමට කැමැත්තෙමි. ශ්‍රී ලංකා යුද්ධ හමුදා තොරතුරු සන්නිවේදනයේ පෙරගමන්කරු වන ශ්‍රී ලංකා සංඥා බලකායේ සෑම වසරක් පුරා සිදුවුවා වු කාලීන සිදුවීම් සෑම සාමාජිකයෙකුටම දැන ගැනීමටත් ඔවුන්ගේ නිර්මාණශීලී හැකියාව විදහා දැක්වීමට හා ස්වකීය දැනුම වර්ධනය කර ගැනීමටත්, තාක්‍ෂණයෙන් පිරිපුන් හමුදාවක් ගොඩනැගීමෙහිලා සංඥා බලකාය වෙතින් ඉටුකර දෙනු ලබන සේවය තවදුරටත් පුළුල් පරාසයක් කරා ගෙන යාමටත් තම නිර්මාණාත්මක අදහස් එළිදැක්වීමටත් ''ද සිග්නලර්'' සඟරාව ඉතා කදිම තෝතැන්නක් වු බැවි නිසැකය.

මෙම සඟරාව සිත්ගන්නාසුළු අයුරින් හා හරවත් අයුරින් සකස් කර මුද්‍රණය කිරීම සඳහා විවිධ අයුරින් දායක වු සංඥා බලකාධිපතිතුමා ඇතුළු සියළුම නිලධාරීන් සහ සෙසුනිලයන්ටත්, කාලෝචිත හා නිර්මාණශීලී අදහස් නිර්මාණයන්ගෙන් දායක වු සැමටත් මෙවර කලාපය අලංකාර අන්දමින් සංස්කරණය කර ඔබ අතට පත් කිරීමට වෙහෙස වී කටයුතු කළ සංස්කාරක මණ්ඩලයටත් ප්‍රධාන කර්තෘ වශයෙන් කෘතඥතාපූර්වකව ස්තුතිය පුද කරනු කැමැත්තෙමි.

**බීඅයි අස්සලආරච්චි යුඑස්පී පීඑස්සී**
**කර්නල්**
**ප්‍රධාන සංස්කාරක**

රෙජිමේන්තු මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා සංඥා බලකාය
යුද හමුදා කඳවුර
පනාගොඩ
හෝමාගම

Tel : +94112855361
E-mail : rhqslsc@army.lk
Web : www.army.lk/signaller

# පටුන

| | |
|---|---|
| සංඥා බලකාධිපතිගේ පණිවුඩය | 1 |
| අභිමානවත් 75 වසරක සංඥා බලකා ඉතිහාසය | 3 |
| අභිමානවත් 75 වන සංවත්සරය සැමරීම | 13 |
| මතක පොතින් | 23 |
| විශේෂ අවස්ථාවන් | 65 |
| සංඥා ක්ෂිතිජයෙන් ඔබ්බට | 67 |
| පදක්කම් / උසස් වීම් / ජයග්‍රහණ / පාඨමාලා | 69 |
| ක්‍රීඩා දක්ෂතාවයන් | 73 |
| මන්දාකිණිය | 76 |
| කැටපත් පවුර | 81 |
| මංගල සීනු | 83 |
| සංවේගයෙන් සිහිපත් කරමි | 85 |
| ගෞරවණීය උපහාර | 87 |

# සංඥා බලකාධිපතිගේ පණිවුඩය



වසර 76 ක අභිමානවත් ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා සංඥා බලකායේ 11 වන බලකාධිපති වශයෙන් "ද සිග්නලර්" සඟරාවේහි 21 වන කලාපය වෙනුවෙන් පණිවිඩයක් නිකුත් කිරීමට හැකිවීම සම්බන්ධයෙන් මා අතිශය සතුටට පත්වෙමි. වර්තමාන යුද්ධ හමුදාව තුල තාක්ෂණික උපකරණ හා පරිගණක උපාංග භාවිතා කරමින් යුද්ධ හමුදා සන්නිවේදන ජාලයන් උසස් මට්ටමකට ගෙන එම සඳහා ශ්‍රී ලංකා සංඥා බලකාය ලබාදුන් අසීමිත දායකත්වය සංඥා බලකාධිපති වශයෙන් මා මෙහිදී සිහිපත් කරනුයේ ඉතා අභිමාණයෙනි.

එසේම දශක තුනකට අධික කාලයක් රට තුල පැවති ත්‍රස්ථවාදයට එරෙහිව සිදු කල මානුෂීය මෙහෙයුම් වලදී සිය ජීවිත පූජාකරමින් හා තුවාල ලබමින් විවිධ ආබාධිත තත්වයන්ට පත්වෙමින් අද දින අප සියළු දෙනා අත් විදිනා ගෞරවාන්විත වූ සාමය උදාකර දීමට ක්‍රියාකල සංඥා බලකායේ සියළු විරුවන් මම ඉතා ගෞරවයෙන් සිහිපත් කරමි.

සංඥා බලකායෙහි පසුගිය කාලසීමාව තුල කාලීන සිදුවීම් පිළිබඳ අප සාමාජිකයින් දැනුවත් කිරිම හා නිර්මාණශීලී හැකියාවන් ඇති අයවලුන්ගෙ කුසලතාවයන් වැඩි දියුණු කිරීමේ තෝතැන්නක් බදු "ද සිග්නලර්" සඟරාව වාර්ෂිකව නිකුත් කරන අතර, එමගින් සංඥා බලකායේ නිලධාරී/ සෙසුනිලයින්ගේ නිර්මාණ හැකියාවන් වර්ධනය කිරීම සහ එළිදැක්වීම සඳහාත්, පුරා වසරක් තුල බලකාය තුල සිදුවන සුවිශේෂී අවස්ථා සෑම සාමාජිකයෙකුටම දැනගැනීම සඳහාත් බලකායට අලුතින් එක්වන සාමාජිකයින් හට බලකාය පිළිබඳ පුළුල් දැනුමක් ලබාදීම සඳහාද මෙම සඟරාව මහත් පිටුවහලක් වේ.

ශ්‍රී ලංකා සංඥා බලකායෙහි සියළු සාමාජිකයින් විනයගරුකව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට තම අමිල වූ සේවාව ඇපකැපවී ලබාදීමට සිතෙහි ධාරණය කරගනු ඇතැයි මා විශ්වාස කරමි. තවද, "ද සිග්නලර්" සඟරාව එළිදැක්වීමට කටයුතු කල සංස්කරණ මණ්ඩලයට මාගේ කෘතවේදී ස්තුතිය පිරිනමන අතර අවසාන වශයෙන් ශ්‍රී ලංකා සංඥා බලකායෙහි සියළු නිලයින්ටත් ඔවුන්ගේ පවුල්වල සැමටත් සිවිල් සේවක මහතුන් සහ ඔවුන්ගේ පවුල්වල සැමටත් සෞභාග්‍ය පිරි අනාගතයක් උදෙසා සුභාසිංශනය පුද කරමි.

**එන් එම් හෙට්ටිආරච්චි වීඑස්වී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී**
**මේජර් ජෙනරාල්**
**ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බලකාධිපති**



ශ්‍රී ලංකා සංඥා බලකායේ නව සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් එන් එම් හෙට්ටිආරච්චි ඩබ්ලිව්එස්වී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී උදෙසා 2019.05.02 වන දින පිරිනමන ලද සම්මාන පෙළපාලිය



මේජර් ජෙනරාල් එන් එම් හෙට්ටිආරච්චි ඩබ්ලිව්එස්වී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ශ්‍රී ලංකා සංඥා බලකායේ සංඥා බලකාධිපති ලෙස 2019.05.02 වන දින වැඩ භාරගත් අවස්ථාව

# අභිමානවත් 75 වසරක



සංඥා බලකාය ආරම්භයේදී 1940 දශකය මුල් භාගයේදී ලබා ගත් සමූහ ඡායාරූපයක්



සංඥා බලකාය 1950 දශකය මුල් භාගයේදී ලුතිනන් කර්නල් සීආර් ද සිල්වා ඊඩී අණදීම යටතේ

# සංඥා බලකා ඉතිහාසය



1947 වසරේදී ලංකා සංඥා බලකා ස්වේච්ඡා ඒකකය නැවත ප්‍රතිස්ථාපනය කිරීමෙන් පසු මේජර් වීසී කෙලාට් සහ නිලධාරීන් පෙනී සිටි ඡායාරූපයක්



ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් සෝල්බරි සාමි වෙත පිරිනමන ලද සම්මාන පෙළපාලියෙහි සංඥා කණ්ඩය කපිතන් ඩීවී බ්‍රොහියර්ගේ අණදීම යටතේ

# වසර 75 සපිරි ශ්‍රී ලංකා සංඥා බලකායේ ප්‍රෞඪ වූ අභිමානනීය ඉතිහාසයෙන් බිදක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි යුධ ආධාරක රෙජිමේන්තුවක් ලෙස ස්ථාපිත ශ්‍රී ලංකා සංඥා බලකාය අතීත සහ වර්තමාන සියළු නිලයන්ගේ කැපවීමෙන් සේවය කිරීම තුලින් පසුගිය දශක හත තුල සමස්ථ යුද්ධ හමුදාවට සහ ලක් මවට අභිමානවත් ගෞරවණීය සහ විශිෂ්ඨ සේවාවක් ලබා දී ඇත. ශ්‍රී ලංකා සංඥා බලකාය 2018 ඔක්තෝබර් 19 වන දිනට අභිමානවත් 75 වන සංවත්සරය උත්සවාකාරයෙන් සමරන ලදි. සංඥා බලකායේ ඉතිහාසය ආරම්භය 1920 දශකය දක්වා අතීත උරුමයකට හිමිකම් ඇති අතර, මුලාරම්භයේ ඉංජිනේරු රෙජිමේන්තුවට අනුයුක්ත සංඥා සම්බන්ධතා බළඝණයක් ලෙස ස්ථාපිතව ඇත. 1930 දශකය ආරම්භයේ දී පමණ සංඥා බලකාය ශ්‍රී ලංකාවේ ඉංජිනේරු බලකායේ අංක 3 බළඝණය ලෙස පැවති අතර, එය නිලධාරීන් දෙදෙනකුගෙන් සහ සෙසුනිලයින් 25 කගෙන් සමන්විත විය. එම බළඝණයේ නිලධාරී අණදෙන ලෙස කපිතන් ඒටී කිංස්ටන් ද බණ්ඩාගාර නිලධාරී ලෙස ලුතිනන් ජේඑච් පයිෆර් කටයුතු කරන ලදි. දෙවන ලෝක සංග්‍රාමය ආරම්භයත් සමග එවකට නිලධාරී අණදෙන මේජර් පීඑච් ටොඩ්ගේ අණදීම යටතේ බළඝණය සංඥා සම්බන්ධතා ස්ථාපිත කිරීමේ අවශ්‍යතා උදෙසා සක්‍රීය සේවයට කැදවීමෙන් අනතුරුව ත්‍රීකුණාමලයේ ස්ථානගත කරන ලදි.

1941 දී සංඥා සම්බන්ධතා අතිරේක සංඥා බළඝණයක් ලෙස අංක 4 බළඝණයද ස්ථාපනය කරන ලද අතර, එහි ප්‍රථම අණදෙන නිලධාරී ලුතිනන් එච්ඩබ් වුඩ් කටයුතු කරන ලදී. වර්ෂ 1941 දී සැරයන් සීආර් ද සිල්වා, සංඥා බළඝණයේ ස්වදේශික නිලධාරියකු ලෙස අධිකාරියට පත්කරන ලදි. වර්ෂ 1942 මුල් භාගයේදී කොළඹ රාජකීය විද්‍යාලයෙහි, රාජකීය සංඥා රෙජිමේන්තු ඒකක මූලස්ථානයක් පිහිටුවා ඇති අතර, ශ්‍රී ලංකා ඉංජිනේරු ඒකකයට අනුයුක්තව පැවති 3 වන සංඥා සහ 4 වන සංඥා බළඝණ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් වොලර්ගේ යටතේ අණ සහ පාලනය සඳහා අනුයුක්ත කරන ලදි. දෙවන ලෝක යුද සමයෙහි සංඥා සම්බන්ධතා අවශ්‍යතාවන් උදෙසා ප්‍රධාන සංඥා නිලධාරී මුලස්ථානයක් කොළඹ කලාභවනේ ස්ථාපිත කර ඇති අතර, එහි ප්‍රධාන සංඥා නිලධාරී ලෙස කර්නල් ෆ්‍රෑන්ක් විල්සන් නිලධාරී විසින් කටයුතු කර ඇත.

සංඥා සන්නිවේදන අවශ්‍යතාවයන් පුළුල් වීමත් සමග ස්වාධීන සංඥා රෙජිමේන්තුවක් ස්ථාපනය කිරීමෙන් කාලීන අවශ්‍යතාවය සපුරාලමින් 1943 ඔක්තෝබර් 19 වන දින අංක 9183 සහ 9184 යන ගැසට් නිවේදන මගින් ශ්‍රී ලංකා සංඥා බලකායෙහි මූලාරම්භය සහ ස්ථාපනය සනිටුහන් විය. එය යුද්ධ හමුදා රෙජිමේන්තු ජ්‍යෙෂ්ඨතාවයෙහි ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායට පසුව පිහිටුවන ලදී. පළමු අණදෙන නිලධාරී ලෙස එවකට පැවති සිලෝන් ප්ලාන්ටර්ස් රයිෆල් බලකාය වෙතින් සංඥා බලකායෙහි රාජකාරීන් සඳහා අනුයුක්ත කරන ලද බ්‍රිතාන්‍ය නිලධාරියෙකු වූ ලුතිනන් කර්නල් ඒඩබ් සැමුවෙල් පත්කරන ලදි.

## 1943 වසරේ අභිනවයෙන් ස්ථාපිත සංඥා බලකායේ ප්‍රධාන තනතුරු හෙබවූ නිලයින්



ලුතිනන් කර්නල්
ඒඩබ් සැමුවෙල්
අණදෙන නිලධාරී



මේජර් සීආර් ද සිල්වා
නිලධාරී අණදෙන
පලවන බළඝණය



මේජර් ඩබ්ඒම් ප්‍රනාන්දු
නිලධාරී අණදෙන
තුන්වන බළඝණය



කපිතන් ඩීවී බ්‍රොහියර්
විධායක අධිකාරි



බනි 1 එච්පී වයිට්
රෙජිමේන්තු සැරයන් මේජර්

දෙවන ලෝක යුද්ධයෙහි තීරණාත්මක කාල පරිච්ඡේදයක් වූ 1944 වර්ෂය වන විට වර්ධනය වූ සංඥා සම්බන්ධතා අවශ්‍යතාවයන් උදෙසා අතිරේක බළඝණයන් දෙකක් එනම් 2 වන බළඝණය මේජර් වීසී ක්ලාට් යටතේද, 4 වන බළඝණය බ්‍රිතාන්‍ය නිලධාරියෙකු වූ මේජර් එච්ඩබ්පී කූපර් යටතේ ද ස්ථාපනය විය. 2 වන බළඝණය මහනුවර, කුරුණෑගල, කැකිරාව සහ වව්නියාව ආවරණය වන පරිදි සංඥා සම්බන්ධතා රාජකාරී සදහා ස්ථානගත වූ අතර, 4 වන බළඝණය ත්‍රීකුණාමලයේ ස්ථානගත වන ලදී. සංඥා බළඝණයේ අණදෙන නිලධාරී වශයෙන් බ්‍රිතාන්‍ය නිලධාරියෙකු වූ ලුතිනන් කර්නල් මැකෙන්සි වර්ෂ 1944 දී පත් විය. 1946 ජුනි මස මේජර් සීආර් ද සිල්වා ප්‍රථම ස්වදේශ කාර්‍ය නියුතු නිලධාරී ලෙස පත් වූ අතර දෙවන ලෝක යුද්ධය නිමා වීමෙන් පසුව රාජකාරී අවශ්‍යතාවයන් ද නිමා කරමින් බලකා මූලස්ථානය විසුරුවා හරින ලදී. 1947 වර්ෂයේ දී ලංකා ආරක්ෂක බලකාය ප්‍රතිස්ථාපනය සහ පශ්චාත් යුද සමයෙහි අභ්‍යන්තර ආරක්ෂක අවශ්‍යතාවන් උදෙසා සංඥා සම්බන්ධතාවය සැපයීම වස් මේජර් වීසී ක්ලාට්ගේ අණදීම යටතේ සංඥා ඒකකය නැවත සේවයට කැදවා ප්‍රතිස්ථාපනය කරන ලදී.



මේජර් වීසී ක්ලාට් ඕබීඊ ඊඩී
අණදෙන නිලධාරී
සංඥා බලකාය (ස්වේච්ඡා)
1946.10.01 - 1950.08.14

අභිනවයෙන් ආරම්භ කල ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සංඥා සම්බන්ධතාවයන් උදෙසා නිත්‍ය සංඥා ඛණ්ඩයක් ස්ථාපනය කරන ලද අතර, එම ඛණ්ඩයෙහි ප්‍රථම නිලධාරී අණදෙන වශයෙන් ලුතිනන් එන්ටී ජොබ්ස් පත් කරන ලදී. කපිතන් ඩීවී බ්‍රොහියර් ස්වෙච්ඡා සංඥා බලකායෙහි විධායක අධිකාරී ලෙස රාජකාරී කරන ලදී. 1951 පෙබරවාරි 12 වන දින ප්‍රකාශයට පත් කරන ලද හමුදා චර්යා නියෝග 11/51 ප්‍රකාරව 1 වන බළඝණයේ ඒ ඛණ්ඩය ස්ථාපනය වීමත්, 1951 සැප්තැම්බර් 30 දින සිට 2 (සෙව්) බළඝණය ක්‍රියාත්මක කිරීමට අනුමත කිරීමත් සිදුවිය.

එම වර්ෂයේදීම රාජකීය සංඥා බලකායට ආවේනික නිල ලාංඡන, සිරස්ක ලාංඡනය සහ ඇඳුම් ආයිත්තම් පැලඳීම සඳහා අනුමැතිය ලද අතර, රාජකීය සංඥා බලකා ධජයෙහි වර්ණ හා සංඥා වාදන තේමාව වශයෙන් රාජකීය බලකා තේමා වාදනය වන "Begone Dull Care" තේමා වාදනය භාවිතා කිරීමටද අනුමැතිය ලබා දෙන ලදී.



කපිතන් එන්ටී ජොබ්ස්
නිත්‍ය සංඥා බලකාය
පළමු ඛණ්ඩය
නිලධාරී අණදෙන

වර්ෂ 1952 ජනවාරි මස පුළුල් වන සන්නිවේදන අවශ්‍යතා සපුරාලීම සඳහා නිත්‍ය සංඥා ඛණ්ඩය, බළඝණ මට්ටම දක්වා ව්‍යාප්ත වූ අතර, එය අංක 1 බළඝණය වශයෙන් මූලස්ථාන ඛණ්ඩයක් සහ ෆීල්ඩ් ඇන්ඩ් ෆෝට්රස් ඛණ්ඩය වශයෙන් ඛණ්ඩ දෙකකින් සමන්විත විය. මෙහි ප්‍රථම නිලධාරී අණදෙන ලෙස කපිතන් ඩීවී බ්‍රොහියර් පත් කරන ලදී. 1952 මැයි මස බ්‍රිතාන්‍යයෙහි මූලික පුහුණුව ලැබ අධිකාරියට පත් වූ දෙවන ලුතිනන් එල්ජේඅයි ප්‍රනාන්දු සංඥා බලකාය වෙත ඉඳුරාම පත්වීම් ලද ප්‍රථම තරුණ සංඥා නිලධාරී වශයෙන් බලකායට එක්විය. 1958 ඔක්තෝබර් 14 වන දින 1 වන රෙජිමේන්තුව සංඥා බලකාය ආරම්භ කර 1959 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන ලදී. අංක 1 බළඝණය මෙහෙයුම් බළඝණය, මූලස්ථාන සහ පාලන බළඝණය ඇතුලත් විය. මේජර් ඩීවී බ්‍රොහියර් ලුතිනන් කර්නල් නිලය දක්වා උසස්වීම් ලැබීමෙන් පසු පළමු වන සංඥා රෙජිමේන්තුවේ පළමු අණදෙන නිලධාරී ලෙස පත් කරන ලදී. කපිතන් එල්ජේඅයි ප්‍රනාන්දු අංක 1 බළඝණයේ නිලධාරී අණදෙන වශයෙන් ද, කපිතන් එඑම්එම් ෆරීඩ් රෙජිමේන්තුවේ පළමු විධායක අධිකාරී වශයෙන් ද පත්වීමේ වරප්‍රසාදය හිමිවිය. බනි 1 පීජේ ද සිල්වා ප්‍රථම රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් පත් විය.

## පළමු වන සංඥා රෙජිමේන්තුව ආරම්භයේදී ප්‍රධාන තනතුරු දැරූවන්



ලුතිනන් කර්නල්
ඩීවී බ්‍රොහියර්
අණදෙන නිලධාරී



මේජර්
එම්ජේඑල්ආර් පෙරේරා
දෙවන අණදෙන නිලධාරී



මේජර්
එල්ජේඅයි ප්‍රනාන්දු
නිලධාරී අණදෙන
පලවන බළඝණය



කපිතන්
එඑම්එම් ෆාරීඩ්
විධායක අධිකාරී



බනි 1 පීජේ ද සිල්වා
රෙජිමේන්තු සැරයන් මේජර්

1962 වර්ෂයේදී 2 (සෙව්) සංඥා රෙජිමේන්තුව ලුතිනන් කර්නල් බීආර් ජේසුදාසන් යටතේ පැවති සමයෙහිදී විසුරුවා හරින ලද අතර, එය නවතමයෙන් ස්ථාපනය කරන ලද ජාතික ආරක්ෂක බලකායෙහි රෙජිමේන්තුවක් ලෙස පරිවර්තනය කරන ලදී. 1964 දී යුද්ධ හමුදාවේ සියළුම විද්‍යුත් හා විදුලි සංදේශ උපකරණ අළුත්වැඩියා කිරීමේ භාරදූර කාර්යය සංඥා රෙජිමේන්තුවට පැවරෙන ලදී. එම වසරේදීම සංඥා සෙබලුන්ගේ වෘත්තිය නිපුනත්වය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීමට මේජර් ෆරීඩ්ගේ උපදේශකත්වයෙන් සංඥා රෙජිමේන්තු පුහුණු අංශය පිහිටුවන ලදී. සංඥා බලකායට තවත් විශේෂිත අංගයක් එක් කරමින් කපිතන්(උපා) එඅයි මාටිල් යටතේ ස්ටන්ට් රයිඩින් (Stunt Riding) කණ්ඩායමක් පිහිටුවන ලදී. 1968 ඔක්තෝබර් 19 වන දින ලංකා සංඥා බලකාය 25 වන සංවත්සරය උත්සවාකාරයෙන් සැමරූ අතර, ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සංඥා විශ්‍රාමිකයන්ගේ සංගමයේ සභාපති කර්නල් ඩබ්ඊඑම් ප්‍රනාන්දු සහභාගී විය.

1972 වර්ෂයේදී 1 වන සංඥා රෙජිමේන්තුවේ සංස්ථාව සන්නිවේදන බළඝණ 2 ක් සමග ප්‍රතිව්‍යුහගත කරන ලදී. ඒ අනුව අංක 1 සහ අංක 2 සංඥා බළඝණයන්, මූලස්ථාන බළඝණය සහ පුහුණු බළඝණය ඇතුලත්ව පලවන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය ලෙස නම් කරන ලද අතර, නව සිරස්ක ලාංඡනය ද හඳුන්වා දෙන ලදී. 1972 දී පළමු වරට සංඥා රෙජිමේන්තුව වෙත මැදිරිගිරියේ අනුඛණ්ඩයක් පවත්වාගෙන යාමේ වගකීම පැවරුණු අතර, පසුව නව අනුඛණ්ඩයක් කලාඔය ප්‍රදේශයෙහි ස්ථාපිත වූ අතර, එහි සංඥා සෙබලුන් පුහුණු කිරීමේ කටයුතුද සිදුකරන ලදී. 1978 වර්ෂයේදී ඒකක මූලස්ථාන ගොඩනැගිල්ල පනාගොඩ සංඥා කඳවුරු පරිශ්‍රයේදී ඉදිකර විවෘත කරන ලදී.

1980 අප්‍රේල් 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි 21/80 හමුදා චර්‍යා නියෝග ප්‍රකාරව 2 වන සංඥා බළඝණය ස්ථාපනය කරන ලදි. 1983 දී පලමු වන ශ්‍රීලංසංබ හි අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් සීජේ අබේරත්නගේ පූර්ණ මග පෙන්වීම යටතේ 5 බළඝණය සංග්‍රාමික සන්නිවේදන බළඝණය ලෙස පිහිටුවන ලදි. 1987 වර්ෂයෙන් පසු ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සංවිධානයේ ව්‍යාප්ත වීමට සමගාමීව 1 වන සහ 2 වන සේනාංකයන්හී සංඥා සම්බන්ධතාවයන් සඳහා සේනාංක සංඥා රෙජිමේන්තු අනුපිළිවෙලින් 1 වන සංඥා රෙජිමේන්තුව සහ 3 වන සංඥා රෙජිමේන්තුව පනාගොඩ සහ අනුරාධපුර ස්ථාපනය විය. ඒ යටතේ බලසේනා, සංඥා සම්බන්ධතා බළඝණය ස්ථාපනය කරන ලදි. තවද සංඥා පුහුණු පාසල, සංඥා වැඩපල බළඝණයක් සහ යුද්ධ හමුදා මූලස්ථාන ස්වාධීන සංඥා බළඝණය ලෙස රෙජිමේන්තු සංස්ථාව ව්‍යාප්ත වන ලදි. එම වර්ෂයේම කපිතාන් ඒටී බානගොඩගේ අණදීම යටතේ මායිම් ගම්මානයන්හී ආරක්ෂාව සඳහා අනුබණ්ඩයන් ස්ථාපනය කල අතර, පිළිවෙලින් ලුතිනන් ඕ ඒකනායක සහ ලුතිනන් බීඑච්එම්ජේ විජේසිංහගේ අණදීම යටතේ තන්තිරිමලේ සහ දියතිත්තවැව යන ස්ථානවල කඳවුරු පිහිටුවා ස්ථානගත කරන ලදි.

අංක 28/88 හමුදා චර්‍යා නියෝග මගින් 1988 අප්‍රේල් මස 04 වන දින ප්‍රකාශයට පත්ව 1988 ජූනි මස 11 වන දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රධාන සංඥා නිලධාරී අධ්‍යක්ෂක මණ්ඩලය/ සංඥා බලසේනාව පිහිටුවන ලදි. ප්‍රථම සංඥා බලසේනාධිපති වශයෙන් බ්‍රිගේඩියර් සීජේ අබේරත්න පත් විය. 1988 ජනවාරි 30 වන දින ත්‍රිකුණාමලය තිරියාය හී දී ත්‍රස්ථවාදී ප්‍රහාරයක් හේතුවෙන් 2 (සේවි) ශ්‍රීලංසංබහි ලාන්ස් කෝප්‍රල් රංජිත් විජේසිංහ මියගිය අතර, ඔහු ක්‍රියාන්විත හේතුන් මත ජීවිතක්ෂයට පත්වූ පළමු සංඥා සෙබලා විය. 16/89 හමුදා චර්‍යා නියෝග හා 1989 ජූනි මස 13 දින රජයේ ගැසට් අංක 562/5 ට අනුකූලව 3 වන සංඥා රෙජිමේන්තුව 1989 මාර්තු 09 වන දින අනුරාධපුරයේ රණසේවාපුරදී ලුතිනන් කර්නල් ඒඊටී පෙරේරා අණදීම යටතේ යුධ හමුදාවේ 2 වන සේනාංකයට අනුබද්ධ සංඥා රෙජිමේන්තුව ලෙස පිහිටුවන ලදි. එම වර්ෂයේම 7/89 හමුදා චර්‍යා නියෝග ප්‍රකාරව 2 (සේවි) ශ්‍රීලංසංබ බළඝණය 1 වන රෙජිමේන්තුවට අනුබද්ධව පවත්වාගෙන යාම සඳහා අනුමැතිය ලබා දෙන ලදි.



බ්‍රිගේඩියර් සීජේ අබේරත්න
ප්‍රථම රෙජිමේන්තු ආඥාපති සහ
ප්‍රථම සංඥා බලසේනාධිපති



කර්නල් කේඒ ඥානවීර
සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ
ප්‍රථම රෙජිමේන්තු මධ්‍යස්ථාන
සේනාවිධායක



මේජර් ඒටී බානගොඩ
සංඥා රෙජිමේන්තු
මධ්‍යස්ථානයේ ප්‍රථම රෙජිමේන්තු
විධායක අධිකාරී



ඔනි 1 එල්කේ අබේවික්‍රම
සංඥා රෙජිමේන්තු
මධ්‍යස්ථානයේ ප්‍රථම
රෙජිමේන්තු සැරයන් මේජර්

වර්ෂ 1990 ඔක්තෝබර් මස 19 වන දින 05/90 හමුදා චර්‍යා නියෝග ප්‍රකාරව සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය පනාගොඩ හී පිහිටුවන ලද අතර, එහි පළමු රෙජිමේන්තු අධිපති වුයේ බ්‍රිගේඩියර් සීජේ අබේරත්න ජ්‍යෙෂ්ඨ නිලධාරීය. කර්නල් කේඒ ඥානවීර පළමු මධ්‍යස්ථානයේ සේනාවිධායක ලෙස ද, කපිතාන් ඒටී බානගොඩ නිලධාරී පළමු විධායක අධිකාරී ලෙස ද ඔනි 1 එල්කේ අබේවික්‍රම පලමු රෙජිමේන්තු සැරයන් මේජර් ලෙසද පත්වීම් හොබවන ලදි.

1991 ජූනි 05 වන දින 08/91 හමුදා චර්‍යා නියෝග ප්‍රකාරව සහ 1991 ජූනි 13 වන දින රජයේ ගැසට් අංක 665/5 මගින් ප්‍රකාශිත පරිදි 4 වන සංඥා රෙජිමේන්තුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 3 වන සේනාංකයෙහි සංඥා සම්බන්ධතා රෙජිමේන්තුව වශයෙන් ලුතිනන් කර්නල් එච්එම් චිත්‍රාන්ජන්ගේ අණදීම යටතේ ස්ථාපනය කරන ලදි. යුද්ධ හමුදාවෙහි පරිගණක අවශ්‍යතාවයන් සහ තොරතුරු තාක්ෂණ (IT) අවශ්‍යතා සපුරාලීම සඳහා 1991 අගෝස්තු 23 වන දින මේජර් එඑස් වරකාගොඩ අණදීම යටතේ විද්‍යුත් දත්ත සැකසුම් ඒකකය (EDPU) ආරම්භ කරන ලදී. 1991 දෙසැම්බර් 13 වන දින කපිතාන් එන්එම් හෙට්ටිආරච්චි යටතේ විද්‍යුත් සංග්‍රාමික බළඝණය ස්ථාපනය කරන ලදි. 1992 ජනවාරි 22 වන දින 4 වන රෙජිමේන්තුව 3 වන සේනාංකයෙහි නැගෙනහිර ප්‍රදේශයෙහි සංඥා සම්බන්ධතාවය සැපයීම සඳහා මඩකලපුවේ කල්ලඩි ප්‍රදේශයේ ස්ථානගත කරන ලදි. 1991 ජූලි 15 වන දින සංඥා පුහුණු බළඝණය, සංඥා පාසල වශයෙන් වැඩි දියුණු වු අතර එහි ප්‍රධාන අධීක්ෂණ නිලධාරී ලෙස මේජර් ඒඒ පෙරේරා පත් විය. පසුව 1992 ජනවාරි 01 වන දින මහනුවර බුවැලිකඩ හී ආරම්භ කරන ලද සංඥා පාසල, පළමු සේනාවිධායක වුයේ මේජර් ඒඒ පෙරේරාය. 1992 අගෝස්තු 01 වන දින, බ්‍රිගේඩියර් සීජේ අබේරත්න සංඥා බලකායෙහි සේවයේ සිටියදී මේජර් ජෙනරාල් නිලයට නිල උසස් වීම් ලද ප්‍රථම නිලධාරී වශයෙන් උසස් වීම් ලැබීම බලකා ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් විය. සංඥා බලකායේ සංඥා උපකරණ නඩත්තු කිරිම හා අළුත්වැඩියා කිරීම සඳහා වන සංඥා වැඩපොල 1991 අගෝස්තු 01 වන දින සංඥා මූලික වැඩපොල බළඝණය ලෙස නම් කරන ලද අතර කපිතාන් කේආර්පී රොවෙල් 1992 ජනවාරි 01 වන දින නිලධාරී අණදෙන ලෙස පත් කරන ලදි.

1993 ඔක්තෝබර් 19 වන දින ශ්‍රී ලංකා සංඥා බලකාය 50 වන සංවත්සර ස්වර්ණ ජුබිලිය සමරනු ලැබූ අතර ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් 1 වන රෙජිමේන්තුව ශ්‍රීලංසංබ හි ප්‍රථම අණදෙන නිලධාරී වූ විශ්‍රාමික කර්නල් ඩීවී බ්‍රොහියර් ඊඩී සහභාගී විය. 1994 ජනවාරි 02 වන දින 36/93 හමුදා චර්යා නියෝගානුකූලව සංඥා ඉතිහාසයේ 1 වන සංග්‍රාමික ආධාරක බලඇණිය ලෙස 5 ශ්‍රීලංසංබ ස්ථාපනය කරන ලද අතර, එහි ප්‍රථම අණදෙන නිලධාරී ලෙස මේජර් ඊපී ද ඉසෙඩ් අබේසේකර පත්වන ලදී. අංක 100/96 හමුදා චර්යා නියෝග ප්‍රකාරව 1997 ජනවාරි 10 වන දින 6 ශ්‍රීලංසංබ 2 වන සංග්‍රාමික ආධාරක බලඇණියක් ලෙස ස්ථාපනය කල අතර, එම බලඇණියේ ප්‍රථම අණදෙන නිලධාරියා ලෙස මේජර් සී වීරතුංග පත් වන ලදී. 1997 ජනවාරි 20 දින සිට බලපැවැත්වෙන පරිදි රෙජිමේන්තු ආඥාපති තනතුර කර්නල් සේනාවිධායක ලෙස ප්‍රතිශෝධනය වූ අතර ශ්‍රීලංසංබ හී පළමු කර්නල් සේනාවිධායක වුයේ බ්‍රිගේඩියර් එඑම්සීඩබ්බී සෙනෙවිරත්න පීඑස්සී ය. ප්‍ර/මංරා/51 නියෝගය යටතේ 1997 ජනවාරි 28 වන දින මේජර් එච්පී සෙනෙවිරත්නගේ අණදීම යටතේ විද්‍යුත් සංග්‍රාමික බළඝණය (EW) ස්වාධීන බළඝණයක් ලෙස ස්ථාපිත කරන ලදී.



බ්‍රිගේඩියර් එඑම්සීඩබ්බී සෙනෙවිරත්න
ප්‍රථම බලකාධිපති

සන්නිවේදන උපකරණ අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම සදහා කාර්‍යක්‍ෂම සේවාවක් සැපයීම උදෙසා 28/2001 හමුදා චර්යා නියෝග ප්‍රකාරව 2000 අගෝස්තු 13 වන දින සංඥා මූලික වැඩපොල බළඝණය සංඥා මූලික වැඩපොල ලෙස ප්‍රතිස්ථාපනය කරන ලද අතර මේජර් ජේඑන් වික්‍රමාරච්චි 2001 නොවැම්බර් 05 වන දින එහි ප්‍රථම සේනාවිධායක වශයෙන් පත්විය. /2006 හමුදා චර්‍යා නියෝග ප්‍රකාරව 2005 නොවැම්බර් 30 දින සිට බලපැවැත්වෙන පරිදි විද්‍යුත් දත්ත සැකසුම් ඒකකය (EDPU) තොරතුරු තාක්‍ෂණ ඒකකය (ITU) ලෙස නාමය සංශෝධනය සදහා අනුමත වූ අතර එය 2003 ඔක්තෝබර් 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රකාශයට පත්කරන ලදී.



බ්‍රිගේඩියර්
ටීඑෆ් මීඩින් ආර්එස්පී
ප්‍රථම ප්‍රධාන සංඥා නිලධාරී

2006 වසරේ දී 15/2006 හමුදා චර්යා නියෝග අනුව 2 (සෙව්) ශ්‍රීලංසංබ 2006 අප්‍රේල් 10 දින සිට බලපැවැත්වෙන පරිදි 11 වන සේනාංක බලප්‍රදේශයෙහි සංඥා සම්බන්ධතා කටයුතු සඳහා ඒකකයක් ලෙස 2006 ජූලි 24 වන දින ස්ථාපනය වූ අතර එහි අණදෙන නිලධාරී ලෙස මේජර් ආර්ඩී කරුණාරත්න පත්විය. 2007 මාර්තු 12 වන දින, 44/2007 හමුදා චර්යා නියෝග ප්‍රකාරව, ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය (HQ CSO) ස්ථාපනය වූ අතර එම මූලස්ථානයේ ප්‍රථම ප්‍රධාන සංඥා නිලධාරී ලෙස බ්‍රිගේඩියර් ටීඑෆ් මීඩින් ආර්එස්පී එච්ඩීඑම්සී පත් කරන ලදී.

2006 අප්‍රේල් 24 වන දින හයිටි රාජ්‍යයේ එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුමට ප්‍රථම වරට සංඥා බලකා ආරක්‍ෂක කණ්ඩායම සහභාගී විය. මේජර් ඩීඑල් සරත්චන්ද්‍ර නිලධාරී අණදෙන ලෙසද මේජර් ආර් ඇල්විටිගල, කපිතාන් එම්එස් ඉබ්‍රාහිම් සහ කපිතාන් එල්යුඅයි ලොකුසූරිය බණ්ඩාගාර නිලධාරීන් ලෙසද එම හය් පිරිස් මෙහෙයවන ලදී.

2007 වර්ෂය අවසානය වන විට උතුරු නැගෙනහිර ක්‍රියාත්මක මානුෂිය මෙහෙයුම් සඳහා සමස්ත හමුදා සංවිධානයම ප්‍රතිව්‍යුහගත කරන ලද අතර නව ආධාරක බලඇණිද එයට සමගාමීව ස්ථාපනය විය. ඒ අනුව 2008 පෙබරවාරි 02 වන දින 75/2007 හමුදා චර්යා නියෝග ප්‍රකාරව තෙවන ආධාරක බලඇණිය ලෙස 7 ශ්‍රීලංසංබ ස්ථාපනය කල අතර, එහි අණදීම මේජර් ඩීබීසී ජයසිංහ පීඑස්සී විසින් සිදුකරන ලදී. 2008 මාර්තු 26 දින 11/2008 හමුදා චර්යා නියෝග ප්‍රකාරව සිව්වන ආධාරක බලඇණිය ලෙස 8 ශ්‍රීලංසංබ (ආ/බ) පිහිටවූ අතර, එහි අණදීම මේජර් ඩබ්ඒසීඑන් වරකාගොඩ පීඑස්සී විසින් සිදුකරන ලදී. 2008 අගෝස්තු 01 වන දින 24/2008 හමුදා චර්යා නියෝග ප්‍රකාරව 10 ශ්‍රීලංසංබ පස්වන ආධාරක බලඇණිය ලෙස පිහිටවූ අතර, එහි අණදීම මේජර් වීඑල්කේ ජයරත්න පීඑස්සී විසින් සිදුකරන ලදී.

2007 සහ 2008 වර්ෂයන් හිදී තීරණාත්මක මානුෂිය මෙහෙයුම් සඳහා ප්‍රශස්ත සන්නිවේදන සහයක් ලබාදීමට ආරක්‍ෂක සේනා මූලස්ථානය (මුලතිව්) යටතේ 1 ශ්‍රීලංසංබ, ආරක්‍ෂක සේනා මූලස්ථානය (යාපනය) යටතේ පලාලි හි 3 ශ්‍රීලංසංබ, ආරක්‍ෂක සේනා මූලස්ථානය (වන්නි) යටතේ අනුරාධපුරයේ 4 ශ්‍රීලංසංබ සහ ආරක්‍ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) යටතේ වැලිකන්දෙහි 2 (සෙව්) ශ්‍රීලංසංබ ස්වකීය සංඥා සම්බන්ධතා සැපයීමේ ඒකකයන් ලෙස එම බල ප්‍රදේශයන්හී ස්ථාපනයවී සංඥා කාර්යභාරය ඉටුකරන ලදී. 2008 ජූලි 15 වන දින 23/2008 හමුදා චර්යා නියෝග ප්‍රකාරව 9 වන ශ්‍රී ලංකා සංඥා රෙජිමේන්තුව මේජර් ඩීඑම්පීපී දසනායකගේ අණදීම යටතේ 58 සේනාංකයට සංඥා සම්බන්ධතාවය සැපයීම සඳහා මන්නාරමෙහි පිහිටුවන ලදී. 2008 අගෝස්තු 11 වන දින සංඥා බලසේනා මූලස්ථානය, ප්‍රධාන සංඥා නිලධාරී යටතේ ප්‍රතිස්ථාපනය විය.

අංක 11/2010 හමුදා චර්යා නියෝග ප්‍රකාරව 2010 මාර්තු 01 වන දින ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය යටතේ තොරතුරු තාක්‍ෂණ කාර්යය ක්‍රියාත්මක කිරීම, අධීක්‍ෂණය සහ සුපරීක්‍ෂාව සඳහා සංඥා තොරතුරු තාක්‍ෂණ අධ්‍යක්‍ෂක මණ්ඩලය පිහිටුවන ලදී. එහි ප්‍රථම අධ්‍යක්‍ෂකවරයා ලෙස බ්‍රිගේඩියර් එස්ජේ වික්‍රමසිංහ යූඑස්පී කටයුතු කරන ලදී. අංක 2/2011 සහ 3/2011 හමුදා චර්යා නියෝග ප්‍රකාරව 2010 සැප්තැම්බර් 21 දින සිට බලපැවැත්වෙන පරිදි තොරතුරු තාක්‍ෂණ ඒකකය (ITU) 11 ශ්‍රීලංසංබ ලෙස නම් කිරීම සඳහා අනුමැතිය ලද අතර ලුතිනන් කර්නල් පීඑන්යූ ජයරත්නගේ අණදීම

යටතේ 2010 සැප්තැම්බර් 24 දින සිට ක්‍රියාත්මක විය. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අණ, පාලනය සහ පරිපාලනයට අවශ්‍ය තොරතුරු තාක්‍ෂණ සහාය ලබා දීම, යුද්ධ හමුදාවට අවශ්‍ය මෘදුකාංග විසඳුම් සංවර්ධනය කිරීම සඳහා මෘදුකාංග සංවර්ධනය හා ඉංජිනේරු අංශය තොරතුරු තාක්‍ෂණ අධ්‍යක්‍ෂ මණ්ඩලය යටතේ ස්ථාපනය කරන ලදී. 2011 වසරේදී ඉදුරාම කාන්තා සෙබලියන් බලකායට බඳවා ගැනීමට අනුමැතිය ලබා දුන් අතර, ප්‍රථම කාන්තා තරුණ නිලධාරිණිය ලෙස 2011 ජනවාරි 06 වන දින දෙවන ලුතිනන් එස්එල් මීගොඩ කොතලාවල ආරක්‍ෂක විද්‍යාපීඨය වෙතින් පුහුණුව හදාරා සංඥා බලකාය වෙත එක්වන ලදී.

අංක 24/2012 සහ 34/2012 හමුදා චර්යා නියෝගානුකූලව අනුපිළිවෙලින් 2012 මාර්තු 25 දින සහ 2012 පෙබරවාරි 25 දින සිට බලපැවැත්වෙන පරිදි 8 ශ්‍රීලංසංබ (ආ/බ) සහ 10 ශ්‍රීලංසංබ (ආ/බ) විසුරුවා හැරීම සඳහා ප්‍රකාශයට පත්කරන ලදී. ඒ අනුව 2012 පෙබරවාරි 29 වන දින සිට 10 ශ්‍රීලංසංබ විසුරුවා හරිනු ලැබූ අතර 5 ශ්‍රීලංසංබ සමග ඒකාබද්ධ කොට ලුතිනන් කර්නල් අයිඑච්එම්ආර්කේ හේරත් පීඑස්සී නිලධාරීගේ අණදීම යටතේ මුලතිව් දිස්ත්‍රික්කයේ සුගන්දිපුරම් හි ස්ථාපනය කරන ලදී. 2012 මාර්තු 31 වන දින 8 ශ්‍රීලංසංබ විසුරුවා හරිනු ලැබූ අතර 7 ශ්‍රීලංසංබ සමග ඒකාබද්ධ කොට ලුතිනන් කර්නල් කේඑඩබ්එස් රත්නායකගේ අණදීම යටතේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ මුලන්කාවිල් හි ස්ථාපනය කරන ලදී. අංක 12/2013 හමුදා චර්යා නියෝග ප්‍රකාරව 7 ශ්‍රීලංසංබ (ආ/බ) 7 ශ්‍රීලංසංබ ලෙස නම් කර ලුතිනන් කර්නල් ආර්එම්පීඑස්බී රත්නායකගේ අණ යටතේ සංඥා රාජකාරී ඒකකයක් බවට පත්කර අරක්‍ෂක සේනා මුලස්ථානය (මධ්‍යම) යටතේ දියතලාවෙහි ස්ථානගත විය. අංක 13/2014 හමුදා චර්යා නියෝග ප්‍රකාරව 5 ශ්‍රීලංසංබ (ආ/බ), 5 ශ්‍රීලංසංබ ලෙස නම් කර 2014 සැප්තැම්බර් 24 වන දින ලුතිනන් කර්නල් බීඅයි අස්සලාරච්චි යූඑස්පී පීඑස්සී අණදීම යටතේ අරක්‍ෂක සේනා මුලස්ථානය (බටහිර) හී සංඥා සම්බන්ධතා සැපයීම සඳහා පනාගොඩ ස්ථාපනය කරන ලදී. 26/2014 හමුදා චර්යා නියෝග ප්‍රකාරව 6 ශ්‍රීලංසංබ (ආ/බ), 6 ශ්‍රීලංසංබ ලෙස නම් කර 2014 ජුනි 06 වන දින සිට තොරතුරු තාක්‍ෂණ (IT) රෙජිමේන්තුවක් බවට පරිවර්තනය කරන ලදි.

අංක 15/2015 සහ 16/2015 හමුදා චර්යා නියෝග ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සියළුම සන්නිවේදන උපකරණ අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම සඳහා පිහිටුවා තිබූ සංඥා මූලික වැඩපොල, 10 ශ්‍රීලංසංබ ලෙස නම් කරන ලද අතර, එහි ප්‍රථම අණදෙන නිලධාරී ලෙස 2015 අප්‍රේල් 24 වන දින ලුතිනන් කර්නල් කේඑම්පී බණ්ඩාරනායක පත්වන ලදී. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අණ, පාලනය සහ පරිපාලනය සඳහා සයිබර් ආරක්‍ෂණ සහය සහ අදාල උපදෙස් ලබා දීම සඳහා 2015 ජුලි 10 දින සිට බලපැවැත්වෙන පරිදි 12 ශ්‍රීලංසංබ (සයිබර් ආරක්‍ෂණ) ඒකකය 24/2015 හමුදා චර්යා නියෝග ප්‍රකාරව කර්නල් එස්පීපී පක්‍ෂවීරගේ අණදීම යටතේ පනාගොඩ දී පිහිටුවන ලදී. 2016 ජුනි මස 04 වන දින පනාගොඩ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේදී සංඥා බලකා ගීතය නිල වශයෙන් සහ උත්සවාකාරයෙන් එළි දැක්වූ අතර, එය තවත් වැදගත් සන්ධිස්ථානයක් විය. සංඥා බලකාය ස්වකීය 75 වන සංවත්සරය උත්සවාකාරයෙන් 2018 ඔක්තෝබර් මස 19 වන දින සැමරූ අතර එහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් බීඑච්එම්ඒ විජේසිංහ වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සීගේ ආරාධනයෙන් යුද්ධ හමුදාපති ලුතිනන් ජෙනරාල් එන්යූඑම්එම්ඩබ් සේනානායක ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී යූඑස්ඒසීපීඑස්සී සහභාගී විය.

සංඥා බලකාය ආරම්භයේ සිට 75 වන සංවත්සරය දක්වා දීර්ඝ ඉතිහාසයක් සනිටුහන් කර ඇති අතර සමස්ථ යුද්ධ හමුදාවේ අවශ්‍යතාවය සඳහා සංඥා සම්බන්ධතාවය සැපයීමෙහි සුවිශේෂී රාජකාරිමය දායකත්වය උපරිම අයුරින් ලබා දී ඇති අතර එම සංඥා සම්බන්ධතා කටයුතු සඳහා ද පාලනමය කටයුතු සඳහා ද රෙජිමේන්තු මධ්‍යස්ථානය, ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය, සංඥා බලසේනා මූලස්ථානය, තොරතුරු තාක්‍ෂණ අධ්‍යක්‍ෂ මණ්ඩලය, සංඥා රෙජිමේන්තු 11 ක් සහ සංඥා පාසල ස්ථාපනය කර ඇති අතර ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අභිමානවත් හා කීර්තිමත් රෙජිමේන්තුවක් ලෙස නව තාක්‍ෂණයෙන් පිරිපුන්ව සාර්ථක ඉදිරි ගමන් මගකට මංපෙත් සලසා ඇත.




1950 දශකයේ මුල් භාගයේදී "එචලන් චතුරස්‍ර" හමුදා කඳවුරෙහි අංක 01 බැරැක්කයෙහි ලංකා සංඥා බලකාය ස්ථානගතව ඇත. පසුව 1954 දී ලංකා සංඥා බලකාය අංක 03 බැරැක්කය වෙත මාරු කරන ලදී.



ලංකා සංඥා බලකා භට පිරිස් 1949 දී දියතලාව යුද්ධ හමුදා කඳවුරේදී



70 දශකයේදී නිදහස් දින පෙළපාලියට සහභාගී වූ ශ්‍රී ලංකා සංඥා බලකා කණ්ඩායම



සංඥා කාර්මික සෙසුනිලයන් සංඥා උපකරණ ප්‍රදර්ශනයකට සහභාගී වූ අවස්ථාවක්

# අතීතයෙන් බිදක්



1940 දශකයේදී සංඥා බලකා නිලධාරීන්



C – 11 HF ගුවන් විදුලි යන්ත්‍රයක ක්‍රියාකාරීත්වය පරීක්ෂා කරන සංඥා සෙබල පෙරේරා ඩබ්ලිව් සහ සංඥා සෙබල සෙන්ගන් 1966 වසරේදී



යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ජේඩී පෙරේරා වීඑස්වී 1 වන ශ්‍රී ලංකා සංඥා රෙජිමේන්තුව පනාගොඩ කදවුරෙහි නිරීක්ෂණ සංචාරයක යෙදුනු අවස්ථාව



සංඥා බලකාය 1960 දශකයෙහි ස්ටන්ට් රයිඩින් සංදර්ශනයක අවස්ථාවක්



අතිගරු ජනාධිපති ජේආර් ජයවර්ධන මැතිතුමා විසින් ශ්‍රී ලංකා සංඥා බලකායෙහි මාණ්ඩලික සැරයන් චන්ද්‍රපාල වෙත පදක්කම පිරිනැමීම



1976 වර්ෂයේ නොබැඳි ජාතීන්ගේ සමුළුව සඳහා සපැමිණි ලිබියානු ජනාධිපති කර්නල් මුවම්මර් ගඩාෆි උදෙසා පුද්ගලික ආරක්ෂක රාජකාරී සිදුකල කෝප්‍රල් බුලත්සිංහල වෙත සේවය ඇගයීමේ සහතිකපතක් ලබා දෙන අවස්ථාව

**සැකසුම බ්‍රිගේඩියර් එල්එස්පී පෙරේරා යූඑස්පී විසිනි**

# ප්‍රවීන සොල්දාදුවන් සදා අමරණීයයි







ශ්‍රී ලංකා සංඥා බලකායේ සේවයේ නියුතුව සිට විශ්‍රාම ලබා ඇති වැඩිමහල්ම සාමාජිකයා වනුයේ එච්පීඑස් ජයසේකර (වයස අවු 99) ය. ඔහු සංඥා බලකාය වෙත ස්වේච්ඡා සෙබලෙකු වශයෙන් 1940 දශකයේදී බැදුනු අතර දෙවන ලෝක යුද සමයේ අංක 4 කණ්ඩායමෙහි සේවය කර ඇත. එම කණ්ඩායමේ අනුඛණ්ඩයක් 1944 වර්ෂයේ කුරුණෑගල ස්ථාපිතව තිබියදී ගන්නා ලද මෙම ඡායාරූපයෙහි දකුණු පස ඉදිරියේ වාඩිවී සිටි. සංඥා රෙජිමේන්තුවේ මෙම ජ්‍යෙෂ්ඨ සාමාජිකයා සේවා මුක්ත භට සංගමයේද ක්‍රියාකාරී සාමාජිකයෙක් වශයෙන් කටයුතු කර ඇත







ලුතිනන් කේටීපීටී සිල්වා (වයස අවු 96) වසර 1951 දී ශ්‍රී ලංකා සංඥා බලකායට සංඥා සෙබලෙකු වශයෙන් එක්වන ලදී. 1953 ජුනි මස 02 දින දෙවන එළිසබෙත් රැජිනගේ මෞලි මංගල්‍යයට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නියෝජනය කරමින් උත්තමාචාර පෙළපාලියට සහභාගීවීමට ඔහුට අවස්ථාව ලැබුණි. ඔහු සංඥා සංගමයේ ක්‍රියාකාරී සාමාජිකයකු මෙන්ම එහි උප සභාපති ලෙස සහ භාණ්ඩාගාරික ලෙස පත්වීම් දරා ඇත

ඩීජී රොඩ්‍රිගෝ කාලතුවක්කු හමුදාවේ ක්‍රියාකාරී සමාජිකයෙක්ව සිට පසුව සංඥා බලකායෙහි සේවයේ යෙදී සිටි අතර ඔහු දෙවන ලෝක යුද සමයෙහි (1942 - 1946) සංඥා බලකාය වෙත අනුයුක්තව රාජකාරී කරන ලද යුද්ධ හමුදා සාමාජිකයකු වන අතර දැනට 98 වන වියෙහි පසුවේ



# අභිමානවත් 75 වන සංවත්සරය සැමරීම

## ශ්‍රී ලංකා සංඥා බලකාය සිය අභිමානවත් 75 වන සංවත්සරය සමරන ලද වගයි

ශ්‍රී ලංකා සංඥා බලකායේ සිය අභිමානවත් 75 වන සංවත්සරය 2018 ඔක්තෝබර් මස 19 වන දිනට යෙදී තිබූ අතර සංවත්සරයට සමගාමීව හමුදා සම්ප්‍රදාණුකූලව උත්සව මාලාවක් බලකාය විසින් සංවිධානය කර තිබුණි. සංවත්සර උත්සවයේ පළමු වැඩසටහන ආරම්භ කරමින්, 2018 ඔක්තෝබර් 13 වන දින පනාගොඩ සංඥා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ පිහිටි රණවිරු ස්මාරකය අභියස දී රට වෙනුවෙන් දිවි පිදු වීරෝදාර රණවිරුවන් සිහිපත් කරමින් රණවිරු අනුස්මරණ උත්සවයක් විරෝදාර රණවිරු පවුල් රැසකගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි.

මෙම සැමරුම් උත්සවය සඳහා සංඥා බලකාධිපති වූ මේජර් ජෙනරාල් බීඑච්එම්ජේ විජේසිංහ වීඑස්වී යූඑස්පී එන්ඩීයු පීඑස්සී, ප්‍රධාන සංඥා නිලධාරී මේජර් ජෙනරාල් එන්එම් හෙට්ටිආරච්චි වීඑස්වී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ඇතුලු සංඥා බලකායේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදි.

2018 ඔක්තෝබර් මස 13 වන දින අපර භාගයෙහි සංඥා බලකා රණවිරු ස්මාරකය අභියස පැවති වීරෝධාර රණවිරුවන් අනුස්මරණ උත්සවයෙන් ආරම්භ වූ සාංවත්සරික උත්සව මාලාවෙහි ප්‍රථම වැඩසටහන එදිනම පැවැත්වූ සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනාව සහ පසුදින මහා සංඝරත්නය උදෙසා හීල් දානය සහ මහා සංඝරත්නය 25 නමක් විෂයෙහිලා දහවල් දානයද සමගින් ආරම්භ විය.

සංඥා බලකා සංවත්සර දිනය වන 2018 ඔක්තෝබර් මස 19 වන දින සංඥා බලකාධිපති වෙනුවෙන් භට පිරිස් විසින් සම්ප්‍රදායාණුකූලව කඳවුරු සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක්ද එදින උදෑසන පැවැත්වූ අතර, එදින උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සපැමිණි යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එන්යූඑම්එම්ඩබ් සේනානායක ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී යූඑස්ඒසීපීඑස්සී උදෙසා සම්මාන මුරයක් සහ සම්මාන පෙළපාලියක් සමගින් උත්කර්ෂවත් වැඩසටහන් සමුදායකින් සමන්විත විය. දහවල් සියළු නිල දිවා භෝජන සංග්‍රහයද එදින සන්ද්‍යාවේ බලකාධිපතිගේ ආරාධනය පරිදි යුද්ධ හමුදාධිපතිගේ ප්‍රධානත්වයෙන් රෙජිමේන්තු සියළුම නිලධාරීන්ගේ රාත්‍රී සාදය කොළඹ හිල්ටන් හෝටලයේ දී අති උත්කර්ශවත් අන්දමින් පවත්වන ලදි.

සංවත්සරයට සමගාමීව සංඥා රෙජිමේන්තු බනි/සැරයන් නිවස්න සාදය රත්මලාන ඊගල් ලේක්සයිඩ් හෝටල් සංකීර්ණයේ 2018 ඔක්තෝබර් මස 21 වන දින පැවැත් වූ අතර, ඒ සදහා ප්‍රධාන අමුත්තා වශයෙන් සංඥා බලකාධිපති තුමන් සහභාගි වන ලදි. සංවත්සර වැඩසටහන් මාලාවේ අවසාන අංගය වශයෙන් රෙජිමේන්තු සියළු නිල සුහද හමුව 2018 දෙසැම්බර් මස 07 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථාන ක්‍රීඩාංගණයේ දී පවත්වන ලදි.
























75th Anniversary 2018

# ශ්‍රී ලංකා සංඥා බලකාය 75 වන සංවත්සරයට යුද්ධ හමුදාධිපතිගේ සපැමිණීම

ශ්‍රී ලංකා සංඥා බලකායට වසර 75ක් සපිරීම නිමිත්තෙන් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 19 දින සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේදී පැවති සාංවත්සරික උත්සවය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එන්යූඑම්එම්ඩබ් සේනානායක ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී යූඑස්ඒසීපීඑස්සී සපැමිණි අතර, සම්ප්‍රදායානුකූල කඳවුරු සම්මාන මුරයද ඉන් අනතුරුව සරඹ භූමිය අසලදී යුධ සේවා ලේකම් මෙන්ම එවකට කටයුතු කරන ලද, සංඥා බලකාධිපති විසින් යුද්ධ හමුදාධිපති උණුසුම් අයුරින් පිළිගැනීම සිදුකරන ලදි. රට වෙනුවෙන් දිවි පිදු සංඥා බලකා රණවිරුවන් සිහිකරමින් පුෂ්පෝපහාර දැක්වීම සඳහා යුද්ධ හමුදාධිපති රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දක්වන ලදි. අනතුරුව යුද්ධ හමුදාධිපති වෙත සම්මාන ආචාර පෙළපාලියක්ද පිරිනමන ලදි.

යුද්ධ හමුදාධිපති විසින් ශ්‍රී ලංකා සංඥා බලකායේ 75 වන සංවත්සර සමරු ඵලකය නිරාවරණය කරමින් නව ඵලකය ඉදිරියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමගින් සමූහ ඡායාරූපයකටද පෙනී සිටින ලදි. ඉන් අනතුරුව යුද්ධ හමුදාධිපති විසින් රෙජිමේන්තු මධ්‍යස්ථානයේ අභිනවයෙන් ඉදි කරන ලද කොමිෂන් නොලත් නිලධාරී සමාජ ශාලාව සහ සෙසුනිල භෝජනාගාරය විවෘත කරන ලදි. එහිදී යුද්ධ හමුදාධිපති විසින් භට පිරිස් අමතමින් ශ්‍රී ලංකා සංඥා බලකාය වසර 75 ක දිගු කාලයක් තුල ලබාදුන් අතිවිශිෂ්ඨ සේවාවන් ඇගයුමට ලක් කරන ලදි. එදින පැවති තවත් සුවිශේෂ අංගයක් වූයේ සංඥා බලකායෙහි 75 වන සංවත්සරය සනිටුහන් කරමින් සමරු මුද්දරයක් හා මුල්දින කවරයක් නිකුත් කිරීමයි.

යුද්ධ හමුදාධිපති විසින් ශ්‍රී ලංකා සංඥා බලකා 75 වන සංවත්සරය සිහිකරනු වස් රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රවණාගාරය අසල නා පැලයක් රෝපනය කරනු ලැබීය. සංඥා බලකා භඨපිරිස් දිගුකාලීන අවශ්‍යතාවයක්ව පැවති නවතමයෙන් ඉදිකරන ලද තොරතුරු තාක්ෂණ පුහුණු විද්‍යාගාරයද යුද්ධ හමුදාධිපති තුමන් විසින් විවෘත කරන ලදි. එසේම එතුමන් විශේෂ අමුත්තන් සඳහා වු පොතෙහි සටහනක් තබමින් 75 වන සංවත්සරය වෙනුවෙන් සිය සුභාශිංසන එක්කරන ලදි.

අනතුරුව ශ්‍රී ලංකා සංඥා බලකා නිලධාරීන් සහ සෙසුනිලයින් සමගින් සමූහ ඡායාරූපයකට පෙනී සිටි යුද්ධ හමුදාධිපති සියළු නිල තේ පැන් සංග්‍රහයටද සහභාගී විය. මෙම සැමරුම් උත්සවය සඳහා විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ විශේෂ ආරාධිතයන් රැසක් සහභාගී විය.























# ශ්‍රී ලංකා සංඥා බලකායට වසර 75 ක් සපිරීම නිමිත්තෙන් සංවත්සර සැමරුම් මුද්දරයක් සහ සැමරුම් කාසියක් නිකුත් කිරීම

ශ්‍රී ලංකා සංඥා බලකායට වසර 75 ක් සපිරීම නිමිත්තෙන් සංවත්සර සැමරුම් මුද්දරයක් හා මුල්දින කවරයක් නිකුත් කිරීම 2018 ඔක්තෝබර් මස 19 වන දින පනාගොඩ රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේදී සිදු කෙරිණි. මෙය ශ්‍රී ලංකා සංඥා බලකායේ සංවත්සර සැමරුමක් සඳහා ප්‍රථම වරට නිකුත්කල මුද්දරය වන අතර, තැපැල් සේවා සහ මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ආර්එම්ඩීබී මීගස්මුල්ල මහතා සහ තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර කාර්යාංශයේ අධ්‍යක්ෂ ශාන්ත කුමාර මහතා විසින් යුද්ධ හමුදාධිපතිතුමන් වෙත ප්‍රථම මුල්දින කවරය පිරිනමනු ලැබීය.







ශ්‍රී ලංකා සංඥා බලකායෙහි 75 වන සංවත්සරය සඳහා එළිදැක්වූ සමරු සටහන් අතර තවත් සුවිශේෂී අංගයක් වනුයේ සමරු මුද්දරය හා මුල්දින කවරයයි.

මෙම සමරු මුද්දරයෙහි මධ්‍යයෙහි ශ්‍රී ලංකා සංඥා බලකායෙහි 75 වන සාංවත්සරික සමරු ලාංඡනයද දකුණු පසින් සංඥා සම්බන්ධතාවය සංකේතවත් කිරීම සඳහා ගුවන්විදුලි යන්ත්‍ර ක්‍රියාකරුවකුගේ රූපයකින්ද සමන්විත වේ. මුද්දරයෙහි පහත වම් පසින් "ශ්‍රී ලංකා" නාමය ත්‍රෛභාෂාවෙන්ද සටහන්ව ඇති අතර සංඥා බලකාය ආරම්භක වර්ෂය වන 1943 සහ 75 වන සංවත්සර වර්ෂය 2018 දකුණු පසින්ද සටහන්ව ඇත. මුල්දින කවරයෙහි වම්පස ඉහල කෙලවර සංවත්සර සමරු ලාංඡනය සහ ඉහලින් විශේෂ සමරු කවරය යන්න ත්‍රෛභාෂාවෙන් සටහන්ව ඇත.

සංඥා බලකායෙහි ආරම්භක ගැසට් නිවේදනයෙහි ඡායාරූපයක්ද, සංඥා රෙජිමේන්තුවේ ප්‍රධාන ප්‍රවිශ්ඨයේ ද්වාරයෙහි ඡායාරූපයක්ද 1 වන සංඥා රෙජිමේන්තුව පනාගොඩ ස්ථාපිතව තිබූ අවධියේ ප්‍රධාන නාමපුවරුවද, සංඥා බලකායෙහි ශිරස්ක ලාංඡනයෙහි ප්‍රතිමූර්තිය හර්මීස් දෙවිඳුන්ගේ සිතුවමකින්ද විචිත්‍රවත් ලෙස නිර්මාණය කර ඇත. එහි ශ්‍රී ලංකා සංඥා බලකා 75 වන සංවත්සරය යන්න සිංහල, දමිල හා ඉංග්‍රීසි බසින් සටහන් වන අතර 1943 සහ 2018 වර්ෂයන් සඳහන්ව ඇත.

කවරයෙහි ඉහල දකුණු කෙලවර ශ්‍රී ලංකාවෙහි වලංගු රු 25.00 ක මුද්දරයක් සහ 75 වන සංවත්සරය සැමරුම් මුද්දරය ඇතුලත් කර ඇති අතර මෙම මුල්දින කවරය එළිදැක්වීම සඳහා විශේෂිත වු දින මුද්‍රාව යෙදු එය අවලංගු කර ඇත. මෙම සමරු මුද්දරය හා මුල්දින කවර 7000 ක් නිකුත්කිරීම සිදුකර ඇත.






තැපැල් සේවා සහ මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ආර්එම්ඩීබී මීගස්මුල්ල මහතා සහ තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර කාර්යාංශයේ අධ්‍යක්ෂ ශාන්ත කුමාර මහතා විසින් යුද්ධ හමුදාධිපති වෙත සහ සංඥා බලකාධිපති වෙත මුල්දින කවරය පිරිනමන ලද අවස්ථාවන්

# සැමරුම් කාසිය

ශ්‍රී ලංකා සංඥා බලකාය 75 වන සංවත්සරය සැමරීමට සමගාමීව යුද්ධ හමුදා ඉතිහාසයේ ප්‍රථම වතාවට ගනුදෙනු කිරීම සඳහා පොදුවේ සංසරණය වන කාසියක් ශ්‍රී ලංකා මහ බැංකුව සමග සහසම්බන්ධතාවයෙන් නිකුත් කරන ලදි.

රු 10 වටිනාකමෙන් යුත් කාසියෙහි එක් පසෙක මධ්‍යයේ ශ්‍රී ලංකා සංඥා බලකාය 75 වන සංවත්සරය උදෙසා විශේෂයෙන් නිර්මාණය කර එළිදැක්වූ සමරු ලාංඡනයද එහි මුහුනත සහ දෙපස "ශ්‍රී ලංකා" නාමය සිංහල, දමිල සහ ඉංග්‍රීසි බසින්ද පිලිඹිබුකර ඇත. එහි පහතින් නිකුත්කල වර්ෂය 2018 ලෙස සටහන්ව ඇත. කාසියෙහි අනික් පස එහි වටිනාකම ඉලක්කමෙන් සඳහන් වන අතර එහි වටිනාකම ත්‍රෛභාෂාවෙන්ම අකුරින් සඳහන් කර ඇති අතර එය වටා නෙළුම් මල් පෙති සමූහයකින් ආවරණයවන පරිදි නිර්මාණය කර ඇත. කාසිය රිදී පැහැති ලෝහමය නිපැයුමකින් යුතුවේ. මෙය "ස්ලෝවැකියාවෙහි මින්කොව්නා ක්රෙම්නිකා" සමාගම වෙතින් නිෂ්පාදනය කර ඇති අතර නිෂ්පාදිත සම්පූර්ණ කාසි සංඛ්‍යාව මිලියන 5 කි.




මෙම සමරු කාසිය ප්‍රථම වරට එළිදැක්වීම 2018 නොවැම්බර් මස 28 වන දින බණ්ඩාරණායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී සංඥා බලකාධිපතිගේ ආරාධනය පරිදි යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එන්යූඑම්එම්ඩබ් සේනානායක ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී යූඑස්ඒසීජීඑස්සී ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙහි නියෝජ්‍ය අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා, ව්‍යවහාර මුදල් අධිකාරී දීපා සෙනෙවිරත්න මහත්මිය, ව්‍යවහාර මුදල් නියෝජ්‍ය අධිකාරී පීඩීආර් දයානන්ද මහතා සහ ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී ව්‍යවහාර මුදල් අබේසේකර මහතා සහභාගීත්වයෙන් සිදුකරන ලදි.





ශ්‍රී ලංකා මහබැංකුවෙහි නියෝජ්‍ය අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා විසින් යුද්ධ හමුදාධිපති වෙත සහ සංඥා බලකාධිපති වෙත සමරු කාසිය පිරිනමන ලද අවස්ථාවන්

## 75 වන සංවත්සරය සඳහා එළිදැක්වූ සමරු තිළිණ



# ශ්‍රී ලංකා සංඥා බලකායේ 75 වන සංවත්සරයට සමගාමීව පැවැත් වූ "සයිබර් අවකාශය සදාතනික යුධ පෙරමුණ" සමුළුව

ශ්‍රී ලංකා සංඥා බලකායේ සහ සමස්ථ යුද්ධ හමුදාවෙහි කීර්තිනාමය ජාත්‍යන්තරයට විදහාපාමින් සංඥා බලකායේ 75 වන සංවත්සරයට සමගාමීව සංඥා රෙජිමේන්තුව විසින් 2018 නොවැම්බර් මස 28 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී දෙස් විදෙස් විද්වත් දේශකයන් සහභාගීත්වයෙන් "සයිබර් අවකාශය සදාතනික යුධ පෙරමුණ" (Cyber Space Perpetual Battle Front for Future) යන්න තේමාව කොට ගත් සම්මන්ත්‍රණයක් පැවැත්විණි. මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහභාගී විය.

මෙම සම්මන්ත්‍රණය සඳහා දෙස් විදෙස් හමුදා සාමාජිකයන්, රාජ්‍ය නිලධාරීන් සහ සංඥා සම්බන්ධතා ක්ෂේත්‍රයෙහි ආයතන තිබෙන ඉන්දියාව, චීනය, එක්සත් රාජධානිය, පාකිස්ථානය, සිංගප්පූරුව, බංගලාදේශය ඇතුළු රටවල් 10 කට වැඩි ප්‍රමාණයක් නියෝජනය කරමින් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ විශේෂඥයන් පැමිණ සිටි අතර, රාජ්‍ය ආරක්ෂක ලේකම් සමග ත්‍රිවිධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්වරුන් සහභාගී විය.

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එන්යූඑම්එම්ඩබ් සේනානායක ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී යූඑස්ඒසීජීඑස්සී සිය ආරම්භක දේශණය සිදු කරමින් සම්මන්ත්‍රණය ආරම්භකල අතර, එහිදී සයිබර් අවකාශයේ අභියෝගයන් අවබෝධ කරගැනීමේ ඇති වැදගත්කම පිළිබඳව අවධාරණය කරන ලදි.

මෙය සයිබර් අවකාශයෙහි ආරක්ෂාව සබැදිව බලපෑම් පිළිබද අධ්‍යනය සහ ඒ සබැදිව කලාපීය හා ගෝලීය වශයෙන් ක්‍රියාත්මකවීමේ ඇති වැදගත්කම පිළිබද දේශනයන් සහ සාකච්ජාවන්ගෙන් සමන්විත වූ අතර එය ඉතාමත් කාලෝචිත සහ සාර්ථක අධ්‍යයන සම්මන්ත්‍රණයක් විය.






















## සමුළුව සඳහා පැමිණි ආරාධිත දේශකයන්



Lieutenant General
Rajeev Sabherwal
Signal Officer-In-Chief
& Colonel Commandant,
Indian Army



Major General JJ Cole Obe
Director Information ,
Chief Information Officer,
British Army



Major General Hafeez
Ur Rehman, HI (M)
Signal Officer-In-
Chief Pakistan Army



Brigadier General Shaikh
Muhammad Rizwan Ali
Comd 86 Independent Signal
Brigade Bangladesh Army



Eng Dr Chandana Gamage
PhD, MEng, BSc Eng
Hons, BCS (UK), MACM,
MIE (SL), CEng



Dr. Sanjiva Weerawarana
Founder & Chairman
of WS O2



Prof. Zhai Lidong
Director of Network
Security Laboratory of
China Electronics Import
and Export Co. Ltd.



Mr. Goh Eng Choon
Deputy President Cyber
security Systems Group, ST
Engineering Electronics and
EVP/GM ST Electronics
(Info-Security) Pte Ltd.



Eng. Roshan Chandraguptha
Principal Information
Security Engineer at the Sri
Lanka CERT|CC



Mr Boshan Dayarathna
Group Director/CEO,
CICRA Holdings.



Gaurav Agarwal
Managing Director at
Symantec for its enterprise
security business in India
and SAARC.

# 75 වන සංවත්සරයට සමගාමීව පැවැත් වු තොරතුරු තාක්‍ෂණික ප්‍රදර්ශනය

"සයිබර් අවකාශය සදාතනික යුධ පෙරමුණ" (Cyber Space Perpetual Battle Front for Future) තේමාව කර ගනිමින් සංඥා බලකායේ 75 වන සංවත්සරයට සමගාමීව නොවැම්බර් 28 හා 29 දෙදින තුළ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ ප්‍රදර්ශනය සංඥා බලකාධිපතිගේ සහ යුද්ධ හමුදාධිපතිගේ ආරාධනය පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2019 නොවැම්බර් 28 විවෘත කරන ලදි.

එම ප්‍රදර්ශනය නවීන සංඥා සහ තොරතුරු තාක්‍ෂණ ක්‍රමවේදයන් පිළිබද දැනුම් සහ අත්දැකීම් සම්භාරයක් විද්‍යාමාන වන පරිදි සංවිධානය කර තිබු අතර ඒ සදහා යුද්ධ හමුදාවේ ප්‍රදර්ශන කුටිවලට අමතරව නාවික හමුදාව, ගුවන් හමුදාව සහ ශ්‍රී ලංකා පොලීසිය විසින් ද තොරතුරු සන්නිවේදන තාක්‍ෂණයට අදාල නියෝජිත සමාගම් වෙතින්ද ප්‍රදර්ශන කුටි ඉදිරිපත් කරන ලදි. මෙම ප්‍රදර්ශනය නැරඹීම සඳහා සැලකියයුතු පිරිසක් සහභාගි විය. පාසල් සිසු සිසුවියන් සදහාද එම ප්‍රදර්ශනය නැරඹීම සඳහා අවකාශය සලසාදීම තුළින් ඔවුන්ගේ තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය පිළිබද දැනුම වැඩි දියුණු කිරීමට මහගු රුකුලක් විය.

















EXHIBITION - 2018
Dialog






DELL


ARMY SIGNAL





# ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල අණ, පාලනය සහ පරිපාලනය සඳහා අවශ්‍ය වන සන්නිවේදන, පරිගණක තොරතුරු තාක්ෂණ සහ විද්‍යුත් සංග්‍රාමික කටයුතු පහසුකම් සැපයීම ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානයේ වගකීම වේ. ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය ආරම්භයේ සිට මේ දක්වා ප්‍රධාන සංඥා නිලධාරීන් පස්දෙනෙකු සමස්ථ යුද්ධ හමුදාවටත් සන්නිවේදන ක්ෂේත්‍රයේ රාජ්‍ය ආයතනයන්හිත් අවශ්‍යතා ඉටු කිරීම වෙනුවෙනුත් මහගු සේවාවක් ඉටු කර ඇති අතර, වර්තමානයෙහි මේජර් ජෙනරාල් එන්එම් හෙට්ටිආරච්චි වීඑස්වී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී යුද්ධ හමුදාවේ 6 වන ප්‍රධාන සංඥා නිලධාරී වශයෙන් 2018.04.23 දින එම තනතුරෙහි රාජකාරී භාරගැනීමෙන් පසු මෙම මූලය සඳහා නායකත්වය ලබාදෙමින් යුද්ධ හමුදා සංඥා අවශ්‍යතාවයන් කෙරෙහි මනා අවබෝධයෙන් ඉදිරි දැක්මක් ඇතිව රාජකාරීන් සිදු කරයි.



මේජර් ජෙනරාල් එන්එම් හෙට්ටිආරච්චි වීඑස්වී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ප්‍රධාන සංඥා නිලධාරී

යුද්ධ හමුදා සන්නිවේදන පහසුකම් ආරක්ෂක සේනා මූලස්ථාන, සේනාංක මූලස්ථාන ඇතුළු අනෙකුත් යුද්ධ හමුදා ආයතනයන් දක්වා ව්‍යාප්ත කිරීම සඳහා දුරකතන භුවමාරු, රේඩියෝ රිලේ පද්ධති ස්ථාපනය කිරීම සහ පරිගණක ජාලගත කිරීම් සිදු කිරීම, නව සංඥා උපකරණ උපාංග හදුන්වාදීම හා ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කිරීම ප්‍රධාන සංඥා නිලධාරීගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ ඒ ඒ සංඥා ඒකකයන් වෙතින් ඉටුකර කරනු ලබයි.

තවද, යුද්ධ හමුදාවේ තොරතුරු සහ සංඥා තාක්ෂණික යටිතල පහසුකම් ආරක්ෂා කරගනිමින් ඒවා නිසි අයුරින් පවත්වාගෙන යාම නූතන සයිබර් ප්‍රහාරයන් හමුවේ අභියෝගයක්ව පවතින අතර, වර්තමාන ලෝකයෙහි දිනෙන් දින අළුත් වෙමින් පවතින නවීන සන්නිවේදන ක්‍රම හා තොරතුරු තාක්ෂණයට අදාල වෘත්තීය පුහුණු වැඩසටහන් එම ක්ෂේත්‍රයේ ප්‍රමුඛ රාජ්‍ය හා පෞද්ගලික ආයතන විද්වතුන් සමග එක්වී ක්‍රියාත්මක කර ඒ තුලින් ලබාගන්නා දැනුම හා ක්‍රමවේදයන් ආරක්ෂක සේනා මූලස්ථානයන් යටතේ දේශණ පවත්වමින් අනෙකුත් නිලධාරී/ සෙසුනිලයින් හටද ලබාදීමට කටයුතු කර ඇත.

ආරක්ෂක අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් රාජ්‍ය ආයතනයන්හි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් මත පැවරෙන වගකීම් නිසියාකාරව ඉටුකිරීමට කටයුතු කිරීම (ත්‍රිවිධ හමුදා මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතිය, උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය වැනි) හා ජාතික ආරක්ෂාව අතින් ගත්කල වැදගත් නව ප්‍රතිපත්තීන් හා පනත් සැකසීමේදී අවශ්‍ය කරනු ලබන දත්තයන් හා තාක්ෂණික තොරතුරු සැපයීමට ක්‍රියාකිරීම මෙම මූලස්ථානය වෙතින් ඉටුකරන රාජකාරීන් අතරින් විශේෂ ඝණයෙහිලා සැලකිය හැකිය.





2019.03.11 දින යුද්ධ හමුදාධිපති විසින් තොරතුරු තාක්ෂණ සම්පත් කේන්ද්‍රය - යාපනය විවෘත කිරීමේ අවස්ථාව




තොරතුරු තාක්ෂණ සම්පත් කේන්ද්‍රය - යාපනය විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වූ යුද්ධ හමුදාධිපති හා ප්‍රධාන සංඥා නිලධාරී ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ එහි පළමු පාඨමාලාව හැදෑරීම සඳහා පැමිණි දමිළ හා මුස්ලිම් සිසු දරුදැරියන් සමග පෙනී සිටි සමූහ ඡායාරූපය






2019 වර්ෂයේ රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතනය වෙතින් පාඨමාලා හදාරන ලද සිසුන් සඳහා සහතික පත්‍ර ප්‍රදානෝත්සවය ප්‍රධාන සංඥා නිලධාරීගේ ප්‍රධානත්වයෙන් 2019.04.09 දින රෙම ශ්‍රීලංසංබ සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලදී





නිලධාරී/ සෙසුනිලයින්ගේ තාක්ෂණික දැනුම වර්ධනය කිරීම සඳහා පවත්වන ලද දේශන/ වැඩමුළුවන් අතුරින් කිහිපයක්



බ්‍රිගේඩියර් එම්පීජේඑස්කේ පටබැඳිගේ විසින් 2018.10.26 දින බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ තනතුරෙහි වැඩ භාරගැනීම



ලුතිනන් කර්නල් ඒකේඩී අධිකාරි යූඑස්පී විසින් 2019.04.23 දින කර්නල් සම්බන්ධීකරණ තනතුරෙහි වැඩ භාරගැනීම



ලුතිනන් කර්නල් කේවීපී ධම්මික යූඑස්පී විසින් 2019.06.03 දින ප්‍රමානි 1 (සංඥා) තනතුරෙහි වැඩ භාරගැනිම



මේජර් එච්කේයු නදීක යූඑස්පී විසින් 2019.08.16 දින ප්‍රමානි 2 (විද්සංබ) තනතුරෙහි වැඩ භාරගැනීම

# තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය



**බ්‍රිගේඩියර්**
**එන්පී අකුරන්තිලක**
**අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණ**

තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි තොරතුරු තාක්ෂණ අංශයෙහි අභිවෘද්ධිය උදෙසා විශාල මෙහෙයක් ඉටුකරනු ලබන අතර එය 2010 මාර්තු 01 වන දින ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය යටතේ ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාපතිතුමාගේ මඟ පෙන්වීම මත ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල සියළුම ආයතන සඳහා වූ මෘදුකාංග නිර්මාණය සහ ජාල විසඳුම් සැලසුම් කිරීම, නිපදවීම හා නඩත්තු කිරීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදුකරනු ලබයි. ඉතාමත් සංකීර්ණ වූ ගෘහස්ථ තොරතුරු තාක්ෂණ විසඳුම් නිපදවීමට පහසුකම් සැලසීම සඳහා මෘදුකාංග සංවර්ධන හා ඉංජිනේරු මධ්‍යස්ථානය, දත්ත මධ්‍යස්ථාන, වෙබ් අඩවි අංශය සහ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයද, වර්තමාන තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂතුමාගේ අධීක්ෂණය යටතේ ගොඩනගා ඇත.

6 ශ්‍රීලංසංබ, 11 ශ්‍රීලංසංබ සහ 12 ශ්‍රීලංසංබ ඒකකයන් යුද්ධ හමුදාව තුල තොරතුරු තාක්ෂණ සේවා කටයුතු වල නියුතු වන අතර එම ඒකක තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ විශේෂඥ දැනුම සහිතව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි විවිධ මූලස්ථානයන් සඳහා තොරතුරු තාක්ෂණ අවශ්‍යතා ඇප කැපවී කාර්යක්ෂමව ඉටුකරනු ලබයි. එම රාජකාරීන්හී නියුතු නිලධාරීන්ගේ විශේෂඥ දැනුම නොඅඩුව ලබා ගැනීම සඳහා ඔවුන් ධෛර්යමත් කිරීම ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානයෙහි සහය ද ඇතිව තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදුකරනු ලබයි.

වර්තමානයෙහි එවැනි තොරතුරු තාක්ෂණ නිලධාරීන් 97 ක්ද පරිගණක ක්‍රියාකරුවන් 809 දෙනෙකුද ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි තොරතුරු තාක්ෂණ අංශයෙහි අභිවෘද්ධිය සඳහා වූ විවිධ ව්‍යාපෘති සහ එම විෂය සම්බන්ධ විවිධ වූ තොරතුරු තාක්ෂණ රාජකාරීන්වල නිරතව සිටින අතර, එම සියළුම ව්‍යාපෘතීන් තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි නිබඳ අධීක්ෂණය යටතේ කරනු ලබයි.

වර්තමානයේ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ තුමන්ගේ මඟ පෙන්වීම යටතේ තම කටයුතු ඉතා සාර්ථකව සහ ප්‍රතිඵලදායක ලෙස සිදු කර ගෙන යනු ලබයි. තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතින්වලට යොදන ලද අති විශාල කැපකිරීම් හා දිරිමත් බව හේතු කොටගෙන තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන මෘදුකාංග සංවර්ධන හා ඉංජිනේරු මධ්‍යස්ථානය විවිධ වූ සාර්ථක ව්‍යාපෘතීන් ගණනාවක් ක්‍රියාත්මක කිරීමට සමත්ව ඇත.

පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති. වර්තමානයේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තාක්ෂණිකව සංකීර්ණ වූ පද්ධති මිලදී ගැනීම හරහා තාක්ෂණිකව පරිපූර්ණ යුද්ධ හමුදාවක් බවට පරිවර්තනය වීමට ආරම්භ කර ඇත. තවද ඔවුන් විසින් ගන්නා ලද වෑයමේ ප්‍රතිඵලයක් ලෙස පහත සඳහන් ව්‍යාපෘති මේ වන විට තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ පර්යේෂණ හා සංවර්ධන අංශය මගින් නිමකර ඇති අතර එම ව්‍යපෘති දිවයිනේ ප්‍රදර්ශණ ගණනාවකදී සාර්ථකව ඉදිරිපත් කර ජයග්‍රණ හිමිකරගෙන ඇත.

- ► Small Arm Firing Simulator.
- ► GPS Guided Quad copter.
- ► Throw Robot + VR.
- ► Software Defined Radio.
- ► Software Defined Network.
- ► Digital Situational Awareness Map.
- ► Physical Test Monitoring System.



තවද තොතා අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ඇති වෙබ් අඩවි අංශය මගින් යුධ හමුදාවට අදාල වෙබ් අඩවි නිර්මාණය කරනු ලබන අතර 2019 වසරේ අගෝස්තු මස 08 වන දින BestWeb.lk තරගාවලියේ රජයේ වෙබ් අඩවි කාණ්ඩය යටතේ යුද්ධ හමුදා නිල වෙබ් අඩවිය සඳහා පහත සඳහන් ජයග්‍රහණ ත්‍රිත්වය ලබාඇති බැව් දන්වා සිටිනු ලැබේ.

- ► හොදම දෙමළ වෙබ් අඩවිය - රිදී සම්මානය
- ► හොදම රජයේ වෙබ් අඩවිය - කුසලතා සම්මානය
- ► හොදම සිංහල වෙබ් අඩවිය - කුසලතා සම්මානය

ඊට අමතරව තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ 9 වන සංවත්සරය සමරමින් මහරගම අපේක්ෂා රෝහලේ රෝගී දූ දරුවන් වෙත කියවීම සඳහා පොත්පත් හා ත්‍යාග කට්ටල තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකතුමාගේ ප්‍රධානත්වයෙන් පරිත්‍යාග කරන ලදි. මේ සඳහා තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළුම නිලධාරීන් සහ සෙසුනිලයින් සහභාගී වන ලදි. එමෙන්ම 9 වන සංවත්සරයට සමගාමීව සියළු නිල සුහද හමුවක් කුකුළේගඟ ලයා ලෙෂර් හීදී ඉතා උත්කර්ෂවත් අන්දමින් දවස පුරා පවත්වනු ලැබූ අතර එය නිලධාරී/සෙසුනිලයිනගේ සහයෝගීතාවය වර්ධනයට සහ දැනුම බෙදා ගැනිමට ඉමහත් පිටුවහලක් විය.





අපේක්ෂා රෝහලේ රෝගී දු දරුවන් වෙත පොත්පත් බෙදාදීම





තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩල නිලධාරී/ සෙසුනිලයින් 9 වන සංවත්සරය සමරමින්








යුද්ධ හමුදාව වෙතින් 2019 ආරක්ෂක සම්මන්ත්‍රණය මෙවරත් බණ්ඩාරණායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී 2019 අගෝස්තු මස 29 හා 30 දිනයන්හිදී ඉතා උසස් අන්දමින් සිදුකල අතර ඒ වෙනුවෙන් තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය සුවිශේෂී කාර්‍ය භාරයක් ඉටුකරන ලදි.





2019 ආරක්ෂක සම්මන්ත්‍රණය සාර්ථකව නිමකිරීම හේතුවෙන් ඒ සඳහා දායක වු සියළු නිලයන්ගේ විනෝදාස්වාදය උදෙසා තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂගේ මගපෙන්වීම යටතේ ප්‍රධාන සංඥා නිලධාරීගේ ප්‍රධානත්වයෙන් සියළු නිල සුහද හමුවක් රෙම ශ්‍රීලංසංබ පරිශ්‍රයේදී පවත්වන ලදි.

# සංඥා බලසේනා මූලස්ථානය



කර්නල්
ඩබ්එල් ප්‍රේමසිරි යූඑස්පී
සංඥා බලසේනාධිපති

ශ්‍රී ලංකාව තුල ඇතිවූ ත්‍රස්ථවාදි අරගල හේතුකොටගෙන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ව්‍යාප්තියත් සමග අණදීමේ හා පාලන කටයුතු ක්‍රමවත්ව ඉටු කිරිම සඳහා අවැසි සංඥා සම්බන්ධතාවය ඉටු කිරිමේ අරමුණින් 1988.06.01 වන දින ප්‍රධාන සංඥා නිලධාරි අධ්‍යක්ෂක මණ්ඩලය/ සංඥා බලසේනාව වශයෙන් යුධ හමුදා මූලස්ථානයේදි ආරම්භ කරන ලද අතර, මානුෂිය මෙහෙයුම් ආරම්භ කිරිමත් සමග සංඥා බලසේනා මූලස්ථානය වශයෙන් ස්වාධිනව මෙම මූලස්ථානය රාජකාරි කිරිම ආරම්භ කරන ලදි. බලසේනාව ආරම්භයේ සිට පැවති යුධමය කාලවකවානුව තුල බලකායට ආවේණික සන්නිවේදන රාජකාරී ඉටු කිරීමෙන් සහ ඉදුරාම ක්‍රියාන්විත රාජකාරීවල යෙදීමෙන් සමස්ත යුද්ධ හමුදාව තුල සංඥා බලකාය ප්‍රශංසාවට ලක්ව ඇත.

යුධමය කාල වකවානුවෙන් පසු එවකට ආධාරක බලඇණි වශයෙන් පැවති ඒකක වෘත්තිය සංඥා ඒකක බවට පරිවර්ථනය වෙමින් ශ්‍රී ලංකා සංඥා බලකාය තව දුරටත් පුළුල් වු අතර ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත අවැසි සන්නිවේදන අවශ්‍යතා නව තාක්ෂණයෙන් යුතුව ඉතා උසස් මට්ටමින් ඉටු කිරිමේ භාරදූර්‍ය වගකිම මෙම බලසේනා මූලස්ථානය වෙත පැවරී ඇති අතර මේ වන විට ඉතා සාර්ථකව එම වගකීම ඉටුකරමින් පවතී.

2018.08.29 සහ 30 යන දෙදින තුල බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති කොළඹ ආරක්ෂක සමුළුව ඇතුළු විවිධ වැඩසටහන් සහ විදේශ රටවල සාම සාධක මෙහෙයුම් වල යෙදී සිටින භට පිරිස් සහ පුහුණු අභ්‍යාස වෙත අවැසි සංඥා සම්බන්ධතාවය සංඥා බලසේනා මූලස්ථාන අධීක්ෂණය යටතේ සපයනු ලබයි.

නොසිතූ මොහොතක 2019.04.21 දින සිදුවූ පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය හේතුවෙන් රටතුල ඇතිවූ නොසන්සුන්කාරි වාතාවරණය මැඩ පැවැත්වීම වෙනුවෙන් යොදවන ලද භටපිරිස් සදහා අවශ්‍ය සංඥා සම්බන්ධතාවයන් ඉතා කාර්යක්ෂමව හා කෙටිකාලයක් තුල ලබාදිම සහ දිවයින පුරා අභ්‍යන්තර ආරක්ෂක රාජකාරීන් සදහා භටපිරිස් ස්ථාපනයේදී අවශ්‍ය සංඥා සම්බන්ධතාව කාර්‍යක්ෂමව සිදුකිරිමට දායක වන ලදි.





සංඥා බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්පීඑ්කේ තිලකරත්න පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ පූර්ණ අධීක්ෂණය යටතේ 71 වන නිදහස් දින සැමරුම් පෙළපාලිය සඳහා අවැසි සංඥා අවශ්‍යතා ඉටු කිරීම මෙන්ම බලසේනා මූලස්ථානය වෙතින් රථ පෙළපාලිය සඳහා ගුවන් විදුලි යන්ත්‍ර ප්‍රදර්ශණ රථ ආදිය ඉදිරිපත් කරන ලද අතර එහි අණදෙන නිලධාරී වශයෙන් 3 ශ්‍රීලංසංඛ ඒකකයේ අණදෙන නිලධාරී වන ලුතිනන් කර්නල් වයිඑස්පී සුමනසිංහ ආර්එස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී කටයුතු කරන ලදි.



සංඥා බලකායේ අභිමානය පිළිබිඹු කරමින් 71 වන නිදහස් දින පෙළපාලියේ ගමන් කරන ලද සංඥා බලකායට අයත් ජෑමර් රථය




2019 නිදහස් දින පෙළපාලියේ අණදෙන නිලධාරී වන ලුතිනන් කර්නල් වයිඑස්පී සුමනසිංහ ආර්එස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී ගමන් කල අවස්ථාව




සංඥා බලසේනා මූලස්ථානයේ 21 වන බලසේනාධිපති ලෙස කර්නල් ඩබ්එල් ප්‍රේමසිරි යූඑස්පී 2019.04.22 දින සුභ මොහොතින් සිය රාජකාරි භාර ගන්නා ලද අවස්ථාව

2019.07.18 දින සිට 2019.07.21 දින දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැති ශිල්ප සේනා ප්‍රදර්ශනය හා තාක්ෂණ විප්ලවය සම්බන්ධ ප්‍රදර්ශනය, 2019.07.24 දින සිට 2019.07.27 දින දක්වා 2025 Enterprise Sri Lanka ප්‍රදර්ශනය අනුරාධපුර වලිසිංහ හරිස්චන්ද්‍ර ක්‍රීඩා භූමියේදී සහ 2019.07.26 දින සිට 2019.07.27 දින දක්වා පරාක්‍රමපුර මහජන ක්‍රීඩාංගනයේදී පැවති නව නිපැයුම් ප්‍රදර්ශනය සඳහා සංඥා බලකා නව නිපැයුම් හා සංඥා උපකරණ ප්‍රදර්ශනය කිරීම මෙම බලසේනා මූලස්ථාන සම්බන්ධීකරණ හා අධීක්ෂණය යටතේ සාර්ථකව සිදු කරන ලදි.

දේශීය/විදේශීය ආයතන විසින් යෝජනා කරන ලද විවිධ සංඥා උපකරණ සබැඳි ක්ෂේත්‍ර පරීක්ෂාවන් මෙම බලසේනා මූලස්ථානයේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදුකරන ලද අතර ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය වෙතින් යුද්ධ හමුදාව වෙත නව ගුවන් විදුලි යන්ත්‍ර ජාලයක් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය සඳහා අවැසි දත්ත හා වාර්ථා ලබාදීම ද සිදු කර ඇත. හදිසි අවස්ථාවන්හි දී සහ ආපදා අවස්ථාවන්හි දී සංඥා සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා විකල්ප ගුවන් විදුලි ජාලයක් ලෙස ආසේමු යටතේ ස්ථාපිත සියළු සංඥා ඒකක සම්බන්ධ කරමින් කිසිදු බාහිර යටිතල ව්‍යුහයක් ප්‍රයෝජනයට නොගෙන අයන ගෝලය පමණක් සම්බන්ධ කරගෙන ක්‍රියාත්මක වන සන්නිවේදන ක්‍රමයක් භාවිතා වන අධි තරංග (HF) ගුවන් විදුලි ජාලයක් ද 2019 ජූනි මස සිට ස්ථාපිත කරන ලදි.

# සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය

සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා සංඥා බලකායෙහි ඒකකයන් 11 ක් සංඥා පාසැල ඇතුලත්ව අනෙකුත් සංඥා බලකායට අයත් ස්වාධීන ආයතනයන්හීදී පාලන සහ පරිපාලන වගකීම් ඉටුකරමින් සංඥා බලකායෙහි අභිවෘද්ධිය උදෙසා වූ කාර්යභාරය මනාව සනිටුහන් කරනු ලබයි.

පසුගිය වර්ෂය තුල සංඥා බලකායෙහි ඒකකයන්හී පාලන පරීක්ෂාවන් සිදුකිරීම, සෙසු නිලයන්ගේ නිල උසස් කිරීම් ප්‍රමුඛ අනිකුත් සියලු පාලන කටයුතු ක්‍රමවත්ව සුපරීක්ෂාව සහ නිවැරදි අධීක්ෂණයක් පවත්වාගෙන යමින් ඒකකයන්හී පාලනමය කටයුතු සිදුකිරීම හා සම්බන්ධතාවයෙන් කටයුතු සිදුකර ඇත.

පසුගිය වසර තුල කාර්ය සාධනයෙහි ප්‍රගතිය මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයේද ලබාගත් ජයග්‍රහණ සහ ජාත්‍යන්තර මට්ටමට ක්‍රීඩකයන් කිහිපදෙනෙකු බිහිකිරීම රෙජිමේන්තුව ලද සාඩම්බර ජයග්‍රාහී අභිමානයකි.





සංඥා බලකායෙහි ජ්‍යෙෂ්ඨ නිලධාරියකු වන අධ්‍යක්ෂක ඉඩම් දේපල හා භඨනිවාස අධ්‍යක්ෂක තනතුරේ රාජකාරී කල සංඥා බලකායට අයත් බ්‍රිගේඩියර් සීඑම්ඩීපී චන්ද්‍රසේකර එන්ඩීයූ ජ්‍යෙෂ්ඨ නිලධාරී 2019.01.11 දින මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබීම නිමිතිකොට ගෙන රෙජිමේන්තු මධ්‍යස්ථාන භූමියේදී සම්මාන මුරය හා සම්මාන පෙළපාලිය 2019.02.07 දින පවත්වන ලදී.





තවද සංඥා බලකා ගමන්මගේ නොමැකෙන රන් පිටුවක් පෙරලමින් වර්ෂ 2018 දී සිය 75 වන සංවත්සරය අභිමානයෙන් සැමරූ මොහොතේ සංඥා බලකාධිපති වූ මේජර් ජෙනරාල් බීඑච්එම්ජී විජේසිංහ යූඑස්පී එන්ඩීයූ පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී යුද හමුදා සේවයෙන් විශ්‍රාම යාම 2019.04.26 වන දින සිදුවිය.





සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන ප්‍රධාන ගොඩනැගිල්ලට ආදේශනයක් එක් කරමින් සංඥා බලකායෙහි අතීත සමරු සටහන් පිළිඹිබු වන පරිදි කෞතුකාගාරයක් 2019.04.26 වන දින සංඥා බලකාධිපති විසින් විවෘත කරන ලදී.





සංඥා බලකායෙහි නව බලකාධිපති වශයෙන් මේජර් ජෙනරාල් එන්එම් හෙට්ටිආරච්චි වීඑස්වී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී 2019.05.02 වන දින සුබ මොහෙතින් සංඥා බලකාධිපති තනතුරේ රාජකාරී භාරගන්නා ලදී.





ආඥාපති ඉනපේ උතුරුමැද මේජර් ජෙනරාල් කේඑම්ආර්පී කරුණාතිලක පීඑස්සී 2019.03.22 දින මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබීම වෙනුවෙන් රෙජිමේන්තු මධ්‍යස්ථාන භූමියේදී සම්මාන මුරය හා සම්මාන පෙළපාලිය 2019.06.04 දින පවත්වන ලදී.





පර්යේෂණ, විශ්ලේෂණ හා සංවර්ධන ශාඛාවේ අධ්‍යක්ෂක මේජර් ජෙනරාල් ඩීආර් ධර්මසිරි යූඑස්පී එච්ඩීඑම්සී මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබීම වෙනුවෙන් රෙජිමේන්තු මධ්‍යස්ථාන භූමියේදී සම්මාන මුරය හා සම්මාන පෙළපාලිය 2019.09.04 දින පවත්වන ලදී.



2019.08.01 වන දින අතීතය වර්ථමානය සහ අනාගතයේ සංඥා සන්නිවේදනය පිලිඹිබු කරන බිතුසිතුවම් එලිදැක්වීම සංඥා බලකාධිපති විසින් සිදු කරන ලදී.



2019.07.18 දින රෙජිමේන්තු සැරයන් මේජර් වන බනි 1 එස්කේ හේවගේ ආර්එස්පී විශ්‍රාම ගැනීම වෙනුවෙන් පිරිනමන ලද සම්මාන පෙලපාලිය



සංඥා රෙජිමේන්තු නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක වශයෙන් එවක ලුතිනන් කර්නල් පීජීඑ ගුණසේකර යූඑස්පී 2019.01.14 වන දින සුභ මොහොතින් එම රාජකාරී භාරගන්නා ලදී



සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයෙහි ප්‍රමානි I ලෙස ලුතිනන් කර්නල් එස්ජේකේඩී ජයවර්ධන යූඑස්පී පීඑස්සී 2019.03.01 වන දින සුභ මොහොතින් එම රාජකාරී භාරගන්නා ලදී



සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයෙහි විධායක අධිකාරී ලෙස මේජර් කේවීඑ කොඩිකාර පීඑස්සී 2019.03.01 වන දින සුභ මොහොතින් එම රාජකාරී භාරගන්නා ලදී



සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයෙහි නව විධායක අධිකාරී ලෙස මේජර් ඩබ්එච්එම්ජේ විජේරත්න පීඑස්සී 2019.08.29 වන දින සුභ මොහොතින් එම රාජකාරී භාරගන්නා ලදී



සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයෙහි රෙජිමේන්තු සැරයන් මේජර් ලෙස ඔනි I එස්එන් සෙනවිරත්න විසින් 2019.07.19 වන දින සුභ මොහොතින් එම රාජකාරී භාරගන්නා ලදී



සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයෙහි සරඹ උපදේශක ලෙස ඔනි II ජයකොඩි ජේඑන්එ විසින් 2019.08.06 වන දින සුභ මොහොතින් එම රාජකාරී භාරගන්නා ලදී

# 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

1 වන ශ්‍රී ලංකා සංඥා රෙජිමේන්තුව වර්තමානයේ මුලතිව් දිස්ත්‍රික්කයේ වට්ටප්පලෙයි ප්‍රදේශයේ ස්ථානගතව ඇති අතර, ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) සහ ඒ යටතේ ඇති සේනාංක මූලස්ථාන, බලසේනා මූලස්ථාන, ඒකක මෙන්ම අනෙකුත් යුද්ධ හමුදා මූලස්ථාන/ අණුඛණ්ඩ සඳහා සංඥා සම්බන්ධතා ලබා දෙමින් හා නවීන තාක්ෂණය භාවිතා කරමින් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමග සම්බන්ධතාවයෙන් කටයුතු කර ෆයිබර් ඔප්ටික් තාක්ෂණය ඔස්සේ ආසේමු (මුලතිව්) බලප්‍රදේශය තුල අන්තර්ජාල පහසුකම් සහිත දත්ත  සන්නිවේදන පහසුකම් ඇති කරමින් සංඥා සම්බන්ධතාවයන් වැඩිදියුණු කිරීමේ කටයුතු සිදුකර ගෙන යනු ලබයි.



ලුතිනන් කර්නල්
ටීඑස් ලියනගුණවර්ධන
අණදෙන නිලධාරී

2018 වසරේ ඒකකයේ සංවත්සරයට සමගාමීව විශේෂ උත්සව මාලාවක් ආගමික වතාවත්වලට මුල් තැන දෙමින් සංවිධානය කරන ලද අතර, එහිදී ඒකකය වෙත ස්වාමින් වහන්සේ නමක් වැඩමවා ඒකකයේ රාජකාරී කල දේශය වෙනුවෙන් තම ජීවිතය පුජා කල රණවිරුවන් හට පිං අනුමෝදනා කරමින් හා ඒකකයේ දැනට රාජකාරී නියුතු නිලධාරී/සෙනින් හට සෙත්පතා 2018.10.24 වන දින විශේෂ බෝධි පුජා පිංකමකද, 2018.10.25 වන දින වට්ටප්පලෙයි හින්දු කෝවිලේ විශේෂ දේව පුජාවක්ද පවත්වන ලදි. තවද සංවත්සරයට සමගාමීව ඒකකයේ අණදෙන නිලධාරී වෙත 2018.10.26 වන  දින සම්මාන පෙළපාලියක් පිරිනමන ලද අතර, ඒකකයේ නිලධාරීන් සහ  සෙසුනිලයින්ගේ සහභාගිත්වයෙන් සියළු නිල සුහද හමුවක් හා දිවා භෝජන සංග්‍රහය 2018.10.27 වන දින පවත්වන ලදි.





2019.07.29 වන දින සංඥා බලකාධිපති හා ප්‍රධාන සංඥා නිලධාරී මේජර ජෙනරාල් එන්එම් හෙට්ටිආරච්චි වීඑස්වී යුඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී මෙම ඒකක සංචාරය හා එතුමන් වෙත සමරු ඵලකයක් පිළිගැන්වීම





2018.12.07 වන දින සංඥා බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්පිජ්කේ තිලකරත්න පීඑස්සී මෙම ඒකක සංචාරය





59 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පිආර් වනිගසූරිය යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීපීඑස්සී මෙම ඒකක සංචාරය







2019.04.21 වන දින සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් බීඑච්එම්ජ් විජේසිංහ යූඑස්පී එන්ඩීයූ පීඑස්සී මෙම ඒකක සංචාරය






2019.06.27 වන දින සංඥා බලසේනාධිපති කර්නල් ඩබ්එල් ප්‍රේමසිරි යූඑස්පී මෙම ඒකක සංචාරය

# 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය



**ලුතිනන් කර්නල්**
**එන්පීඑ මෙන්ඩිස් පීඑස්සී**
**අණදෙන නිලධාරී**

මෙම රෙජිමේන්තුව ආරම්භ කළ දින සිට මාතෘ භූමියේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාවය උදෙසා ත්‍රස්ථවාදයට එරෙහිව සිදුකළ යුද්ධයෙහි විජයග්‍රාහී දිනය වන 2009 මැයි මස 18 දින දක්වාත් එතැන් පටන් මේ දක්වා සියලු ශ්‍රී ලාංකිකයින් අත්විදින සාමකාමී වාතාවරණය තුලත් නිසි සංඥා සම්බන්ධතාවයන් පවත්වමින් සංඥා රාජකාරීන් මෙන්ම පාබල රාජකාරීන්ද ඉටුකරමින් විවිධ වු තාක්‍ෂණික ඥාණයෙන් මෙන්ම අඛණ්ඩ වු කැපවීමෙන් ජාතිය ගොඩනැගීමේ මහගු ක්‍රියාදාමයට ද දායක වෙමින් මෙම රෙජිමේන්තුවෙහි සියළුම නිලයින් විසින් ඉමහත් වු ශ්‍රමයෙන්, කාය දානයෙන් හා ප්‍රාණ දානයෙන් ඉටුකළ සේවය අමිලවේ, අනුපමේයවේ, ගෞරවණීය වේ.

මේ අතරවාරයේ යාපනය ආරක්‍ෂක සේනා මූලස්ථානයෙහි අධීක්‍ෂණය යටතේ එම බලප්‍රදේශය තුල ඇති පාබල ඒකකයන්හි විශේෂ පාබල ක්‍රියාන්විතයන් හී නිරත විය හැකි සෙබළුන් පිරිසක් බිහි කිරීමේ අරමුණින් පසුගිය වසර තුල විශේෂ පාබළ ඛණ්ඩ පුහුණු පාඨමාලවන් 4 ක් සදහා සංඥා අධියරයන් 4 ක් පවත්වා ඔවුන්ගේ සන්නිවේදන දැනුම වර්ධනය කර දීමට ක්‍රියා කරන ලදි.

මෑතකාලීන ප්‍රධාන සිදුවීමක් වශයෙන් මෙම රෙජිමේන්තුවේ 23 වන අණදෙන නිලධාරී වශයෙන් සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයෙහි ප්‍රධාන මාණ්ඩලික නිලධාරී I වශයෙන් රාජකාරී කළ ලුතිනන් කර්නල් එන්පීඑ මෙන්ඩිස් පීඑස්සී විසින් 2019.02.07 දින රාජකාරීන් භාර ගැනීම සිදු කරන ලද අතර මේ වන විට ඔහුගේ අත්දැකීම් හා පළපුරුද්ද උපයෝගී කර ගනිමින් මීට පෙර රාජකාරීන් ඉටුකළ අණදෙන නිලධාරීන් 22 දෙනා විසින් රෙජිමේන්තුවේ අභිවෘද්ධිය උදෙසා සිදුකළ සියළු කාර්යයන් තවදුරටත් ඉදිරියට රැගෙන එමින් නව මුහුණුවරක් ඔස්සේ රෙජිමේන්තුවෙහි වෘත්තීය ප්‍රවීණතාවය, ගෞරවය හා ප්‍රතිරූපය භෞතික හා සාමාජීය වශයෙන් ප්‍රවර්ධනය කිරීමේ භාරදූර කර්තව්‍යයක නියැලී සිටී.

2019 මාර්තු මස 09 දිනට යෙදුණු මෙම රෙජිමේන්තුවේ අභිමානවත් 30 වන සංවත්සරය ඉතා චාම් අයුරින් පවත්වන්නට යෙදුණ අතර, සංවත්සර උළෙලට සමගාමීව පැවැත්වු වැඩසටහන් මාලාවේ පළමු අධියර ලෙස 2018.03.01 හා 02 යන දිනයන් හිදි අන්තර් බළඝණ ක්‍රීඩා තරගාවලියක් පැවැත්වීමටත් 2019.03.04 දින මෙම රෙජිමේන්තුවේ සේවය කරමින් රට ජාතිය වෙනුවෙන් කාය දානයෙන් හා ප්‍රාණ දානයෙන් යුතුව ක්‍රියා කළ රණවිරුවන් සහ සියළු ආබාධිත රණවිරුවන් සිහිපත් කරමින් ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් බෝධිපූජා පිංකමක් නවීකරණය කරන ලද රෙජිමේන්තු බුදුමැදුර අභියස පවත්වා එදිනම හින්දු කෝවිල් පූජාවක් මාවලූපුරම් කෝවිලේ පැවැත්වීමටත් කටයුතු කරන ලදී.

තවද 30 වන සංවත්සරයට සමගාමීව මෙම රෙජිමේන්තුව වෙතින් යාපනය ප්‍රදේශයේ අසරණ රෝගීන් සදහා ලේ දන් දීමේ වැඩසටහනක් යාපනය ලේ බැංකුව සමග සම්බන්ධතාවයෙන් යුතුව 2019.03.05 වන දින රෙජිමේන්තු මූලස්ථානයේ ඉතා සාර්ථකව ලෙස පැවැත්වු අතර, ඊට රෙජිමේන්තුවේ රාජකාරීන් හි නියුතු නිලධාරීන්, සෙසුනිලයින් හා සිවිල් සේවක මහතුන් මෙන්ම අවට ඒකකයන්හී සාමාජිකයින්ද එක සිතින් මේ මහා පුණ්‍ය කර්මයකට දායකත්වය ලබා දෙන ලදි.

හමුදා සම්ප්‍රදායන්ටද අනුගත වෙමින් 2019.03.09 දින 3 වන සංඥා රෙජිමේන්තුවේ 30 වන සංවත්සර දිනය වෙනුවෙන් ගෞරව අභිමානය පෙරදැරිව අණදෙන නිලධාරී තුමන් හට සම්මාන මුරයක් සහ සම්මාන පෙළපාලියක් පිරිනමන ලද අතර, එදින සියළු නිල දිවා භෝජන සංග්‍රහයක්ද පවත්වන ලදි. ඉන් අනතුරුව සංවත්සර උළෙලේ අවසාන අංගය ලෙස සියළු නිලයින්ගේ සුහද හමුව 2019.03.13 වන දින රෙජිමේන්තු ක්‍රීඩාපිටියේදී උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට කටයුතු කරන ලදි.

තවද 2019.04.21 වන දින ශ්‍රී ලංකාව තුළ සිදු වු බේදවාචකය නිසා ඇති වූ හදිසි තත්වයෙන් පසුව සන්නිවේදන උපකරණවල දැඩි අවශ්‍යතාවයක් යුද්ධ හමුදාව තුළ පැන නැගුණ අතර, එම නිසා මෙම රෙජිමේන්තුව සතුව ඇති සීමිත ගුවන් විදුලි උපකරණ සියල්ල කළමණාකරණය කරමින් ඊට අමතරව පැරණි ගුවන් විදුලි යන්ත්‍ර කොටස් මෙම රෙජිමේන්තුවේ සංඥා ක්ෂේත්‍ර වැඩපොළ මගින් අළුත්වැඩියා කරමින් හා නවීකරණය කළ ගුවන් විදුලි යන්ත්‍ර කොටස් භාවිතා කරමින් මෙම බලප්‍රදේශය තුළ ගුවන් විදුලි සම්බන්ධතා අඛණ්ඩව සැපයීමට මෙම රෙජිමේන්තුව කටයුතු කරන ලදි.

අවසන් වශයෙන් 30 වසරක කඩඉම පසුකර 31 වන වසරට පා තබා සිටින මෙම ඒකකය ආරම්භයේ සිට මේ දක්වා පැමිණි ගමන් මගෙහි සාර්ථකත්වයට දායක වෙමින් දිවිහිමියෙන් රාජකාරී කළ සියළුම නිලධාරීන් හා සෙසුනිලයින්ද, දැනට රාජකාරියේ යෙදී සිටින සියළුම නිලධාරීන් හා සෙසුනිලයින්ද ඉතාමත් භක්ති ප්‍රණාමයෙන් යුතුව සිහිපත් කරමින් මෙවන් මෙහෙවරක් ඉටු කල 3 වන සංඥා රෙජිමේන්තුවෙහි නාමය මෙන්ම සමස්ථ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල දීප්තිමත් ඒකකයක් ලෙස දිනෙන් දින දියුණුවට පත් වේවායි එක සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.





2019.02.07 දින 3 ශ්‍රීලංසංබ ඒකකයේ නව අණදෙන නිලධාරී වශයෙන් ලුතිනන් කර්නල් එන්පීඒ මෙන්ඩිස් පීඑස්සී වෙත පිරිනැමූ සම්මාන මුරය හා සම්මාන පෙළපාලියේ අවස්ථාවන්





2019.03.04 වන දින 3 ශ්‍රීලංසංබ ඒකකයේ 30 වන සංවත්සරයට සමගාමීව යාපනය ලේ බැංකුව සහසම්බන්ධතාවයෙන් යුතුව මෙම ඒකකය තුළ පැවැත්වූ ලේ දන් දීමේ වැඩසටහන හා කන්කසන්තුරය තල්සෙවණ නිවාඩු නිකේතනයෙහි නිලධාරීන් වෙනුවෙන් පැවැත්වූ සුහද හමුව





30 වන සංවත්සරයට සමගාමීව පැවැත්වූ ක්‍රීඩා තරගයන්හි විශේෂ අවස්ථා





පුහුණුවීම් සඳහා ඒකකයේ ස්ථාපනය කර ඇති ස්වයං පියස සහ ක්‍රියාන්විත මැදිරියෙහි පුහුණුවීම් වල නිරත වෙමින් සිටින භට පිරිස්

# 4 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය



ලුතිනන් කර්නල්
පීජීසී පෙරේරා පීඑස්සි
අණදෙන නිලධාරී

1991 වසරේ ජුනි මස 05 දින ආරම්භ කර වසර 28 ක අභිමානය සමරනු ලබන 4 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය මේ වන විට ආසේමු (වන්නි) බලප්‍රදේශයේ අණ හා පාලනයට අවශ්‍ය සන්නිවේදන සේවාව සැපයීමේ රාජකාරිය නොපිරිහෙලා ඉටුකරනු ලබයි. 4 වන රෙජිමේන්තුවට සංඥා සම්බන්ධතා වගකීම පැවරී ඇති සියළු මූලස්ථානයන් සහ ආයතනනයන්හී සංඥා සම්බන්ධතා අවශ්‍යතාවයන් නොපිරිහෙලා මෙම ඒකකය වෙතින් ඉටුකරනු ලබයි. ඒකකයේ රාජකාරී කිරීමේදි ප්‍රමුඛතාවය සංඥා සම්බන්ධතාවය වන අතර, පාලන හා ක්‍රිඩා කටයුතු සදහා සක්‍රීය දායකත්වයක් සපයනු ලබයි.

ඒකකයේ කාලීන අවශ්‍යතාවයක් වූ සාමුහික බලඇණි පුහුණුවීම් කටයුතු සාර්ථකව 2018 වසරේදී සිදුකරනු ලැබු අතර, ප්‍රදේශයේ පැවති සංඥා ක්ෂේත්‍ර පරීක්ෂාවන් සදහාද, "දියකාවා" අභ්‍යාසය ඇතුළු ක්ෂේත්‍ර පුහුණු කටයුතු හා බලඇණි පුහුණු කටයුතු සදහාද ඒකකය වෙතින් සංඥා සම්බන්ධතාවය නොමදව සපයන ලදී.





මෙම ඒකක බලඇණි පුහුණුවීම හී අවසාන දේශණය මේජර් ජෙනරාල් එන්එම් හෙට්ටිආරච්චි වීඑස්වී යුඑස්පි පීඑස්සී එච්ඩීඑම්සි විසින් සිදුකරන ලද අවස්ථාව





සංඥා බලකාධිපති ධූරය හෙබවූ මේජර් ජෙනරාල් බීඑච්එම්ජ් විජේසිංහ යුඑස්පී එන්ඩීයු පීඑස්සී මෙම ඒකකයෙහි 2019.04.22 වන දින ධූරයෙන් සමුගැනීමට පෙර සිදුකල සංචාරය





මෙම ඒකක 28 වන සංවත්සරය වෙනුවෙන් අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් පීපීසී පෙරේරා පීඑස්සී වෙත පිරිනමන ලද සම්මාන මුරය හා සම්මාන පෙළපාලිය





මෙම ඒකක 28 වන සංවත්සරය වෙනුවෙන් මහා සංඝරත්නය දොලොස් නමක් ඒකක පරිශ්‍රය වෙත වැඩමවා සර්ව රාත්‍රික පිරිත් සජ්ජායනාවක් කර පසු දින හීල් දානය පිළිගැන්වූ අවස්ථාව





බලඇණි පුහුණුවීම් අතරතුර





සංඥා බලකා සාමාජිකයින්ගේ ක්‍රීඩා හැකියාවන් වර්ධනය කිරීම හා ඔවුන් ජයග්‍රාහී මාවතකට යොමුකිරීමේ අරමුණින් මෙම ඒකකය වෙත මුයිතායි, ක්‍රිකට්, පිහිණුම්, කරාතේ හා මළල ක්‍රීඩා යන ක්‍රීඩා ඉසව් මෙම ඒකකය වෙතින් සංවිධානය කිරීම

# 5 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය



**ලුතිතන් කර්නල්
එච්එන් චන්ද්‍රසේකර
අණදෙන නිලධාරී**

5 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය 2014 දෙසැම්බර් මස 15 දින ආසේමු (බටහිර) බලප්‍රදේශයේ සංඥා රාජකාරීන් ඉටුකිරීමේ වගකීම භාරගත් අතර, ඒ අනුව ශ්‍රී ලංකාවේ වැඩිම භූමි ප්‍රමාණයක් ආවරණය කරමින් දිස්ත්‍රික්ක 09 ක් සඳහා මෙම ඒකක සෙනින් සංඥා රාජකාරීන් සඳහා යොදවා සන්නිවේදන කටයුතු ඉතා සාර්ථකව ඉටුකරමින් පවති.

මෙම ඒකකයේ ප්‍රධානතම වගකීම වනුයේ ආසේමු (බටහිර) බලප්‍රදේශයේ සංඥා රාජකාරීන් නිසිඅයුරු ඉටුකිරීමයි. ඒ අනුව බලප්‍රදේශයේ පැවැත්වෙන සෑම රාජ්‍ය හා යුද්ධ හමුදා උත්සවයන් සඳහා අවශ්‍ය ජන ඇමතුම් සේවාව මෙම ඒකකය විසින් සපයනු ලබන අතර බලප්‍රදේශයේ සියළුම දුරකථන මාර්ග නඩත්තුව මෙන්ම හදිසි ආපදා තත්වයන් සහ වෙනත් අවශ්‍යතාවයන් මත අවශ්‍ය ස්ථාන වෙත ගුවන් විදුලි යන්ත්‍ර ලබාදීම හා ක්‍රියාකරුවන් යෙදවීමද සිදුකරනු ලබයි.

මෑත කාලයේ රට තුල පැවැති හදිසි ආපදා තත්වයන්හිදී ඒ සඳහා යොදවන ලද භට පිරිස් වෙත සංඥා සම්බන්ධතාවය ලබාදීමෙන් අදාල සහන කටයුතු සම්බන්ධීකරණය සඳහා රාජ්‍ය ආයතනයන් වෙතද සංඥා සම්බන්ධතාවය සැපයීම වෙනුවෙන් මෙම ඒකකය විසින් ඉතාමත් වැදගත් කාර්ය භාර්යක් ඉටුකරන ලදි. එමෙන්ම හදිසි ආපදා තත්වයන් වලදී ආපදා කළමණාකරන මධ්‍යස්ථානය වෙත මෙම ඒකකයේ නිලධාරීන් සහ සෙසුනිලයින් සහභාගි කරවා හදිසි ඇමතුම් අංශයේ දුරකථන ක්‍රියාකරුවන් ලෙස රාජකාරි යොදවා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය සංඥා සම්බන්ධතාවය සපයන ලදි. තවද ආසේමු (බටහිර) වෙතින් ස්ථාපිත හදිසි ආපදා කළමනාකරණ ක්‍රියාන්විත මැදිරි වෙත අවශ්‍ය සංඥා සම්බන්ධතාවය හා ගුවන් විදුලි යන්ත්‍ර ක්‍රියාකරුවන් ලබාදීම ද මෙම ඒකකය වෙතින් සිදුකරන ලදි.

ඒකකය වෙත පැවරී ඇති මූලික කාර්ය වූ සංඥා සම්බන්ධතාවයන් ලබාදීමට පරිභාහිරව 2019 අප්‍රේල් මස 21 වන දින එල්ල වූ ත්‍රස්ථ ප්‍රහාරය සමගින් රට තුල ඇතිවූ හදිසි තත්වය හේතුකොට ගෙන සිවිල් ජනතාවගේ සිත්තුල හටගත් භයංකාර මානසික ආකල්ප වියැකීම සඳහා යුද්ධ හමුදා මූලස්ථානයේ උපදෙස් පරිදි බලප්‍රදේශයේ රෝහල්, ආගමික ස්ථාන සහ පාසැල් වෙත ආරක්ෂාව සපයමින් බලප්‍රදේශයේ ආරක්ෂාව නිසි පරිදි තහවුරු කරගනිමින් යුද්ධ හමුදාවේ ප්‍රතිරූපය ඉතා ඉහල තත්වයකට ගෙන එමට සෘජු දායකත්වයක් ලබාදීමට හැකිවී ඇත. එම කාර්යය භාරයේදී ඒකක අණදෙන නිලධාරී ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානය යටතේ කොට්ඨාශ අංක 10 කොස්ගම කොට්ඨාශ භාර නිලධාරී අණදෙන ලෙස රාජකාරීන් සිදු කරන ලදි.

ගාලු මුවදොර පිටියේදී 2019.02.04 දින පැවැති ජාතික නිදහස් සැමරුම් උත්සවයට හා 2019.05.19 දින බත්තරමුල්ලේ රණවිරු ස්මාරකය අභියසදී පැවැති රණවිරු සැමරුම් උත්සවයට අවශ්‍යකරන ලද සියළුම සංඥා සම්බන්ධතාවයන් මෙම ඒකකය වෙතින් ලබාදෙමින් එම කාර්යයන් සාර්ථකව ඉටුකර ගැනිමට මගගු දායකත්වය ලබාදෙන ලදි.

ඒකකයේ අණදෙන නිලධාරීගේ පූර්ණ මගපෙන්වීම යටතේ සියළුම නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ නොමද කැපකිරීම සහ නොපසුබට උත්සහය මත හා සංඥා බලකාධිපති සහ ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බලසේනාධිපති උපදෙස් පරිදි නිසි අයුරින් රාජකාරීන් ඉටු කරමින් බලප්‍රදේශයේ සංඥා සම්බන්ධතාවයන් පවත්වා ගැනිමටත් ආරක්ෂාව සඳහා භටපිරිස් යෙදවීමට කටයුතු කරමින් මෙම ඒකකය ප්‍රදේශයේ සිවිල් ජනතාවගේ හා උසස් මූලස්ථානයන්ගේ නිරන්තර පැසසුමට ලක්ව ඇත.





2019.01.02 වන දින 5 ශ්‍රීලංසංබ ඒකකයේ 25 වන සංවත්සරය වෙනුවෙන් අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එච්එන් චන්ද්‍රසේකර වෙත ලබා දුන් සම්මාන මුරය සහ සම්මාන පෙළපාලියේ විශේෂ අවස්ථා





2019.01.22 වන දින සංඥා බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ජීඑ්කේ තිලකරත්න පීඑස්සී මෙම ඒකක සංචාරය







5 ශ්‍රීලංසංබ ඒකකය මෙනේරිගම කඳවුරේ ස්ථානගත වීමෙන් පසු ඉදිකරනු ලබන නිලධාරී නිවස්නයේ ඡායාරූප කිහිපයක්




5 ශ්‍රීලංසංබ ඒකකයට අයත් යුද්ධ හමුදා රගර් සංචිතය යටතේ ක්‍රීඩා කරන සෙ/280496 කෝප්‍රල් ප්‍රභාත් කුමාර ටීපීඑස් ශ්‍රී ලංකාව නියෝජනය කරමින් තායිලන්තයේදි සහ මැලේසියාවේදි 2019 වසරේ පැවති තරගවලට සහභාගී වු අවස්ථාවක්



5 ශ්‍රීලංසංබ ඒකකයේ 22 වන රෙජිමේන්තු සැරයන් මේජර් වන බනි 1 එච්එම්ආර්එම් පියසේන යූඑස්පී යන බලලත් නිලධාරී හට විශ්‍රාම යාමට පෙර පිරිනමන ලද සම්මාන පෙළපාලිය

# 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

මව් දෙරණෙහි වසර 30 කට අධික කාලසීමාවක් තුල පැවති යුධමය වාතාවරණයෙන් පසු උදාවී ඇති නව ආශ්චර්යය මධ්‍යයේ 22 වන වියට පා තැබූ මෙම ඒකකය සංඥා බලකායේ 2 වන ආධාරක බලඇණිය ලෙස 1997.01.10 වන දින ආරම්භ කරනු ලැබූ 6 වන සංඥා රෙජිමේන්තුව 2014.06.16 වන දින ආධාරක බලඇණි රාජකාරිවලින් මිදී තොරතුරු තාක්‍ෂණ රාජකාරීන් වෙත අනුවර්ථනය වී මේ වන විට එම රාජකාරීන් මනාව ඉටු කරමින් සිටී.



**ලුතිනන් කර්නල්**
**එම්ජේකේ ජයවර්ධන පීඑස්සී**
**අණදෙන නිලධාරී**

වත්මන් රාජකාරීන් යටතේ මෙම ඒකකය ආසේමු (යාපනය) බලප්‍රදේශයේ යාපනය නගර මධ්‍යයේ අභිනවයෙන් ඉදිකරන ලද කඳවුරු භූමියක ස්ථානගතව ඇති අතර, මෙම ඒකක අණදෙන නිලධාරී වන ලුතිනන් කර්නල් එම්ජේකේ ජයවර්ධන පීඑස්සී අණදීම යටතේ ආසේමු (යාපනය), ආසේමු (වන්නි), ආසේමු (කිලිනොච්චි) හා ආසේමු (මුලතිව්) යන ආරක්‍ෂක සේනා මූලස්ථානයන්හි තොරතුරු තාක්‍ෂණ රාජකාරී ආවරණය කරමින්ද උසස් මූලස්ථානයන් වෙතින් පැවරෙන රාජකාරීන් හා වගකීම් ද ඉතා උසස් අන්දමින් ඉටුකරමින් යාපනය ආශ්‍රිතව වෙසෙන සිවිල් වැසියන්ගේ ද නොමඳ ප්‍රසාදයට ලක් වෙමින් රාජකාරී ඉටුකරනු ලබයි.

එමෙන්ම ඒකක සෙබළුන්ගේ වෘත්තීය නිපුණතාවය වර්ධනය කිරීම සඳහා සහ නිල උසස් කිරීම් සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරාලීම වෙනුවෙන් වෘත්තීය පරීක්‍ෂණ සහ පාඨමාලාවන් ඒකකය තුලදීම පවත්වනු ලැබූ අතර එමගින් ඔවුන්ගේ වෘත්තීය දැනුම වැඩිදියුණු කිරීමටත් ඉදිරි හමුදා දිවිය සාර්ථක කර ගැනීමටත් කටයුතු උදා කරදෙන ලදි.

එමෙන්ම මෙම ඒකකය මගින් රාජකාරී ආවරණය කරනු ලබන බලප්‍රදේශයන්හි වෙනත් ඒකකවල සෙනීන් සඳහා මූලික පරිගණක පාඨමාලාවන් පවත්වා ඔවුන්ගේ තොරතුරු තාක්‍ෂණ දැනුම වර්ධනය කිරීමටද කටයුතු කල අතර, රණවිරු තොරතුරු තාක්‍ෂණ පුහුණු ආයතනය කොකාවිල් සහ අනුරාධපුරය මගින් යුද්ධ හමුදා සාමාජිකයින්ට මෙන්ම සිවිල් අයවළුන් සඳහාද පරිඝණක පාඨමාලාවන් පවත්වා ඔවුන්ගේ තොරතුරු තාක්‍ෂණ දැනුම වර්ධනය කරමින් සිටී.

තවද, මෙම ඒකක නිලධාරී හා සෙසුනිලයින්ගේ ක්‍රිඩා කුසලතාවයන්ද මේ වන විට උසස් මට්ටමක පවතින අතර, 2018 වර්ෂයේ අන්තර් සංඥා ඒකක කබඩි තරඟාවලියේදී ප්‍රථම ස්ථානයද, 2018 සංඥා රෙජිමේන්තු අන්තර් ඒකක වෙඩි තැබීමේ තරඟාවලියේ සිව්වන ස්ථානයද හිමි කරගත් අතර, අනෙකුත් සංඥා ඒකක තරඟවලදී උසස් දක්‍ෂතා දක්වන ලදි.

මෙම ඒකකය තොරතුරු තාක්‍ෂණ ඒකකයක් වශයෙන් රාජකාරී ආරම්භ කිරීමෙන් පසු එම රාජකාරී ඉටුකිරීමේ පහසුව සඳහා ඒකකය තුල ස්ථාපිත කර ඇති පරිගණක වැඩපොල තුලින් සහ කොකාවිල් මූලික පරිඝණක වැඩපොල මගින් මෙම ඒකක බළප්‍රදේශ තුළ පරිඝණක අළුත්වැඩියා කිරීම සහ පරිඝණක ජාල කටයුතු විධිමත් හා ක්‍රමවත් අයුරින් සිදු කරනු ලබයි.

දැනට ඒකකය සංඥා බලකා පවුලට එක්වී වසර 21 කට වැඩි කාලයක් ඉක්මවා ගොස් ඇති අතර, එම කාලපරාසය තුල ඒකකයේ සාර්ථකත්වයට අණදෙන නිලධාරීවරුන් 16 දෙනකු නායකත්වය ලබා දී ඇති අතර, වත්මන් අණදෙන නිලධාරීගේ නායකත්වය හා මගපෙන්වීම යටතේ ඒකකයේ පාලන කටයුතු හා සෙබළුන්ගේ සියළුම සුභසාධක කටයුතු ඉතා උසස් මට්ටමින් ඉටු කිරීමට හැකියාව ලැබී ඇත. එබැවින් එය ඒකකයේ ඉදිරි ගමන් මගෙහි සාර්ථකත්වයට ඉමහත් පිටුවහලකි.

21 වන කඩඉම පසුකරමින් 22 වන වියට සාර්ථකව පියමනින 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය ආරම්භයේ සිට මේ දක්වා පැමිණි ගමන් මගෙහි සාර්ථකත්වයට දායක වෙමින් දිවි හිමියෙන් හා කාය දානයෙන් රාජකාරී කල සියළුම නිලධාරී/සෙසුනිලයින් හටද, දැනට රාජකාරියේ යෙදී සිටින සියළුම නිලධාරී/සෙසුනිලයින්ද ඉතාමත් භක්ති ප්‍රණාමයෙන් යුතුව සිහිපත් කරමින් මෙවන් වූ මෙහෙවරක් ඉටුකල 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකා නාමය සංඥා බලකාය තුල පමණක් නොව සමස්ථ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල දීප්තිමත් ඒකකයක් ලෙස ඉදිරිගමන් මග සාර්ථක කරගෙන ඇත.





**ප්‍රධාන සංඥා නිලධාරී මේජර ජෙනරාල් එන්එම් හෙට්ටිආරච්චි විඑස්වී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී මෙම ඒකක සංචාරය**





**ඒකකය තුල ලේ දන් දීමේ වැඩසටහනක් පැවැත්වූ අවස්ථාව**



**වීඩියෝ සංස්කරණ පාඨමාලාවේ ආරම්භක දේශනය පවත්වන අවස්ථාව**

# ජ්‍යේෂ්ඨ නිලධාරීන් සේවයෙන් විශ්‍රාම ගැනීම



## බ්‍රිගේඩියර් එම්ටී වෛද්‍යරත්න (විශ්‍රාමික)

1985 ජුනි 06 වන දින කෙඩෙට් නිලධාරියකු ලෙස යුද්ධ හමුදාවට බැදී වසර 34 ක අභිමාණනිය සේවා කාලය නිම කරමින් 2019 පෙබරවාරි 29 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙන් විශ්‍රාම යන විට සංඥා බලසේනාධිපති ලෙස කටයුතු කරන ලදි. මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී යුධ හමුදා සේවයේදී හොබවන ලද ප්‍රධාන තනතුරු,

- ▶ සංඥා පුහුණු පාසල - සේනාවිධායක
- ▶ මාණ්ඩලික නිලධාරී 1(පරිපාලන) - 52 වන සේනාංකය
- ▶ අණදෙන නිලධාරී - 5 ශ්‍රීලංසංබ
- ▶ අණදෙන නිලධාරී - 1 ශ්‍රීලංසංබ
- ▶ කර්නල් පුහුණු - පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලය
- ▶ කර්නල් ප්‍රධාන මාණ්ඩලික - 53 සේනාංකය
- ▶ කර්නල් සම්බණ්ධීකරණ - ප්‍රධාන සංඥා නිලධාරී මුලස්ථානය
- ▶ මධ්‍යස්ථාන සේනාවිධායක - සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය



## බ්‍රිගේඩියර් ඩබ්ජී ඩයස් (විශ්‍රාමික)

1986 ජූලි 11 වන දින යුද්ධ හමුදාවට බැදී වසර 33 ක අභිමාණනිය සේවා කාලය නිම කරමින් 2019 පෙබරවාරි 17 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙන් විශ්‍රාම යන විට කර්නල් උපකරණ මාස්ටර් ජෙනරාල් ලෙස කටයුතු කරන ලදි. මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී යුධ හමුදා සේවයේදී හොබවන ලද ප්‍රධාන තනතුරු,

- ▶ අණදෙන නිලධාරී - 4 ශ්‍රීලංසංබ
- ▶ අණදෙන නිලධාරී - 5 ශ්‍රීලංසංබ
- ▶ කර්නල් (පරිපාලන) - හකාසඅණසක
- ▶ කර්නල් (ඉනජේ) - උතුර/ මධ්‍යම
- ▶ කර්නල් ප්‍රධාන මාණ්ඩලික - ආසේමු (මධ්‍යම) හා 51 සේනාංකය
- ▶ කර්නල් - උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව

# 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

වසර 30 කට අධික කාලසීමාවක් ශ්‍රී ලංකා මාතෘ භූමිය වෙලාගෙන තිබූ යුධමය වතාවරණය උග්‍ර වෙමින් පැවති අවදියක, එනම් 2008.02.08 වන දින පනාගොඩ සංඥා රෙජිමේන්තු මූලස්ථානයේදී නවතමයෙන් ස්ථාපිත කරන ලද 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය ආධාරක බලඇණියක් වශයෙන් වෘත්තීය සංඥා රාජකාරීන්ගෙන් ඔබ්බට ගොස් වන්නි මානුෂීය මෙහෙයුම තුල ඉතාමත් දක්ෂ ලෙස තම සක්‍රීය දායකත්වය ලබාදෙමින් සංඥා රෙජිමේන්තුවට මහත් කීර්තියක් ගෙනදුන් බව නිහතමානීව සිහිපත් කරන්නේ හදපිරි සතුටිනි.



ලුතිනන් කර්නල්
එච්එම් හමීම් යූඑස්පී
අණදෙන නිලධාරී

මෙම ඒකකය ආධාරක බලඇණී රාජකාරී වලින් මිදී 2013.03.10 දින තම වෘත්තීය සංඥා රාජකාරීන් ආරම්භකර ආරක්ෂක සේනා මූලස්ථානය මධ්‍යම යටතේ දියතලාව ප්‍රදේශයේ ඉතා මනරම් භූමි ප්‍රදේශයක් වන මැණික්කන්ද ප්‍රදේශයේ ස්ථානගතව ලුතිතන් කර්නල් එම්ආර් හමීම් යූඑස්පී යන අණදීම යටතේ දිවයිනේ වැදගත් දිස්ත්‍රික්ක රාශියක් ආවරණය වන සේ තම වෘත්තිය රාජකාරී මනාව ඉටුකරමින් සිටින අතර, උසස් මූලස්ථානයන් වෙතින් පැවරෙන රාජකාරීන් හා වගකීම්ද නිසි ලෙස ඉටුකරමින් දියතලාව ප්‍රදේශයේ වෙසෙන සිවිල් වැසියන්ගේද නොමද ප්‍රසාදයට ලක් වෙමින් සංඥා බලකායේ ගෞරවය ආරක්ෂා කරමින් තම රාජකාරීන් නිසි ලෙස ඉටුකරනු ලබයි.

තම වෘත්තීය රාජකාරීන් ඉතා උසස් අන්දමින් සිදුකරමින් පසුගිය වසර තුල අප ඒකකයේ සිදු වූ විශේෂ සිදුවීම් මෙසේ අතීතාවර්ජනය කිරීමේදී ඉතා කෙටි කාලසීමාවක් තුලදී ඒකකයේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අනගිභවනිය ගොඩනැගිලි හා ඒකක නිලධාරි/සෙසුනිලයින්ගේ අභිවෘද්ධිය උදෙසා සිදුකරන ලද ක්‍රියාකාරකම් තුලින් සංඥා ඒකක අතුරින් ප්‍රමුඛස්ථානයක් ලබාගෙන මෙම ඒකකයේ රාජකාරී කරනු ලබන හා රාජකාරී කරන ලද නිලධාරි/සෙසුනිලයින්ගේ අප්‍රතිහත ධෛර්‍ය හා කැපවීම තුලින් සංඥා බලකායේ විශිෂ්ඨ ඒකක අභිබවමින් 2018 වර්ෂයේදි සංඥා බලකායේ විශිෂ්ඨතම ඒකකය ලෙස පිදුම් ලබන ලදි.





2018.12.14 වන දින ප්‍රධාන සංඥා නිලධාරී මේජර් ජෙනරාල් එන්එම් හෙට්ටිආරච්චි වීඑස්වී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී මෙම ඒකක සංචාරය සහ නවතමයෙන් ඉදිකරන ලද ශ්‍රවණාගාරය සහ ගෘහස්ථ ක්‍රීඩාගාරය විවෘත කිරීම හා එතුමන් වෙත සමරු ඵලකයක් පිළිගැන්වීම





2018.12.16 වන දින යුධ සේවා ලේකම්/ සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් බීඑච්එම්ජ් විජේසිංහ යූඑස්පී එන්ඩීයු පීඑස්සී මෙම ඒකක සංචාරය සහ නවතමයෙන් ඉදිකරන ලද රෙජිමේන්තු මූලස්ථාන කාර්යාලය විවෘත කිරීම





7 ශ්‍රීලංසංබ ඒකකයේ ඒකක 11 වන සංවත්සරය සමගාමීව ඒකකයේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එච්ඩීජේපී වීරතුංග වෙත සම්මාන පෙළපාලියක් පිරිනැමීම හා විශේෂ අවස්ථාවන්




2019.02.09 වන දින සංඥා බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ජීඑකේ තිලකරත්න පීඑස්සී මෙම ඒකක සංචාරය



2019.02.21 වන දින ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරල් ඩබ්ආර්පී ද සිල්වා එන්ඩීයු අයිජී මෙම ඒකක සංචාරය



2019.02.22 ලුතිනන් කර්නල් එච්ඩීජේපී වීරතුංග අණදෙන නිලධාරී තනතුර අත්හැරීම වෙනුවෙන් පිරිනමන ලද සම්මාන පෙළපාලිය



2019.02.23 වන දින නව අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එච්එම් හමීම් යුඑස්පී සුභ මොහොතින් වැඩ භාරගත් මොහොත



2019.06.24 වන දින නව සංඥා බලසේනාධිපති කර්නල් ඩබ්එල් ප්‍රේමසිරි යුඑස්පී මෙම ඒකක සංචාරය



අන්තර් සංඥා ඒකක මළල ක්‍රීඩා තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයා වූ සෙ/281878 කෝප්‍රල් සෙනෙවිරත්න ඩබ්එම්එල් හට හිමි සම්මානය ලබාදීම හා එහි විශේෂ අවස්ථාවන්

# 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය



ලුතිනන් කර්නල් එම්ඒකේපී පෙරේරා ආර්එස්පී පීඑස්සී අණදෙන නිලධාරී

මානුෂීය මෙහෙයුමෙහි තීරණාත්මක සන්ධිස්ථානයන්හි පෙරමුණ ගනිමින් ආධාරක බලඇණී ලෙස සංඥා බලකායේ රෙජිමේන්තු කිහිපයක්ම පාබල බලවේගයනට උත්ප්‍රේරණයන් සපයන කලෙක සංඥා සම්බන්ධතාවයන්හි අඛණ්ඩ පැවැත්ම උදෙසා සංඥා රෙජිමේන්තුවක අවශ්‍යතාවය සපුරාලමින් වර්ෂ 2008 ක් වු ජුලි මස 15 වන දින පනාගොඩ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය තුල බිහිවු 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය සිය අභිමානවත් 11 වන සංවත්සරය සපුරාලමින් වඩාත් ගුණාත්මක වු වෘත්තිය හමුදාවක භූමිකාව තහවුරු කර ගැනීම සඳහා සාර්ථක ගමන් මගක නියැලෙමින් සිටියි.

ආරක්ෂක සේනා මුලස්ථානය කිලිනොච්චි බල ප්‍රදේශය ආවරණය වන පරිදි සංඥා සම්බන්ධතාවයන් සැපයීමේ භාරදූර කාර්‍යයෙහි නියැලී සිටින 9 වන සංඥා රෙජිමේන්තුව පසුගිය වසරක කාලසීමාව තුල කාර්ය භාරය ඉටුකිරීම සහ පුහුණු කටයුතු, පරිපාලන හා ක්‍රීඩා කටයුතු මගින් සාර්ථක වර්ධනයක් පිළිඹිබු ඇත.




2019.01.20 දින සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් බීඑච්එම්ජී විජේසිංහ යුඑස්පී එන්ඩියු පීඑස්සී මෙම ඒකක සංචාරය



2018.12.09 දින සංඥා බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ජීඒකේ තිලකරත්න යුඑස්පී එන්ඩීයු පීඑස්සී මෙම ඒකක සංචාරය



2019.01.25 වන දින නව සංඥා බලසේනාධිපති කර්නල් ඩබ්එල් ප්‍රේමසිරි යුඑස්පී මෙම ඒකක සංචාරය




9 ශ්‍රීලංසංබ ඒකකයේ 11 වන සංවත්සරයට සමගාමීව 2019.07.15 දින අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් එම්ජ්කේජී පෙරේරා ආර්එස්පී පීඑස්සී වෙත සම්මාන පෙළපාලියක් ලබා දීම හා විශේෂ අවස්ථාවන්



2019 නව නිපැයුම් ප්‍රදර්ශණය සඳහා ඉදිරිපත් කරන ලද සිවිලිං ෆෑන් සඳහා කොයිල් එතීමේ යන්ත්‍රය පරීක්ෂා කල අවස්ථාව හා ඒ සඳහා ප්‍රථම ස්ථානය දිනාගැනීම



2019.04.23 වන දින 9 වන ශ්‍රී ලංකා සංඥා බලකාය මගින් සංවිධානය කරන ලද මල්ලවපොර තරඟාවලියේ ශූරතාව දිනා ගත් අවස්ථාව




2019.06.12 වන දින පවත්වන ලද අන්තර් ඒකක එල්ලේ තරඟාවලියේ ශූරතාව දිනා ගත් අවස්ථාව හා සමූහ ඡායාරූපයකට පෙනී සිටි අවස්ථාව




2019.07.22 සහ 23 දිනයන්හි පවත්වන ලද අන්තර් සංඥා ඒකක වුෂු තරඟාවලියෙන් ශූරතාවය දිනා ගත් අවස්ථාව හා සමූහ ඡායාරූපයකට පෙනී සිටි අවස්ථාව

# 10 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය (සන්නිවේදන තාක්ෂණ)

1 වන සංඥා රෙජිමේන්තුව ස්ථාපිත වීමෙන් අනතුරුව යුද්ධ හමුදාව තුල වූ ඉලෙක්ට්‍රෝනික හා ගුවන් විදුලි/ දුරකථන උපකරණ අළුත්වැඩියා කටයුතු ඉටු කිරීම සඳහා සංඥා මූලික වැඩපොල බණ්ඩය සංඥා බලකායට එක් වූ අතර, එය 1 ශ්‍රිලංසංබ, 2 වන බළඝණය යටතේ එම් බණ්ඩය ලෙස ස්ථාපනය කරන ලදී. යුධ හමුදා සංවිධානයෙහි ව්‍යාප්තිය හා සමගාමීව සංඥා බලකායද ව්‍යාප්ත වූ අතර, යුද්ධ හමුදාව වෙත ලබා ගන්නා ලද නව තාක්ෂණික ගුවන් විදුලි උපකරණ, දුරකථන හුවමාරු හා දුරකථන උපකරණ, රේඩියෝ රිලේ උපකරණ හා වෙනත් ඉලෙක්ට්‍රෝනික උපකරණ පිළිබඳ අළුත්වැඩියා/ නඩත්තු කටයුතු පහසු කරමින් බණ්ඩයක් වශයෙන් වූ සංඥා මූලික වැඩපොල, සංඥා මූලික වැඩපොල බළඝණයක් ලෙස ව්‍යාප්ත විය. 1 වන ශ්‍රිලංසංබ යටතේ සහ පසුකාලීනව සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය යටතේ පහත බණ්ඩයන්ගෙන් සමන්විතව නව මුහුණුවරකින් සිය කාර්යයන් ඉටු කරන ලදි.



**ලුතිනන් කර්නල්**
**එම්ආර්එම්ආර්එල්බී**
**මීගස්තැන්න යූඑස්පී**
**අණදෙන නිලධාරී**

අ. ගබඩා බණ්ඩය

ආ. එම් 1 බණ්ඩය සිට එම් 9 බණ්ඩය දක්වා

වර්ෂ 1991 අගෝස්තු මස 01 දින සිට වර්ෂ 2000 අගොස්තු 13 දින දක්වා සංඥා මූලික වැඩපොල බළඝණය බළඝණ නිලධාරී අණදෙන්නන් 08 දෙනෙකු යටතේ සිය කාර්මික වගකීම් යුද්ධ හමුදාවට ඉටු කල අතර, මෙම වකවානුව තුල ශ්‍රී ලංකාව තුල පැවති ක්‍රියාන්විතයන්හීදී තාක්ෂණික හා කාර්මික රාජකාරී අවශ්‍යතා නොපිරිහෙලා ඉටු කරන ලදි. වර්ෂ 2000 අගෝස්තු මස 13 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නිලධාරී 24 ක් හා සෙසුනිලයන් 513 කින් සමන්විත වූ ව්‍යුහයකින් යුක්තව 28/2001 හා 2001 අගෝස්තු මස 21 දින දරණ හමුදා චර්යා නියෝග මගින් සංඥා මූලික වැඩපොල ස්වාධීන ඒකකයක් ලෙස සංඥා බලකායට එක්විය. මූලස්ථානය, බළඝණ 05 කින් හා ක්ෂේත්‍ර සංඥා වැඩපොල 05 කින් හා මධ්‍යම සංඥා වැඩපොලකින් සමන්විත වන අතර එම සංයුතිය ඇතිව 2015.04.24 දින සංඥා මූලික වැඩපොල නැවත ප්‍රතිස්ථාපනය වෙමින් 10 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා රෙජිමේන්තුවේ නව ඒකකයක් වශයෙන් පිහිටුවන ලදි.

පාකිස්ථානයේ පවත්වන්නට යෙදුණු Technical Training Course for Sri Lanka Army Technicians at the National Radio and Telecommunication Corporation (NRTC) Pakistan පුහුණු වැඩමුළුව සඳහා 2019.02.11 දින සිට 2019.02.17 දින දක්වා මෙම ඒකකයට අයත් පහත නම් සඳහන් අයවළුන් සහභාගී වන ලදි.

නි/68777 මේජර් ඩීඑම්ඒසීඩීපී අබේවික්‍රම

සෙ/278459 බනි 11 සේනාරත්න එම්

සෙ/279919 මා/සැරයන් නවරත්න ඩබ්එස්අයි

සෙ/279461 සැරයන් එදිරිසිංහ ඊඑස්කේ

සෙ/279900 සැරයන් අතපත්තු ඒඑම්එස්කේ

සෙ/281987 ලා/කෝප්‍රල් අනුර කුමාර වයිපීඑස්ආර්

10 ශ්‍රිලංසංබ ඒකකයේ දෙවන අණදෙන නිලධාරී ලෙස කටයුතු කල මේජර් එච්එම්බීඑම්බී හේරත් තනතුරෙන් නික්මයාමෙන් අනතුරුව නව දෙවන අණදෙන නිලධාරී ලෙස මේජර් එන්ඩබ්පීජීජී ඉන්ද්‍රජිත් නිලධාරී 2019.04.10 දින වැඩ භාර ගන්නා ලදී.

71 වන නිදහස් දින උත්සවයට සමගාමීව ගාලු මුවදොර පැවති පෙළපාලිය සඳහා ඇවැසි ජන ඇමතුම් සේවාව සහ සංඥා රථ පෙළපාලි සංවිධානය සඳහා සක්‍රියව දායකත්වය ලබාදෙන ලදි. ඒ සඳහා සියලුම ජන ඇමතුම් රාජකාරීන් මෙම ඒකකය වෙතින් සිදුකල අතර, පෙළපාලිය සඳහා ගුවන්විදුලි රැගත් පෙළපාලියද ඉතාමත් උසස් අන්දමින් සංවිධානය කර ප්‍රදර්ශනය කිරීමට හැකිවිය.

මෙම ඒකක කාර්මික නිලධාරීන් හා කාර්මික සෙසුනිලයන් විසින් පසුගිය වසරවලදී මෙන්ම මේ වසරේදිද ගුවන් විදුලි/ දුරකථන හුවමාරු ආදි සංඥා උපකරණ අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදුකර ඇති අතර, දියකාවා යුද අභ්‍යාසය/ ආරක්ෂක සමුළුව ආදි දෙස් විදෙස් ප්‍රභූවරුන් සහභාගීවන උත්සව හා වැඩසටහන් සඳහා ජන ඇමතුම් සේවාවන් ඉතා සාර්ථක අන්දමින් ලබාදෙන ලදි.

මෙම ඒකකයේ කාර්මික නිලධාරී/ සෙසුනිලයින් කාර්මික රාජකාරීන්ට අමතරව පසුගිය වසරේ මෙන්ම මෙම වසරේද අන්තර් සංඥා ඒකක ක්‍රීඩා කටයුතු හා වෙනත් ක්‍රීඩා කටයුතු වෙනුවෙන් සහභාගීවී ජයග්‍රහණ ලබා ගන්නා ලදි. එමෙන්ම 2019 වසර සඳහා අන්තර් ඒකක තරග වෙනුවෙන් බැඩ්මින්ටන්, වුෂු හා බාස්කට් බෝල් යන ක්‍රීඩා සංවිධානය කර පැවැත්වීමටද මෙම ඒකකය වෙත පැවරුණි. මේ සඳහා ක්‍රීඩා කණ්ඩායම් මෙම ඒකකය වෙත ගෙන්වා ඉතාමත් උසස් අන්දමින් අන්තර් ඒකක තරගාවලියන් පැවැත්වීම සඳහා සැලසුම් කර ඇත.





71 වන නිදහස් දින උත්සවයට සමගාමීව නිදහස් පෙළපාලිය සදහා 10 ශ්‍රීලංසංඛ ඒකකයේ නිලධාරීන් හා සෙසුනිලයන් සහභාගී වු අවස්ථාව



ඉන්දියානු යුද්ධ හමුදාපති විසින් ශ්‍රී ලංකාවේ සංචාරයේ දී ජනඇමතුම් රාජකාරි සදහා මෙම ඒකකය වෙතින් සහභාගි වු නිලධාරීන් හා සෙසුනිලයින් හමුවීම



ඉන්දු ශ්‍රී ලංකා මිත්‍ර ඒකාබද්ධ යුධ අභ්‍යාස සදහා ජන ඇමතුම් සේවාව ලබාදුන් අවස්ථාව





4 වන සංවත්සරයට සමගාමීව අවිස්සාවේල්ල ජයවිරු සෙවණ සමාධි ළමා නිවාසය වෙත දානය ලබා දීම හා ලේ දන්දීමේ වැඩසටහනක් පැවැත්වීම





නව නිපැයුම් ප්‍රදර්ශණයකදී මෙම ඒකකයට අයත් සෙ/279088 මා/සැරයන් සුජිත් කුමාර එච්එම් යන ජ්‍යෙකොනොනි විසින් ඉදිරිපත් කරනු ලැබු Inter Operateble Radio System නිර්මාණය ප්‍රථම ස්ථානය දිනාගත් අවස්ථාව

# 11 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

සංඥා බලකායට අයත් තොරතුරු තාක්ෂණ ඒකකය වශයෙන් යුද්ධ හමුදාවට අවශ්‍ය නවීන තොරතුරු තාක්ෂණ දැණුමෙන් සහ පහසුකම් වලින් සන්නද්ධ කිරීම ඒකකයේ අණදෙන නිලධාරීගේ සහ අනෙකුත් තොරතුරු තාක්ෂණ නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ ඒකායන අරමුණයි.



**ලුතිනන් කර්නල් ආර්සී විජේකෝන් යූඑස්පී පීඑස්සී අණදෙන නිලධාරී**

1980 දශකයේ මුල් භාගය තුලදී SINCLAIR පරිගණකය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල භාවිතය ආරම්භ වීමත් සමග තොරතුරු තාක්ෂණ හා දත්ත ක්‍රමවත් සැලසුම්කරණයකින් පරිගණකගත කිරීමේ අවශ්‍යතාවය තදින් දැනෙන්නට විය. ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා 1985 වසරේදී පරිගණක කමිටුව නමින් කමිටුවක් යුද්ධ හමුදා මුලස්ථාන පැරණි ගොඩනැගිල්ල තුල ස්ථාපනය කරනු ලැබු අතර, එහි කමිටු සභාපති ලෙස බ්‍රිගේඩියර් පීජීවීවී ඇලපාත යන ජ්‍යෂ්ඨ නිලධාරී පත්කරන ලදි.

1988 වර්ෂයේ ජුනි මස 01 වන දින පරිගණක කමිටු සභාපතිගේ සංකල්පයකට අනුව "ස්වයං දත්ත සැකසුම් සේවාව" මාණ්ඩලික නිලධාරී මේජර් එඑස් වරකාගොඩ ශ්‍රීලංසංබ ජ්‍යෂ්ඨ නිලධාරීගේ මෙහෙයවීම යටතේ යුද්ධ හමුදා මුලස්ථාන ගොඩනැගිල්ල තුල ස්ථාපනය කරන ලදි. එම වර්ෂයේ අගභාග යේදී "ස්වයංක්‍රීය දත්ත සැකසුම් ඒකකය" යුද්ධ හමුදාවේ නොයෙකුත් විෂයන් පරිගණක ගත කිරීමේ අභිලාශයෙන් පිහිටුවන ලදි.

වර්ෂ 2010 ක්වූ සැප්තැම්බර් මස 21 වන දින තොරතුරු තාක්ෂණ ඒකකය නැවත ප්‍රතිස්ථාපනය වෙමින් "11 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය" වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා රෙජිමේන්තුවේ නව ඒකකයක් වශයෙන් පිහිටුවන ලදි.

2018.09.21 වන දිනට යෙදී තිබු 8 වන සංවත්සර උත්සවය අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එම්ටීසී ද සිල්වා ජ්‍යෂ්ඨ නිලධාරීගේ මග පෙන්වීමෙන් විවිධ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරමින් ඉතා උත්කර්ශවත් අන්දමින් සමරන ලදි. එහිදී ඒකකයේ සියළුම නිලධාරීන්ගේ හා සෙසු නිලයින්ගේ සහභාගීත්වයෙන් අණදෙන නිලධාරී හට පිරිනමන ලද ආචාර පෙළපාළිය, සියළු දෙනාටම සෙත්පතා සිදුකල ආගමික වතාවත්, සියළු නිල භෝජන සංග්‍රහය සහ සුහද හමුව කැපී පෙනෙන වැඩසටහන් විය.





2018 නොවැම්බර් මස 07 වන දින 11 ශ්‍රීලංසංබ ඒකකයේ නව අණදෙන නිලධාරී ලෙස ලුතිනන් කර්නල් ආර්සී විජේකෝන් යූඑස්පී පීඑස්සී වෙත ලබා දුන් සම්මාන මුරය සහ රාජකාරී ආරම්භ කල අවස්ථාව



දැනුම වර්ධනය කිරීම සදහා නවතමයෙන් ඉදිකරන ලද පරිඝණක විද්‍යාගාරය යුධ හමුදාධිපතිගේ ප්‍රධානත්වයෙන් 2018 ඔක්තෝම්බර් මස 19 වන දින විවෘත කරන අවස්ථාව



11 ශ්‍රීලංසංබ ඒකකයේ නවතමයෙන් ඉදිකරන ලද පරිඝණක වැඩපල හා එහි රාජකාරී සිදුකරන අවස්ථාවන්





11 ශ්‍රී ලංසංබ ඒකකයේ නව අණදෙන නිලධාරී රාජකාරී ආරම්භ කිරීම වෙනුවෙන් සංඝයා රෙජිමේන්තු පරිශ්‍රයේ සිදු කරන ලද බෝධි පූජා පිංකමේ විශේෂ අවස්ථාවන්



11 ශ්‍රීලංසංබ ඒකකයේ සෙසුනිලයන්ගේ වාර්ෂික යුධ ශාරීරික අභ්‍යාස සිදුකිරීම හා එහි විශේෂ අවස්ථාවන්



11 ශ්‍රීලංසංබ ඒකකයේ නවවන සංවත්සරය වෙනුවෙන් අණදෙන නිලධාරී වෙත ලබා දුන් සම්මාන පෙළපාලිය





11 ශ්‍රීලංසංබ ඒකකයේ නවවන සංවත්සරයේ විශේෂ අවස්ථාවන්

# 12 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය (සයිබර් ආරක්ෂණ)



කර්නල්
කේසී ප්‍රතාපසිංහ
අණදෙන නිලධාරී

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, තාක්ෂණයේ දියුණුවත් සමගම නූතන සයිබර් අභියෝගවලට සාර්ථකව මුහුණ දීමේ පරමාර්ථය පෙරදැරි කොටගෙන පනාගොඩ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේ 12 වන සංඥා රෙජිමේන්තුව ස්ථාපනය කරන ලදි.

වත්මන් අණදෙන නිලධාරී වන කර්නල් කේසී ප්‍රතාපසිංහ නිසි නායකත්වය හා මඟපෙන්වීම යටතේ ඒකකයේ සියළුම අංශයන් හි ඉදිරි කටයුතු ඉතා උසස් අයුරින් ඉටු කිරීමේ හැකියාව ලැබී ඇත. මෙම ඒකකයේ දෙවන අණදෙන නිලධාරී වශයෙන් මේජර් යූඑල්සීඩී පෙරේරා පීඑස්සි රාජකාරි සිදු කරනු ලබයි. ඒකක රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් බනි I බීඩබ්එස්පි මඩවල කටයුතු කරන අතර, සරඹ උපදේශක වශයෙන් මා/සැරයන් ධර්මකුමාර ඩීජේ යන ජ්‍යෙකොනොනීන් විසින් රාජකාරී කටයුතු කරමින් සිටී.

මීට අමතරව මේජර් ටීඩීටී විජේසිංහ මුලස්ථාන බළඝණයට මෙන් ම පුහුණු හා තාක්ෂණික බළඝණයට ද, මේජර් ජේඑම්ඩී නුවන් සයිබර් ආරක්ෂණ බළඝණය මෙන් ම සයිබර් ප්‍රහාරාත්මක බළඝණයට ද, මේජර් පීජීපීඑම් පල්ලියගුරු හදිසි ප්‍රතිචාරාත්මක බළඝණයට ද, මේජර් වීඑන් ලියනපතිරණ සයිබර් ව්‍යෝහාරාත්මක බළඝණයට හා මේජර් සිඑස්කේ පතිරණ සයිබර් විගණන බළඝණයට ද අණදීම් සිදු කරනු ලබන අතර ඒ ඒ බළඝණයන්ට ආවේණික වූ විවිධ රාජකාරීන් ඉටු කරනු ලබයි.

ඒකක 2 වන සංවත්සරය 2017 ජනවාරි මස 25 වන දිනට යෙදී තිබුණු අතර, ඊට සමගාමීව ඒකක අභිමානය විදහා දක්වන්නාවූ අතිඋත්කර්ෂවත් වැඩසටහන් මාලාවක් මෙම ඒකක අණදෙන නිලධාරීගේ මඟපෙන්වීම යටතේ පවත්වන ලදි. ඒ අතුරින් නිලධාරීන් 14 දෙනෙකුගෙන් ද සෙසුනිලයින් 108 දෙනෙකුගෙන්ද සමන්විත වූ සම්මාන පෙළපාලියක් අණදෙන නිලධාරී වෙත පිරිනැමූ අතර ඒකකයට හා සියළු නිල දරුවන්ට සෙත්පතා බෝධි පූජා වැඩසටහනක් ද පැවැත්විණ. ඊට සමගාමීව ඒකක අණදෙන නිලධාරී ඇතුළු සියළුම නිලධාරී හා සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් සියළු නිල සුහද හමුවක් ද පැවැත්විණි.

තවද සයිබර් විගණන මූලික දැනුම ලබා දීමේ පරමාර්ථය ඇතිව වෙනත් ඒකකයන් හි රාජකාරි කරනු ලබන සංඥා සෙසුනිලයන් වෙත කෙටිකාලීන පාඨමාලා වැඩසටහන් මාලාවක් පසුගිය පෙබරවාරි මස පැවැත්විණි. මීට අමතරව ඒකකයේ රාජකාරි කරනු ලබන සියළු නිලයන්ගේ සුභසාධන කටයුතු පිළිබඳ සොයා බලා ක්‍රියා කිරීම තුළින් සෙබළුන්ගේ චිත්තධෛර්‍යය උසස් අන්දමින් පවත්වාගෙන යාමට පිටුවහලක් වී ඇති අතර, එමගින් ඔවුන් වෙත පැවරෙන රාජකාරීන් කැපවීමෙන් හා වගකීමෙන් මෙන්ම උනන්දුවෙන් ඉටුකිරීම මෙම ඒකකය ලබා ඇති සාර්ථකත්වයට බලපා ඇති ප්‍රධාන කරුණකි.

සංඥා බලකායේ නව සාමාජිකයෙකු වශයෙන් යුද්ධ හමුදාව සයිබර් ආරක්ෂණය අතින් ඉහළට ඔසවා තැබීමේ මෙහෙවරට උර දෙමින් නවීන පරිගණක තාක්ෂණික දැනුමෙන් දීප්තිමත් ඉදිරි ගමනක් යාම ඒකකයේ අණදෙන නිලධාරීතුමන් ඇතුළු සියළු නිලධාරීවරුන් හා සෙසුනිලයින්ගේ ඒකායන අරමුණයි.





12 ශ්‍රීලංසංබ (ස/ආ) ඒකකයේ දෙවන සංවත්සරය වෙනුවෙන් අණදෙන නිලධාරී වෙත පිරිනමන ලද සම්මාන මුරය සහ සම්මාන පෙළපාලියේ විශේෂ අවස්ථා





12 ශ්‍රීලංසංබ (ස/ආ) ඒකකයේ දෙවන සංවත්සරය වෙනුවෙන් අණදෙන නිලධාරී ඇතුළු සියළුම නිලධාරීන් සහ සෙසුනිලයින් සහභාගීත්වයෙන් සිදුකරන ලද බෝධිපූජා පිංකමේ විශේෂ අවස්ථාවන්





අලුත් අවුරුදු උත්සවය සදහා ඒකකය වෙත පැවරී තිබූ කාර්යයන් සිදුකරන අවස්ථාවන්




12 ශ්‍රීලංසංබ (ස/ආ) ඒකකයේ දෙවන සංවත්සරය වෙනුවෙන් අණදෙන නිලධාරී ඇතුළු සියළුම නිලධාරීන් සහ සෙසුනිලයින් සමූහ ඡායාරූපයකට පෙනිසිටි අවස්ථාව

# සංඥා පුහුණු පාසල



කර්නල් බීඅයි
අස්සලආරච්චි යූඑස්පී පීඑස්සී
සේනාවිධායක

පුහුණු පාසලක් වශයෙන් පාඨමාලාවන්ට හා අධ්‍යයන කටයුතු වලට මුල්තැන දෙමින් සංඥා බලකායට අයත් නිලධාරීන් හා සෙසුනිලයින් මෙන්ම යුද්ධ හමුදාවේ අනෙකුත් ඒකකයන්ට අයත් නිලධාරී/ සෙසුනිලයින්ගේ අභිවෘද්ධිය උදෙසා වාර්ෂික පුහුණු සැලැස්මට අනුකූලව මෙම පුහුණු පාසල වෙතින් නොයෙකුත් පාඨමාලාවන් පවත්වනු ලබන අතර, මේ දක්වා නිලධාරී 49 දෙනෙකු සඳහා පාඨමාලා 05 ක් ද, සංඥා සෙසුනිලයින් 971 දෙනෙකු සඳහා පාඨමාලා 14 ක් ද, වෙනත් ඒකක සෙසුනිලයින් 193 දෙනෙකු සඳහා පාඨමාලා 09 ක් ද මෙම වර්ෂය තුල පවත්වා ඇත.

සංඥා පාසල වෙතින් සිදුකරනු ලබන පුහුණු රාජකාරීන්ට අමතරව පාස්කු ඉරුදින එල්ල වූ බෝම්බ ප්‍රහාරයත් සමග රට තුල උද්ගත වූ හදිසි තත්ත්වය සමනය කිරීම සඳහා මහනුවර ප්‍රදේශයේ අභ්‍යන්තර ආරක්ෂක රාජකාරී සඳහා මෙම පුහුණු පාසලේ භඨපිරිස් යොදවන ලදි. තවද මහනුවර නගරයේ සිදුකල විශේෂ මෙහෙයුම් සඳහා ද භඨ පිරිස් හි දායකත්වය ලබා දෙන ලදි.

සංඥා පුහුණු පාසලේ තවත් වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් සේනාවිධායක හා ප්‍රධාන උපදේශකගේ මගපෙන්වීම යටතේ පුහුණු පාසලට දීර්ඝකාලීනව අඩුපාඩුවක්ව පැවති ප්‍රධාන මාර්ගය පිළිසකර කිරීම සියළු නිලයන්ගේ ශ්‍රමදායකත්වයෙන් සිදුකරන ලදී. ඊට සමගාමීව පිවිසුම් මාර්ග යේ සංඥා බලකායට අයත් Mercury අනුරුවක් නිර්මාණය කරන ලද අතර, කඳවුරේ සනීපාරක්ෂක කටයුතු වැඩිදියුණු කිරීම අවශ්‍ය කටයුතු සකස් කිරීම මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.

හමුදා සාමාජිකයන්ට මෙම පුහුණු පාසැල වෙතින් ලබාදෙන පුහුණුවට අමතරව පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව තුලින් නායකත්ව හැකියාව, කණ්ඩායම් හැඟීම හා ධනාත්මක ආකල්ප වර්ධනය මූලික කරගත් පුහුණු වැඩමුලු පවත්වන ලදි.





ඉන්දියානු යුද්ධ හමුදාවේ ආධාර සහිතව මෙම පුහුණු පාසලේ අභිනවයෙන් ඉදිකරන ලද සන්නිවේදන විද්‍යාගාරයේ උපකරණ ක්‍රියාත්මක කරවීම පිළිබඳ මූලික පුහුණුවක් ලබා දීම සඳහා 2019 ජනවාරි මස 11 වන දින සිට 2019 අප්‍රේල් මස 08 වන දින දක්වා පුහුණු පාඨමාලාවන් පැවැත්වූ අතර, ඒ සඳහා ඉන්දියානු යුද්ධ හමුදා උපදේශකයින් සහභාගී වන ලදි.



මේජර අංගත් රූප්රාහ්



සුබර්දාර් සුරේශ් කුමාර



හවල්දාර් දීපක් සිං





සංඥා සේවාස්ථ පාඨමාලාව අංක 04 අවසන් දේශනය සඳහා සේනාවිධායකගේ ආරාධනයෙන් එවකට යුධ සේවා ලේකම්/ සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් බීඑච්එම්ජී විජේසිංහ යූඑස්පී එන්ඩීයූ පීඑස්සී 2019.01.12 වන දින මෙම පුහුණු පාසලට පැමිණි අතර එතුමන් විසින් ඉන්දියානු සන්නිවේදන විද්‍යාගාරයද නිරීක්ෂණය කිරීම සඳහාද සහභාගී වන ලදි.

පුහුණු පාසලේ සේනාවිධායකගේ ආරාධනයෙන් සංඥා සේවාස්ථ පාඨමාලාව අංක 05 අවසන් දේශනය සංඥා බලකාධිපති හා ප්‍රධාන සංඥා නිලධාරී මේජර් ජෙනරාල් එන්එම් හෙට්ටිආරච්චි වීඑස්වී යූඑස්පී පීඑස්සි එච්ඩීඑම්සි විසින් 2019.05.25 දින මෙම පුහුණු පාසල් ශ්‍රවණාගාරයේදී  සිදුකරන ලදී.





සංඥා බලකා 75 වන සංවත්සරයේ ICT සම්මන්ත්‍රණයට විශේෂ ආරාධිතයෙකු ලෙස පැමිණි ඉන්දියානු යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරී ලුතිතන් ජෙනරාල් රජීව් සබ්බ්‍රවාල් වීඑස්එම් 2018 නොවැම්බර් මස 29 වන දින සංඥා පුහුණු පාසල වෙත නිරීක්ෂණ චාරිකාවක් සඳහා පැමිණෙන ලදි. එම චාරිකාවේදී ඉන්දියානු යුද්ධ හමුදාපති විසින් ප්‍රදානය කරන ලද සන්නිවේදන විද්‍යාගාරය නිරීක්ෂණය කරන ලද අතර, ඒ සඳහා ශ්‍රී ලංකා සංඥා බලකායේ ප්‍රධාන සංඥා නිලධාරී මේජර් ජෙනරාල් එන්එම් හෙට්ටිආරච්චි වීඑස්වී යූඑස්පි පිඑස්සි එච්ඩීඑම්සී ජ්‍යේෂ්ඨ නිලධාරී ද සහභාගී විය.



ශ්‍රී ලංකා යුද්ධ හමුදා තුරුලිය වෙනුවෙන් අපි පැල සිටුවීමේ ව්‍යාපෘතිය හා සමගාමීව ශ්‍රී ලංකා මොබිටෙල් ආයතනයෙහි මහනුවර ශාඛාව වෙතින් මෙම පුහුණු පාසල වෙත විවිධ වර්ගයේ පැල 500ක් ප්‍රධානය කරන ලදි.

සංඥා පුහුණු පාසල ආසන්නයේම පිහිටි මහනුවර ධර්මරාජ විද්‍යාලයේ කඳු බෑවුමක ඇති වු හදිසි ලැව්ගිනි තත්වය මෙම පුහුණු පාසලේ භටපිරිස් විසින් සම්පුර්ණයෙන්ම මැඩපවත්වන ලද අතර, ඉන් සිදුවීමට ගිය මහත් ව්‍යසනයක් මැඩපවත්වා පාරිසරික හානිය අවම කරන ලදි.



මෙම පුහුණු පාසලේ රාජකාරී කරනු ලබන සෙ/283979 කෝප්‍රල් බමුණුසිංහ බීඑන්යූ විසින් එවකට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එන්යූඑම්එම්ඩබ් සේනානායක ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී යූඑස්ඒසීපීඑස්සී ගේ රූපයක් සිතුවමට නගා එතුමන් වෙත පිළිගැන්වූ අවස්ථාව.



මෙම පුහුණු පාසලේ වසර එකහමාරක් පමණ කාලයක් ප්‍රධාන උපදේශක තනතුරේ රාජකාරී කල මේජර් එච්ජීඩීඩබ් හෙට්ටිආරච්චි පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී තනතුරෙන් නික්ම යෑම නිමිත්තෙන් සියළු නිලයින් විසින් සමරු තිලිණයක් පිළිගැන්වීම.



මෙම පුහුණු පාසලේ පිවිසුම් මාර්ග කොන්ක්‍රීට් අතුරා පිළිසකර කල පසු

# පුහුණු පාඨමාලාවන් විස්තරය

| අ/අ | පාඨමාලාව | කාලසීමාව | සහභාගි වු සිසුන් ගණන | පාඨමාලාවේ විශිෂ්ඨතම ශිෂ්‍යයා |
|---|---|---|---|---|
| 1 | සංඥා මධ්‍ය ප්‍රගමන නිලධාරී පාඨමාලාව 53 (MCC) | 2018.12.03 සිට 2019.01.12 දක්වා | 13 | මේජර් කේඑම්අයිපී හේමපාල පීඑස්සී |
| 2 | සංඥා මධ්‍ය ප්‍රගමන නිලධාරී පාඨමාලාව 54 (MCC) | 2019.04.16 සිට 2019.05.25 දක්වා | 10 | මේජර් ටිඑම්එන්ඩී තෙන්නකෝන් පීඑස්සී |
| 3 | රෙජිමේන්තු සංඥා නිලධාරී පාඨමාලාව 04 (RSO) | 2018.11.08 සිට 2018.12.27 දක්වා | 07 | ලුතිනන් පීඩීආර්ඕ පතිරාජ |
| 4 | රෙජිමේන්තු සංඥා නිලධාරී පාඨමාලාව 05 (RSO) | 2019.05.06 සිට 2019.06.24 දක්වා | 04 | කපිතන් එම්ඩීපීඅයි මිගහපොල |
| 5 | තරුණ සංඥා නිලධාරී පාඨමාලාව 14 (Yo's) | 2019.01.16 සිට 2019.04.05 දක්වා | 15 | කපිතන් ආර්පීඑම්ටීඩීබී රත්මලවින්න |
| 6 | කෝප්‍රල් සිට සැරයන් දක්වා නිල උසස් කිරීමේ පාඨමාලාව අංක 62 | 2018.10.29 සිට 2018.12.28 දක්වා | 40 | කෝප්‍රල් උදයපාල ටිඑන් |
| 7 | කෝප්‍රල් සිට සැරයන් දක්වා නිල උසස් කිරීමේ පාඨමාලාව අංක 63 | 2019.03.01 සිට 2019.04.09 දක්වා | 32 | කෝප්‍රල් අලහකෝන් එඑම්කේ |
| 8 | කෝප්‍රල් සිට සැරයන් දක්වා නිල උසස් කිරීමේ පාඨමාලාව අංක 64 | 2019.06.10 සිට 2019.07.22 දක්වා | 99 | කෝප්‍රල් ජයවර්ධන කේඑම්ඩී ආර්එස්පී |
| 9 | ලාන්ස් කෝප්‍රල් සිට කෝප්‍රල් දක්වා නිල උසස් කිරීමේ පාඨමාලාව අංක 15 | 2018.10.29 සිට 2019.01.09 දක්වා | 64 | ලාන්ස් කෝප්‍රල් ධනංජය එල්අයි |
| 10 | ලාන්ස් කෝප්‍රල් සිට කෝප්‍රල් දක්වා නිල උසස් කිරීමේ පාඨමාලාව අංක 16 | 2019.01.18 සිට 2019.02.27 දක්වා | 96 | ලාන්ස් කෝප්‍රල් මධුසංක එන්බීජීඑන් |
| 11 | ලාන්ස් කෝප්‍රල් සිට කෝප්‍රල් දක්වා නිල උසස් කිරීමේ පාඨමාලාව අංක 17 | 2019.05.02 සිට 2019.06.21 දක්වා | 62 | ලාන්ස් කෝප්‍රල් කුමාරසිංහ එඑස් |
| 12 | වෘත්තීය පරීක්ෂණ 1 ශ්‍රේණිය - 2018 | 2018.11.05 සිට 2018.12.27 දක්වා | 18 | කෝප්‍රල් පෙරේරා ජේකේපීඑස් |
| 13 | වෘත්තීය පරීක්ෂණ 1 ශ්‍රේණිය - 2019 | 2019.01.16 සිට 2019.02.13 දක්වා | 19 | කෝප්‍රල් බාලසූරිය යූබීජීසීකේ |
| 14 | මූලික සංඥා පාඨමාලාව අංක 113 | 2018.10.01 සිට 2018.12.19 දක්වා | 111 | ආධුනික සෙබළ හේවාවසම් එච්ජීජීඑන්කේ |
| 15 | මූලික සංඥා පාඨමාලාව අංක 114 | 2019.01.28 සිට 2019.04.11 දක්වා | 65 | ආධුනික සෙබළ ද සිල්වා ජේඑස්එන්ටි |
| 16 | මූලික සංඥා පාඨමාලාව අංක 115 | 2019.05.06 සිට 2019.07.11 දක්වා | 127 | ආකාසෙ මධුවන්ති ජේකේසිඑස් |
| 17 | වෙනත් ඒකක සංඥා පාඨමාලාව අංක 168 | 2018.09.13 සිට 2018.11.14 දක්වා | 16 | ලාන්ස් කෝප්‍රල් කුලසේකර කේඑම්ර්ජීඑන්ජී |
| 18 | වෙනත් ඒකක සංඥා පාඨමාලාව අංක 169 | 2019.04.03 සිට 2019.06.13 දක්වා | 15 | සාමාන්‍ය සෙබළ ලැවනට් එස්එස්ඩබ් |
| 19 | විද්‍යුත් සංග්‍රාමික පාඨමාලාව අංක 32 | 2018.11.14 සිට 2019.01.07 දක්වා | 12 | ලාන්ස් කෝප්‍රල් කරුණාරත්න ජීබීඑස්සී |
| 20 | විශේෂ බලකා පාඨමාලාව 03 | 2019.02.25 සිට 2019.05.02 දක්වා | 20 | ලාන්ස් කෝප්‍රල් ගම්ලත් පිආර්ටිඑම් |

# පුහුණු පාඨමාලාවන් අතරතුර විශේෂ අවස්ථා

















# 2 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය (ස්වේච්ඡා)



**ලුතිනන් කර්නල්**
**ඒඒටී සෝමරත්න යූඑස්පී**
**අණදෙන නිලධාරී**

2019 වර්ෂය ආරම්භවීමත් සමගම ගතවී ඇති කාලසීමාව ආවර්ජනය කිරීමේදී සංඥා බලකා මාතාවගේ එකම ස්වේච්ඡා සාමාජිකයා වන මෙම ඒකකය සංඥා බලකායේ ඉහලට ඒකකයක් ලෙස රැගෙන යාමේ මහගු අභියෝගයට මුහුණ දීමට හැකිවන පරිදි වත්මන් අණදෙන නිලධාරීගේ මගපෙන්වීම මත අභිමානවත් ඉදිරිගමනෙහි මතක සටහන් අතර 2019 වර්ෂයට අදාළව ආසේමු(නැගෙනහිර) බලප්‍රදේශයේ ස්ථානගත ඒකකයන් අතර පැවති සරඹ තරඟාවලියේ ප්‍රථම ස්ථානය දිනාගැනීමත් සංඥා රෙජිමේන්තුව විසින් සංවිධානය කරන ලද අන්තර් සංඥා ඒකක සරඹ තරඟාවලි තුළදී අනෙකුත් සියළුම සංඥා ඒකක අභිබවා ප්‍රථම ස්ථානය දිනාගැනිමත් ඒකකය ලද විශේෂ ජයග්‍රහණයන් ලෙස පෙන්වා දිය හැකිය.

තවද ඒකක භට පිරිස් තවත් ධෛර්‍යමත් කරමින් විවිධ ක්‍රීඩා කුසලතාවයන්ගෙන් හෙබි භට පිරිස් ක්‍රීඩාව වෙත යොමු කරමින් සංඥා බලකා අන්තර් සංඥා ඒකක ක්‍රීඩා තරඟාවලිය තුළ කැපිපෙනෙන ක්‍රීඩා කෞෂල්‍යයක් විදහා පෙන්වමින් ක්‍රිකට්, කඹ ඇදීම, රගර්, බැඩ්මින්ටන්, කැරම්, මළල ක්‍රීඩා තරඟාවලියන් ජයග්‍රහණය කරන ලදි.

2018 පුහුණු අධ්‍යක්ෂක ජෙනරාල්ගේ අධීක්ෂණය යටතේ ආරක්ෂක සේනා නැගෙනහිර බලප්‍රදේශයේ මින්නේරිය, ත්‍රිකුණාමලය සහ ලංකා පටුන ප්‍රදේශය කේන්ද්‍ර කොටගෙන 2018 සැප්තැම්බර් මස 06 දින සිට 26 දින දක්වා දෙස් විදෙස් හමුදා සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලද දියකාවා යුද අභ්‍යාසයට අවශ්‍යය තොරතුරු තාක්ෂණ උපකරණ, රේඩියෝ සම්බන්ධතාවයන් හා උපකරණ, දුරකථන සම්බන්ධතා උපකරණ, විදුලි ජනක උපකරණ හා විදුලි බල සැපයුම්, ක්‍රියාන්විත මැදිරි ඉදිකිරීම ආදි අභ්‍යාසයේ සියළුම සංඥා සම්බන්ධතාවයන් මෙම ඒකකය වෙතින් ඉටුකරන ලදි.

2019.04.21 දින රට තුල ඇතිවූ අනපේක්ෂිත බේදවාචකයෙන් පසු නැගෙනහිර ප්‍රදේශයේ වෙනුවෙන් අභ්‍යන්තර ආරක්ෂක රාජකාරී සඳහා භට පිරිස් යෙදවීම හා සිදු කරන ලද ක්‍රියාන්විතයන් සාර්ථක කර ගැනිම වස් සංඥා සම්බන්ධතා පවත්වමින් සිදුවූ ව්‍යසනය මැඩ පැවැත්වීමට සක්‍රිය දායකත්වයක් ලබාදෙන ලදි.

ඒකක ක්‍රියාකාරකම් දෙස හැරී බැලීමේදී 2019.04.25 දිනට යෙදී තිබු මෙම ඒකක 39 වන සංවත්සර උත්සවය රට තුල පැවති අනපේක්ෂිත සිදුවීම හේතුවෙන් චාම් අන්දමින් සමරන ලද අතර, ඒකක සංවත්සර උත්සවයට සමගාමීව සතුරා සමග ක්‍රියාන්විතයන්හීදී යුද්ධයේදී මියගිය/ රණක්ෂිතයට පත්ව ඇති සහ දැනට රාජකාරියේ නියුතු මෙම ඒකක සියළුම රණවිරුවන් මෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත්, ඒකකයටත් පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයෙන් මියගිය හා තුවාල සිදුවූ සියළු දෙනාටත් සෙත් ප්‍රාර්ථනා කරමින් මින්නේරි දේවාලයේ ආශිර්වාද පුජාව සිදු කොට සෝමාවති පුද භූමියෙහි කප්රුක පුජාවක් සහ බෝධිපුජා පිංකමක් පවත්වන ලදි.

පසුගිය කාලවකවානුව දෙස ආපසු හැරී බැලීමේදී ඉතා කෙටිකලක් තුල ඒකකය ලබා ඇති ප්‍රගතිය ඒකකය සීඝ්‍ර දියුණුවක් කරා යාමට ඇවැසි මංපෙත් විවර කිරීම සඳහා ඒකක නිලධාරී/ සෙසුනිලයින්ගෙන් ලැබුණු සහයෝගය ඉතා අගනේය.






2 වන ස්වෙච්ඡා ශ්‍රී ලංකා සංඥා බලකායේ අණදෙන නිලධාරී වශයෙන් ලුතිතන් කර්නල් ඒඒටී සෝමරත්න යූඑස්පී 2019.03.16 දින සුභ මොහොතින් වැඩ භාරගත් මොහොත





2 වන ස්වෙච්ඡා ශ්‍රී ලංකා සංඥා බලකායේ 39 වන සංවත්සරයට සමගාමීව 2019.04.22 දින මින්නේරිය දේවාලයේ
පැවති ආශිර්වාද පුජාවේ විශේෂ අවස්ථා





2019.01.23 දින ප්‍රධාන සංඥා නිලධාරි මේජර් ජෙනරාල් එන්එම් හෙට්ටිආරච්චි වීඑස්වී යුඑස්පී පීඑස්සී එච්ඩීඑම්සි මෙම ඒකක සංචාරය





2019.04.22 දින සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් බීඑච්එම්ජ් විජේසිංහ යුඑස්පී එන්ඩීයු පීඑස්සී මෙම ඒකක සංචාරය





ආරක්ෂක සේනා මුලස්ථානය (නැගෙනහිර) බල ප්‍රදේශයේ 2018.09.06 වන දින සිට 2018.09.26 දින දක්වා මෙම
ඒකකය වෙතින් සංඥා සම්බන්ධතාවයන් ආවරණය කරන ලද දියකාවා යුධ අභ්‍යාසය

# විද්‍යුත් සංග්‍රාමික බළඝණය

විද්‍යුත් සංග්‍රාමික බළඝණයේ ඉතිහාසය 90 දශකය තෙක් දිවෙන අතර පළමු විද්‍යුත් සංග්‍රාමික ක්‍රියාන්විතය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, නාවික හමුදාව හා ගුවන් හමුදාව සමගින් ඒකාබද්ධව සිදුකරන ලදි. එහිදී ශ්‍රීලංකා සංඥා බළකායේ එවකට කපිතාන් එන්එම් හෙට්ටිආරච්චි පළමු නිලධාරි අණදෙන වශයෙන් කටයුතු කරමින් 10 දෙනෙකුගෙන් සමන්විත විද්‍යුත් සංග්‍රාමික භට පිරිස් සමගින් 1990.07.08 දින රණසේවාපුර අනුරාධපුර පිහිටි ගුවන් විදුලි සංස්ථාවට අයත් ගොඩනැගිල්ලක විද්‍යුත් සංග්‍රාමික රාජකාරීන් සිදුකිරීම සඳහා ස්ථානගත වන ලදී. සංඥා බලසේනාධිපති වශයෙන් රාජකාරී කරමින් සිටි බ්‍රිගේඩියර් එල්සීජේ ද සිල්වා ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් දිශා සොයාගැනීමේ ක්‍රමවේදය ප්‍රථමයෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත හඳුන්වාදුන් අතර දිශා සොයාගැනීමේ යන්ත්‍ර ක්‍රියාන්විත අවශ්‍යතාවයන් සඳහා ස්ථානගත කිරීම බ්‍රිගේඩියර් කේජ් ඥාණවීර ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් සිදුකරන ලදි.

මුල් වකවානුව තුල දිශා සොයාගැනීමේ යන්ත්‍ර විද්‍යුත් සංග්‍රාමික බළඝණයෙහි නොතිබූ අතර දිශා සොයා ගැනීම සඳහා දිශානුගත ඇන්ටනා සහ සාමාන්‍ය ගුවන් විදුලි යන්ත්‍ර උපයෝගිකර ගන්නා ලදි. පළමුවෙන්ම යුද්ධ හමුදා අවශ්‍යතාවයන් සඳහා නිෂ්පාදිත දිශා සොයාගැනීමේ යන්ත්‍ර ක්‍රියාන්විත ප්‍රදේශයන්හි ස්ථාන ගතකරන ලද්දේ කණ්ඩායම් නායක වශයෙන් කටයුතු කල එවකට කපිතාන් ඩීඑජීඑන් දෙමටන්පිටිය විසින් වන අතර ඔහුගේ අනුබන්ධ භාර නිලධාරින් වශයෙන් එවකට කපිතාන් ඩබ්එල් ප්‍රේමසිරි, කපිතාන් ඒඩී අතුල තිරිමාවිතාන සහ කපිතාන් එම්එස්බී විජේනායක කටයුතු කරන ලදි. එසේම මෙසේ විද්‍යුත් සංග්‍රාමික රාජකාරීන්හි නියැලෙමින් සිටියදී මේජර් එම්එස්බී විජේනායක යන ජ්‍යෙෂ්ඨ නිලධාරි ජනකපුර, වැලිඔය කඳවුරට ත්‍රස්තවාදීන් විසින් 1993.07.23 දින සිදුකරන ලද ත්‍රස්ත ප්‍රහාරයේදී ජීවිතක්ෂයට පත්විය. 1995 සහ 1997 වර්ෂයන් වන විට දිශානුගත ඇන්ටනා වෙනුවට TDL 9600 හා TDL 5000 දිශා සොයාගැනීමේ යන්ත්‍ර විද්‍යුත් සංග්‍රාමික බළඝණය විසින් පිළිවෙලින් භාවිතය සඳහා යොදාගන්නා ලදී. එසේම 1998 වර්ෂයේදී ICOM-8500 ස්කෑනර් යන්ත්‍ර භාවිතයට ගැනුණු අතර එම ගුවන් විදුලි යන්ත්‍ර උපයෝගි කරගනිමින් ත්‍රස්තවාදින්ගෙ ගුවන් විදුලි යන්ත්‍ර වලට සවන්දි ඔවුන්ගේ කටහඩ පටිගත කොට ඇසීමට සැලැස්වීම තුලින් ඔවුන් හඳුනා ගැනීම සඳහා නවක ක්‍රියාකරුවන් පුහුණු කිරීමද සිදුකරන ලදි.

විද්‍යුත් සංග්‍රාමික රාජකාරීන් උතුරු සහ නැගෙනහිර ක්‍රියාන්විත ප්‍රදේශයන්හි සිදුකලද ශ්‍රී ලංකා සංඥා බළකායේ විද්‍යුත් සංග්‍රාමික බළඝණය සඳහා අනුමත සංස්ථාවක් එම කාලවකවානුව තුලදී නොතිබිනි. එසේ තිබියදී 1997.01.28 වන දින ප්‍ර/මාරා/51 දරණ යුද්ධ හමුදා නියෝග යටතේ විද්‍යුත් සංග්‍රාමික බළඝණය ස්වාධීන බළඝණයක් ලෙස යාපනය වාසවිලාන්හිදී නැවත ප්‍රතිස්ථාපනය වූ අතර එහි පළමු බළඝණාධිපති වශයෙන් එවකට මේජර් එම්පීජේඑස්කේ පටබැඳිගේ ජ්‍යෙෂ්ඨ නිලධාරි පත්වන ලදි.

විද්‍යුත් සංග්‍රාමික බළඝණය ස්වාධීන බළඝණයක් වශයෙන් ස්ථාපනය වූ පසු යුද්ධ හමුදා අවශ්‍යතා මත විද්‍යුත් සංග්‍රාමික අනුබණ්ඩ පලාලි, වව්නියාව සහ මඩකලපුව වැනි ප්‍රදේශයන්හි ස්ථානගත විය. වර්ෂ 2000 දී ආරක්ෂක අංශ විසින් නොනවත්වා ප්‍රහාරාත්මක ක්‍රියාන්විත සිදුකරන ලද අතර ,රිවිකිරණ, සහ ,කිණිහිර, ක්‍රියාන්විතයන්හීදී ප්‍රථම වරට පහසුවෙන් රැගෙනයා හැකි ඉලක්ක හඳුනාගන්නා රේඩාර් යන්ත්‍ර විද්‍යුත් සහයෝගිතා මිණුම් වශයෙන් භාවිතා කරන ලදි.

වර්ෂ 2001 සිට 2004 දක්වා සටන් විරාම කාලය අතරතුර විද්‍යුත් සංග්‍රාමික බළඝණය විසින් එල්ටීටීඊ ත්‍රස්තවාදින්ගේ ගුවන් විදුලි සංවාදයන් නිරීක්ෂණය කිරීම තුලින් සහ ත්‍රස්තවාදීන් ගමන් ගන්නා ස්ථාන නිරීක්ෂණය කිරීම තුලින් ත්‍රස්තවාදීන්ගේ පෙර සැලසුම් හඳුනාගන්නා ලදි. තවද සටන් විරාම ගිවිසුමෙන් පසු කමාන්ඩෝ සහ විශේෂ කාර්ය බලකාය විසින් ත්‍රස්තවාදි ප්‍රදේශවල සිදුකරන ලද දිගු දුර මෙහෙයුම් වලදී ඔවුන් ත්‍රස්තවාදීන්ගේ ග්‍රහණයට හසුවීමට ආසන්න අවස්ථාවන්හිදී විද්‍යුත් සංග්‍රාමික නිරීක්ෂණයන් ආධාරයෙන් ඔවුන් වෙත තොරතුරු සපයා ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට හැකිවී ඇත.

මානුෂීක මෙහෙයුම පැවති අතරතුරදී ඔඩ්ඩුසුඩාන් සහ පුදුකුඩිඉරිප්පු ප්‍රදේශවල සතුරු සංඥා සම්බන්ධතා ජාලවලට බාධා කිරීම සඳහා TRC 274 VHF/UHF ජෑමර් යන්ත්‍ර ස්ථානගත කරමින් හා එල්ටීටීඊ ත්‍රස්තවාදීන් ආරක්ෂක අංශ වෙත ප්‍රහාර දියත් කිරීම සඳහා ආරක්ෂක වලල්ලන් වෙත ඇතුල්වීමට පෙරාතුව පූර්ව දැනුම් දීම් සිදු කිරීම සඳහා සුදුසු ස්ථානයන්හි වෙරළ නිරීක්ෂණ රේඩාර් සහ යුධ භූමි නිරීක්ෂණ රේඩාර් (BFSR) ස්ථානගත කිරීම සිදු කිරීම තුළින් මහගු ප්‍රතිඵල අත්පත් කර ගැනීමට විද්‍යුත් සංග්‍රාමික බළඝණයට හැකිවී ඇත. මෙම සමයෙහිදී දිශා සොයාගැනීමේ සහ රේඩාර් අනුබණ්ඩයන්හි රාජකාරී කල භටපිරිස් යාපනය, වන්නි සහ නැගෙනහිර ප්‍රදේශයන්හි අණ සහ පාලන කටයුතු සිදු කිරීම සඳහා විශාල වශයෙන් ලබාදෙන ලද දායකත්වයද මෙහිදී සඳහන් කල යුතුමය.

යුද්ධ හමුදා මූලස්ථානය විසින් 2008.06.05 වන දින ප්‍ර/මාරා/51(15) දිනැති යුද්ධ හමුදා නියෝගය මගින් විද්‍යුත් සංග්‍රාමික බළඝණයේ සංස්ථාව 19 x 90 ලෙස නැවත ප්‍රතිස්ථාපනය කරන ලදි. දැනට විද්‍යුත් සංග්‍රාමික බළඝණය සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රය පනාගොඩහි ස්ථානගතව ඇති අතර දිශා සොයාගැනීමේ අනුබණ්ඩ සහ රේඩාර් අනුබණ්ඩ විද්‍යුත් සංග්‍රාමික බළඝණය යටතේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයන්හි නිරීක්ෂණ කටයුතු සඳහා ස්ථානගත කර ඇත. එසේම ක්‍රියාන්විත රාජකාරීන්ට අමතරව විද්‍යුත් සංග්‍රාමික බළඝණයෙහි පූර්ණ අධීක්ෂණය යටතේ විද්‍යුත් සංග්‍රාමික දැනුම වර්ධනය කිරීම සඳහා පාඨමාලාවන්/වැඩමුළු රාශියක් සංඥා ඒකක සෙනීන් සහ වෙනත් ඒකක සෙනීන්ගේ සහභාගිත්වයෙන් යුතුව සිදු කරමින් පවතී. තවද නිදහස් දින පෙළපාලිය ඇතුළු විවිධ ප්‍රදර්ශණයන් සඳහා නිරීක්ෂණ චාරිකාවන්හිදී විද්‍යුත් සංග්‍රාමික උපකරණ සහ ජෑමර් රථ ප්‍රදර්ශණය කිරීමද මෙම බළඝණය වෙතින් සිදු කරනු ලැබේ.



ඉදිරි භූමියෙහි රේඩාර් රාජකාරීන්හි නියැලෙන අතරතුර



දිශාව සොයා ගැනීමේ රාජකාරීන්හි නියැලෙන අතරතුර





විද්‍යුත් සංග්‍රාමික දැනුම වැඩිදියුණු කිරීම සඳහා පුහුණු වැඩමුළුක් පවත්වමින්





ජාතික නිදහස් දින පෙළපාලිය සඳහා සහභාගී වූ විද්‍යුත් සංග්‍රාමික බලඝණයේ රථ පෙළපාලිය

# සංඥා සේවා මුක්ත භට සංගමය

1950 වසරේ සංඥා බලකායේ කර්නල් සීආර් ද සිල්වා ඊඩී ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ අදහසකට අනුව ලුතිනන් කර්නල් ඩබ්ලිව්එම් ප්‍රනාන්දු ඊඩී (විශ්‍රාමික) හා ලුතිනන් කර්නල් සීවී කෙලාර්ට් ඕබීඊ ඊඩී (විශ්‍රාමික) ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ සහයෝගය ඇතිව විශ්‍රාමිකයින්ගේ සංගමය ආරම්භ කිරීමේ මුල් පියවර තබන ලදී.

1955 දෙසැම්බර් මස 15 වන දින "ලංකා සංඥා බලකා සේවාමුක්ත සංගමය" ලෙස නාමිකව ආරම්භ කල මෙම සංගමයේ සාමාජිකත්වය 1939 සැප්තැම්බර් 03 දින සිට 1946 අගෝස්තු 31 දින දක්වා සංඥා කණ්ඩායමේ, ලංකා ඉංජිනේරු බලකායේ හෝ ලංකා සංඥා බලකායේ රාජකාරි කරනු ලැබූ සියළු අයවළුන් සාමාජිකත්වය දැරීමට සුදුසුකම් ලබන ලදී. එවකට සංගමයේ ප්‍රථම සභාපති ලෙස කර්නල් වීසී කෙලාර්ට් ඕබීඊ ඊඩී (විශ්‍රාමික) විසින් දරණු ලැබූ අතර, මේජර් ඩීවී බ්‍රොහියර් ඊඩී (විශ්‍රාමික) විසින් ලේකම් ධූරය දරන ලදී.



සංඥා සේවා මුක්ත භට සංගමයෙහි රිදී ජුබිලිය සඳහා නිකුත් කල සමරු එලකය

1957 වර්ෂයේ දී සංඥා බලකා නිත්‍ය හා ස්වේච්ඡා විශ්‍රාමිකයින් භට සාමාජිකත්වය ලබා ගත හැකි අයුරින් සංගමයේ ප්‍රතිපත්ති මාලාව සංශෝධනය කල අතර, "ලංකා සංඥා බලකා සේවාමුක්ත සංගමය" ලෙස තිබූ සංගමයේ නම 1972 වර්ෂයේදී ලංකා සංඥා බලකාය, ශ්‍රී ලංකා සංඥා බලකාය වීමත් සමග "ශ්‍රී ලංකා සංඥා සේවාමුක්ත සංගමය" ලෙස වෙනස් කරන ලදී. 1980 වර්ෂයේදී සංගමයේ 25 වන සංවත්සරය උත්සවාකාරයෙන් සමරන ලද අතර, එවකට සභාපති ධූරය දරන ලද්දේ මේජර් එම්ආර්ජේඑෆ් පෙරේරා (විශ්‍රාමික) විසින්ය. ඔහුගේ කාලපරිච්ජේදය තුල තම සංගමයේ සාමාජිකයින්ගේ සහය ඇතිව ඉතා වැදගත් වැඩසටහන් කිහිපයක්ම සංවිධානය කරන ලදී.

50 වන සංවත්සරය 2005 දෙසැම්බර් මස 15 දිනට යෙදී තිබුනද 2004 වසරේ දෙසැම්බර් මස සිදුවූ සුනාමි ව්‍යවසනයේ පළමු සැමරුම යෙදී තිබුණු හෙයින් 50 වන සංවත්සර උත්සවය සැමරීම පසුවට කල් තබන ලදී. ඒ වෙනුවට එවකට සංගමයේ සභාපතිව සිටි මේජර් ජෙනරාල් සීජේ අබේරත්න වීඑස්වී යූඑස්පී (විශ්‍රාමික) ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මූලිකත්වයෙන් සුනාමි උවදුරට ලක් වූ සංඥා බලකා සාමාජිකයන් පිළිබඳ සොයා බලා ඔවුන්ට සහන සැලසීමේ වැඩසටහන් කිහිපයක් එතුමා අතින් සංවිධානය විය. 50 වන සංවත්සර උත්සවය  සැමරීම 2006 ජූලි මස 30 වන දින උත්සවාකාරයෙන් සමරන ලදී.

පසුගිය වාර්ෂික මහා සභාරැස්වීමේදී සංගමයේ සභාපතිත්වය හෙබවූ මේජර් ජෙනරාල් එස්ජීපී සමරසිංහ (විශ්‍රාමික) ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී එම ධූරයෙන් සමුගැනීමෙන් අනතුරුව සභා සම්මතයෙන් එම ධූරය සඳහා මේජර් ජෙනරාල් කේආර්පී රොවෙල් (විශ්‍රාමික) ආර්ඩබ්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී යූඑස්ඒසීජීඑස්සී පත්විය. එහි උප සභාපති වශයෙන් කපිතන් ජේආර් මෙන්ඩිස් ද, ලේකම් වශයෙනන් පීඑල්ටී පෙරේරා මහතාද, උප ලේකම් වශයෙන් රම්‍ය කුමාර මහතා සහ භාණ්ඩාගාරික වශයෙන් ලුතිනන් ඩබ්එම්එස් වීරකෝන් පත්විය.

සංඥා සංගමයෙහි වාර්ෂික සංවත්සරය සැමරීම 2019.02.23 වන දින විශ්‍රාමිකයන්ගේ පවුල් සාමාජිකයන්ද සහභාගීත්වයෙන් පනාගොඩ සංඥා රෙජිමේන්තු පරිශ්‍රයේදී විශ්‍රාමික මේජර් ජෙනරාල් සීජේ අබේරත්න වීඑස්වී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.





# සංඥා බලකා සේවා වනිතා ශාඛාව

## පොසොන් බැති ගී සරණිය

ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව විසින් 2019 පොසොන් පුර පසළොස්වක පොහොය දිනයට සමගාමීව ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති හා යුධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිතුමියගේ සහභාගිත්වයෙන් 2019.06.16 වන දින පොසොන් බැති ගී සරණිය හා සව් දන්සලක් උත්කර්ශවත් අන්දමින් පනාගොඩ යුධ හමුදා බෝධිරාජාරාම විහාරස්ථාන පරිශ්‍රයෙහි පවත්වන්නට යෙදුණි. මේ සඳහා ශ්‍රී ලංකා සංඥා බලකායේ බලකාධිපති හා ප්‍රධාන සංඥා නිලධාරී මේජර් ජෙනරාල් නිලන්ත හෙට්ටිආරච්චි යන ජ්‍යෙෂ්ඨ නිලධාරී හා ශ්‍රී ලංකා සංඥා බලකා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි කේෂිණී හෙට්ටිආරච්චි මැතිණිය ඇතුළු නිලධාරින් හා ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් බොහෝ පිරිසක් සහභාගි වූ අතර මෙම උත්සවයේ කටයුතු ඉතා සාර්ථක ලෙස පවත්වන්නට යෙදුණි.




ශ්‍රී ලංකා සංඥා බලකා සේවාවනිතා ශාඛාවේ හිටපු ගරු සභාපතිනි අරෝෂා විජේසිංහ මැතිණියගේ නික්ම යෑමෙන් අනතුරුව සංඥා බලකා සේවාවනිතා ශාඛාවේ අභිනව ගරු සභාපතිනිය ලෙස කේෂිණී හෙට්ටිආරච්චි මැතිණිය 2019.05.04 දිනට යෙදුන සුභ මොහොතින් රාජකාරි භාර ගන්නා ලදී.




කුරිරු ත්‍රස්ථවාදය හේතුවෙන් ශ්‍රී ලංකා සංඥා බළකායේ සහ සමස්ථ යුද්ධ හමුදාවේ සේවයේ යෙදි සිටියදී රට දැය වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන් හට පින් අනුමෝදන් කිරීමටත් ආබාධිත තත්වයට පත්ව සිටින රණවිරුවන් හට නිදුක් නිරෝගී සුවය ප්‍රාර්ථනා කිරීමටත් සේවයේ යෙදි සිටින සංඥා බලකායේ සියළුම නිලධාරීන්, නිලධාරිණියන්, සෙසු නිලයින් හා සිවිල් සේවක මහතුන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හටත් සියළුම ලක්වාසීන්ටත් නිදුක් නිරෝගී සුවය ප්‍රාර්ථනා කිරීම සහ දැනට රටේ පවතින අර්බුදකාරී වාතාවරණය සාමකාමී තත්වයට පත්වී රටට සෞභාග්‍යය උදාවීම ප්‍රාර්ථනා කිරීම වෙනුවෙන් 2019.05.16 වන දින වෙසක් පුර පසළොස්වක පොහොය දිනයට සමගාමීව ශ්‍රී ලංකා සංඥා බලකායේ සේවා වනිතා ශාඛාව විසින් බෝධිපූජා පිංකමක් ශ්‍රී ලංකා සංඥා බලකායේ බලකාධිපති හා ප්‍රධාන සංඥා නිලධාරී මේජර් ජෙනරාල් එන්එම් හෙට්ටිආරච්චි වීඑස්වී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී හා සංඥා බලකා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි කේෂිණී හෙට්ටිආරච්චි මැතිණියන්ගේ ප්‍රධානත්වයෙන් හා සියළුම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, ඔවුන්ගේ බිරින්දෑවරුන්, නිලධාරිනියන්, සෙසුනිලයින් සහ සිවිල් සේවක මහතුන්ගේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා සංඥා බලකා විහාරස්ථානයේ දි පවත්වනු ලැබිය.





ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව විසින් පවත්වනු ලැබූ මාසික සභා රැස්වීමට සමගාමීව "ආකල්ප සංවර්ධනය තුළින් යහපත් පවුල් සංස්ථාවක් ගොඩනගා ගැනීම" යන මාතෘකාව යටතේ දේශනයක් නි/4362 ලුතිනන් කර්නල් බීඑස්පී සමන්ති යන ජ්‍යෙෂ්ඨ නිලධාරිනිය විසින් 2019.06.23 වන දින ශ්‍රී ලංකා සංඥා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී. එදින මෙම රෙජිමේන්තුව යටතේ රාජකාරි කරනු ලබන කෝප්‍රල් කපිලරත්න ඩබ්එම්එස්ආර් යන කොනොනිගේ පුතනුවන් හට දෙවන ලුතිනන් යූඅයිඑන්ඩබ් ජාගොඩගේ සහ කෙඩෙට් නිලධාරිනී ජේඑම්එල්අයි ජයසුන්දර යන නිලධාරිනියන් විසින් ශිෂ්‍යාධාර ලබා දෙන ලදී. තවද සේවයේ යෙදී සිටියදී මියගිය සැරයන් බණ්ඩාර කේඑස්පී යන ජ්‍යෙකොනොනිගේ යැපෙන්නන් හට ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව විසින් ඉදිකරමින් පවතින නව නිවසෙහි නාන කාමරය සඳහා නාන කාමර කට්ටලයක් ශ්‍රී ලංකා සංඥා බලකා සේවාවනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවක් වන දිශානි මෙන්ඩිස් මැතිණිය විසින් පරිත්‍යාග කරන ලදි.







ශ්‍රී ලංකා සංඥා බලකායේ සේවය කරමින් සිටියදි හදිසි අනතුරකට ලක්ව මියගිය 2(සේවි) ශ්‍රීලංසංබ හි සැරයන් බණ්ඩාර කේඑස්පී යන ජ්‍යෙකොනොනිගේ බිරිද සහ දරුවා හට නව නිවසක් ඉදිකර දිමේ අරමුණින් ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ සංවිධානයෙන් බලකාධිපති හා ප්‍රධාන සංඥා නිලධාරි මේජර් ජෙනරාල් එන්එම් හෙට්ටිආරච්චි යන ජ්‍යෙෂ්ඨ නිලධාරි හා ශ්‍රී ලංකා සංඥා බලකා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි කේෂිණි හෙට්ටිආරච්චි මැතිණියගේ සුරතින් 2019.06.09 වන දිනට යෙදුන සුභ මොහොතින් නව නිවසට මුල්ගල තැබීම සිදුවිය. එදින මේ සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරින් හා සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් රැසක් සහාභාගි විය.





ලෝක කාන්තා දිනයට සමගාමීව 2019.03.07 හා 08 දිනයන්හී අනුරාධපුරයේ සල්ගාදු ක්‍රීඩාංගනයේදී පවත්වන ලද ප්‍රදර්ශනය සඳහා සහභාගී විය.

## ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහා සභා රැස්වීම

ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහා සභා රැස්වීම ගරු සභාපතිනි කේෂිණී හෙට්ටිආරච්චි මහත්මියගේ ප්‍රධානත්වයෙන් 2019 සැප්තැම්බර් මස 08 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරී නිවස්නයේදී පැවැත්විණි.





## ලෝක ළමා දිනය සහ ලෝක සාහිත්‍ය දිනයට සමගාමීව සිදුකල පොත් බෙදාදීමේ වැඩසටහන

සංඥා බලකා සේවා වනිතා ශාඛාව විසින් ලෝක ළමා දිනය සහ ලෝක සාහිත්‍ය දිනයට සමගාමීව පොත් බෙදාදීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදි. සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනි කේෂිණී හෙට්ටිආරච්චි මහත්මියගේ සංකල්පයක් ලෙස කියවීම තුලින් දැනුම වැඩි දියුණු කර ගැනීම උදෙසා දිරි ගැන්වීමක් ලෙස සියලුම නිලධාරින්ගේ, සෙසු නිලයින්ගේ සහ සිවිල් කාර්ය මණ්ඩලයේ අයවලුන්ගේ දූ දරුවන් සහභාගී කර ගනිමින් මෙම පොත් බෙදාදීමේ වැඩසටහන සංඥා බලකාධිපතිගේ ප්‍රධානත්වයෙන් 2019 සැප්තැම්බර් මස 08 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථානයෙහි පවත්වන ලදි. මේ සදහා ශ්‍රී ලංකා සංඥා බලකායෙහි සියළු නිලයින්ගේ දුවා දරුවන් උදෙසා එම පොත් බෙදාදීමේ වැඩසටහන ඒකක මට්ටමින්ද සිදුකිරීම සදහා ඒකකයන් වෙත පොත් ලබා දීම ද සිදුකරන ලදී. මෙම ත්‍යාගශීලී උත්සවය සදහා සංඥා බලකාධිපති සහ සංඥා සේවා වනිතා සභාපතිනියගේ ආරාධනය පරිදි සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ පෙර සභාපතිනියන්ද සහභාගීවන ලදි.









සේවා වනිතා ශාඛාව විසින් සිදුකරන සුභසාධන කටයුතු සදහා අරමුදල් රැස්කිරීමට 2018.12.24 වන දින ඉංගිරියේ ගාමිණී විද්‍යාල ක්‍රීඩාංගනයේදී සංගීත සංදර්ශනය පවත්වන ලදි.



# විශේෂ අවස්ථාවන්

## සංඥා බලකාධිපති පත්වීම හෙබවූ මේජර් ජෙනරාල් බීඑච්එම්ජී විජේසිංහ යූඑස්පී එන්ඩීයූ පීඑස්සී විශ්‍රාම ගැනීම



මේජර් ජෙනරාල් බීඑච්එම්ජී විජේසිංහ යූඑස්පී එන්ඩීයූ පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ විශ්‍රාමික නිලධාරී වර්ෂ 1964 අප්‍රේල් මස 27 වන දින උපත ලැබීය. ඔහු කෑගල්ල මහා විද්‍යාලයෙන් සිප්සතර හදාරා වර්ෂ 1985 ජනවාරි මස 18 වන දින පාඨමාලා අංක 20 යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යා පීඨය දියතලාව වෙතින් කෙඩෙට් නිලධාරියකු ලෙස යුද්ධ හමුදාවට බැඳී වර්ෂ 1986 මැයි මස 31 වන දින දෙවන ලුතිනන් වරයකු ලෙස අධිකාරියට පත්ව ශ්‍රී ලංකා සංඥා බලකාය වෙත අනුයුක්තව රාජකාරී කරන ලදි.

මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී ඔහුගේ සේවාකාලය තුළදී උසස් තනතුරු හෙබවනු ලැබීය. එතුමන් අණදෙන නිලධාරී 6 වන සංඥා රෙජිමේන්තුව, බලසේනාධිපති 222 බලසේනාව, සේනාංකාධිපති 22, 55, 62 සේනාංක, අධ්‍යක්ෂක මනෝවිද්‍යා මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂක පුනරුත්තාපන අධ්‍යක්ෂ මණ්ඩලය, නියෝජ්‍ය සේනාවිධායක ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය, ප්‍රධාන සංඥා නිලධාරී, ශ්‍රී ලංකා සංඥා බලකායේ බලකාධිපති සහ යුද සේවා ලේකම් ලෙසද උසස් තනතුරු හොබවන ලදි.

ඔහු විසින් දේශීය හා විදේශීය පාඨමාලාවන් ඉතා සාර්ථකව හදාරණ ලදී. ජාතික ආරක්ෂක පීඨ පාඨමාලාව ඉන්දුනීසියාව, අණ හා මාණ්ඩලික විද්‍යාලයෙන් මාණ්ඩලික නිලධාරී පාඨමාලාවන් හා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය මගින් කළමණාකරන අධ්‍යනය පිළිබඳ විද්‍යාපති (ආරක්ෂක) උපාධිය ලබාගන්නා ලදි.

මෙතුමන් විශිෂ්ඨ සේවා විභූෂණය, උත්තම සේවා පදක්කම, පූර්ණභූමි පදක්කම, උතුරු නැගෙනහිර මෙහෙයුම් පදක්කම, රිවිරැස සංග්‍රාමික සේවා පදක්කම, 50 වන නිදහස් සංවත්සර පදක්කම, ශ්‍රී ලංකා 50 වන සංවත්සර පදක්කම සහ දීර්ඝ සේවා පදක්කම ආදි පදක්කම්වලින් පිදුම් ලබා ඇත.













## 2019 වර්ෂයේ සංඥා බලකා අළුත් අවුරුදු උත්සවය

2019 අප්‍රේල් මස 06 වන දින සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේදී සංඥා බලකාධිපතිගේ හා සංඥා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනියගේ සහභාගීත්වයෙන් පැවැත්විය. මේ සඳහා පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේ සේවය කරන්නාවූ සංඥා රෙජිමේන්තුවට අයත් නිලධාරීන්, සෙසුනිලයින් හා ඔවුන්ගේ පවුල්වල ඥාතීන්ගේ සහභාගීත්වයෙන් ඉතා උත්කර්ෂවත් අන්දමින් පැවැත්විය. මෙයට සාම්ප්‍රදායික හා විනෝදාත්මක ක්‍රීඩා රැසක් ඇතුලත් වී තිබුණි.













## සංඥා නිලධාරීන්ගේ පුහුණු දිනය

2019 ජුලි මස 31 වන දින සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සියලුම නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විය. "සිදුවීම් කළමනාකරණය" පිළිබඳ ක්‍රියාකාරී සැසියක් අනුර ගල්කන්ද මහතා විසින් රෙජිමේන්තු මධ්‍යස්ථාන සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ දී පැවැත්විය. අවසාන වශයෙන් නිලධාරී නිවස්නයේ සාමාජිකයන්ගේ දැනුම වර්ධන වැඩසටහනින් අවසන් විය.





## සංඥා ක්ෂිතිජයෙන් ඔබ්බට



මේජර් ජෙනරාල් ඩීජීඑන් දෙමටන්පිටිය එන්ඩීයු පීඑස්සී 2019.06.18 වන දින ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක වශයෙන් පත්වීම් භාර ගැනීම



මේජර් ජෙනරාල් එච්පී සෙනෙවිරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී යූඑස්පී එන්ඩීයු 2019.06.18 වන දින 56 සේනාංකයේ සේනාංකාධිපති වශයෙන් පත්වීම් භාර ගැනීම



එවකට බ්‍රිගේඩියර් ඩීආර් ධර්මසිරි යූඑස්පී එච්ඩීඑම්සී 2019.06.07 වන දින පර්යේෂණ, විශ්ලේෂණ හා සංවර්ධන ශාඛාවේ අධ්‍යක්ෂක වශයෙන් පත්වීම් භාර ගැනීම



බ්‍රිගේඩියර් ඩබ්පීජ්කේ තිලකරත්න පීඑස්සී 2019.04.22 වන දින කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨය (දකුණ) ලේඛකාධිකාරී වශයෙන් පත්වීම් භාර ගැනීම.

# නව බලසේනාධිපති වරුන් ලෙස පත්වීම් ලැබීම



බ්‍රිගේඩියර් එච්එම්එල්ඩී හේරත් ආර්එස්පී යූඑස්පී පීඑස්සී 2018.08.07 වන දින 641 බලසේනා මූලස්ථානයේ බලසේනාධිපති වශයෙන් පත්වීම් භාර ගැනීම



කර්නල් ඩීඑම්පීපී දසනායක 2018.11.16 වන දින 572 බලසේනා මූලස්ථානයේ බලසේනාධිපති වශයෙන් පත්වීම් භාර ගැනීම



කර්නල් ඩබ්ජ්සීඑන් වරකාගොඩ පීඑස්සී 2018.12.02 වන දින 651 බලසේනා මූලස්ථානයේ බලසේනාධිපති වශයෙන් පත්වීම් භාර ගැනීම



කර්නල් ආර් ඇල්විටිගල යූඑස්පී 2019.01.07 වන දින 233 බලසේනා මූලස්ථානයේ බලසේනාධිපති වශයෙන් පත්වීම් භාර ගැනීම



කර්නල් ඒපී වික්‍රමසේකර යූඑස්පී පීඑස්සී 2019.04.03 වන දින 621 බලසේනා මූලස්ථානයේ බලසේනාධිපති වශයෙන් පත්වීම් භාර ගැනීම



කර්නල් ආර්එම්පීඑස්බී රත්නායක ජ්‍යෙෂ්ඨ නිලධාරී 2019.04.03 වන දින 561 බලසේනා මූලස්ථානයේ බලසේනාධිපති පත්වීම් භාර ගැනීම

# පදක්කම් / උසස් වීම් / ජයග්‍රහණ / පාඨමාලා

## විශිෂ්ඨ සේවා විභූෂණ පදක්කම් ලාභීන්



මේජර් ජෙනරාල්
එන්එම් හෙට්ටිආරච්චි වීඑස්වී
යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී



මේජර් ජෙනරාල්
එච්පී සෙනවිරත්න වීඑස්වී
යූඑස්පී එන්ඩීයූ



මේජර් ජෙනරාල්
බීඑච්එම්ජේ විජේසිංහ (විශ්‍රාමික) වීඑස්වී යූඑස්පී
එන්ඩීයූ පීඑස්සී

## මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීන්



මේජර් ජෙනරාල්
ඩීආර් ධර්මසිරි යූඑස්පී එච්ඩීඑම්සී



මේජර් ජෙනරාල්
කේඑම්ආර්පී කරුණාතිලක පීඑස්සී



මේජර් ජෙනරාල්
සීඑම්ඩීපී චන්ද්‍රසේකර එන්ඩීයූ

## බ්‍රිගේඩියර් නිලයට උසස්වීම් ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීන්



බ්‍රිගේඩියර්
ඩබ්ජී ඩයස් (විශ්‍රාමික)



බ්‍රිගේඩියර්
එච්එම්එල්ඩී හේරත් ආර්එස්පී
යූඑස්පී පීඑස්සී



බ්‍රිගේඩියර්
කේඩබ්එස් රත්නායක



බ්‍රිගේඩියර්
ඩීඑල්එස්යූ ද සිල්වා යූඑස්පී

## ජයග්‍රහණයන්



මේජර් ටීඑම්ටීඑන්ඩී තෙන්නකෝන් පීඑස්සී
2 වන ස්ථානය
අණ හා මාණ්ඩලික පාඨමාලාව අංක 11



කපිතන් ආර්පීඑම්ටීඩීබී රත්මල්වින්න
3 වන ස්ථානය
කපිතන් සිට මේජර් දක්වා නිල උසස් කිරීමේ විභාගය 2018



කපිතන් ජේඑස්සීඑල්සී ජයසුන්දර
6 වන ස්ථානය
ලුතිනන් සිට කපිතන් දක්වා නිල උසස් කිරීමේ විභාගය 2018



කපිතන් ඩීආර්පී හේවගේ
8 වන ස්ථානය
ලුතිනන් සිට කපිතන් දක්වා නිල උසස් කිරීමේ විභාගය 2018



කපිතන් වයිපී වන්නිආරච්චි
9 වන ස්ථානය
ලුතිනන් සිට කපිතන් දක්වා නිල උසස් කිරීමේ විභාගය 2018



ලුතිනන් ඩීඑච්එම්ආර්පී තම්මිට
1 වන ස්ථානය
ලුතිනන් සිට කපිතන් දක්වා නිල උසස් කිරීමේ විභාගය 2018 (ස්වේච්ඡා)



සැරයන් හේරත් එච්එම්ටීඅයිබී
3 වන ස්ථානය
සරඹ උපදේශක පාඨමාලාව අංක 119



කෝප්‍රල් කරුණාතිලක එස්ඩීඑම්සී
හොඳම කළමනාකරණ ව්‍යාපෘති වාර්තාව
උසස් තොරතුරු තාක්ෂණ පාඨමාලාව - ඉන්දියාව

## පාඨමාලා



බ්‍රිගේඩියර් පීඑජේ පීරිස්
National Security & War Course
(NSWC) 2018/2019 - Pakistan



ලුති: කර්නල් කේවීපී ධම්මික යූඑස්පී
Technical Staff College Course
(TSOC) - India

## 11 වන අණ හා මාණ්ඩලික පාඨමාලාව සාර්ථකව හැදෑරූ නිලධාරීන්



මේජර් ටීඑම්ටීඑන්ඩී
තෙන්නකෝන් පීඑස්සී



මේජර් ආර්එම්පීජී
මුත්තෙට්ටුගේ පීඑස්සී



කපිතන් ආර්එම්එස්පී
බණ්ඩාර පීඑස්සී



කපිතන් එපී කාරියවසම්
පීඑස්සී

# FOREIGN COURSE PARTICIPANTS OFFICERS

| | | | |
|---|---|---|---|
| Col | KAWS Rathnayake | Senior Command Course 143 | India |
| Col | WACN Warakagoda psc | Senior Command Course 144 | India |
| Col | DMPP Dasanyaka | Senior Command Course 144 | India |
| Lt Col | NPA Mendis psc | International Social Etiquette Counsultant Training & Certification | London |
| Maj | PGCL Kumarasiri | Communication Equipment,Maintenance and Management Programme | China |
| Maj | WRMR Wickramasinghe USP | Communication Equipment,Maintenance and Management Programme | China |
| Maj | HKU Nadeeka USP | Communication Equipment,Maintenance and Management Programme | China |
| Maj | MPCB Jayashantha USP | Communication Equipment,Maintenance and Management Programme | China |
| Maj | WPDN Abeyrathne | Information Security of Automated System | Russia |
| Maj | MC Tukkawadu | Information Security of Automated System | Russia |
| Maj | DANL Tennakoon | JSC (Sig) | Pakistan |
| Maj | RMKUK Ratnayake | JSC (Sig) | Pakistan |
| Maj | NG Kasthuriarachchi | Tailor Made Cyber Security Course | India |
| Maj | JADR Jayasinghe | Tailor Made Cyber Security Course | India |
| Maj | WWWWTWKMRNDB Weliwita | Tailor Made Cyber Security Course | India |
| Maj | HMRL Kularathne | Tailor Made Cyber Security Course | India |
| Maj | IDC Rodrigo | Tailor Made Cyber Security Course | India |
| Maj | DSA Dolawaththa | Tailor Made Cyber Security Course | India |
| Maj | MMUIB Wawegedara | Tailor Made Cyber Security Course | India |
| Maj | MG Pathirana | Tailor Made Cyber Security Course | India |
| Maj | ASMP Chameera | Tailor Made Cyber Security Course | India |
| Maj | ULCD Perera psc | Signal Company Commander Course - 119 | India |
| Maj | SL Meegoda psc | Australian Defence Force Operations Course | Australia |
| Maj | JMD Nuwan | Advance Computing Course - 08 | India |
| Maj | BMMB Herath | JSC (SIG) - 59 | Pakistan |
| Maj | WDIP DeAlwis | JSC (SIG) - 59 | Pakistan |
| Maj | PAR Antoneys psc | Signal Company Commander Course - 120 | India |
| Maj | TKU Nishantha RSP psc | Signal Company Commander Course - 120 | India |
| Capt | HMCJ Medawaththa | Basic Airborne Course (BAC) - 231 | Pakistan |
| Capt | RMTL Rathnayake | Para Basic Course | India |
| Capt | KGSR Wijesingha | Information Security of Automated System | Russia |

| | | | |
|---|---|---|---|
| Capt | HT Gamage | Information Security of Automated System | Russia |
| Capt | SMCR Senevirathne | Information Security of Automated System | Russia |
| Capt | IGCPH Illangathilake | Information Security of Automated System | Russia |
| Capt | SPIU Dayaratne (Lady Offr) | Information Security of Automated System | Russia |
| Capt | SMKN Wijesekara | Tailor Made Cyber Security Course | India |
| Capt | MM Siriwardena | Young Officers Course (Sig) 60 | Pakistan |
| Capt | WSM Ranasinge | Young Officers Course (Sig) 60 | Pakistan |
| Capt | M Jayasuriya | Signal Young Officer Course 151 B | India |
| Capt | TSNK Peiris | Signal Young Officer Course 151 B | India |
| Capt | PS Senevirathna | Young Officers Course (Sig) 55 | Pakistan |
| Capt | DA Jayasooriya | Young Officers Course (Sig) 55 | Pakistan |
| Capt | LAMASB Liyadipita | Basic Airborne Course | Pakistan |
| Capt | JMMS Kularathne | 5th Editions of the UN Signal Academy Women's Outreach Course | Uganda |
| Capt | (QM) SCP Siriwardane | Quarter Master Officer Course | India |
| Lt | KP Anurada | Information Security of Automated System | Russia |
| Lt | BAMS Thilakarathna | Information Security of Automated System | Russia |
| Lt | WDN Gunarathne | Information Security of Automated System | Russia |
| Lt | IGSB Gamage | Master Fitness Instructor Course (MFIC) 20 | Pakistan |
| Lt | AGTD Perera | Para Basic Course | India |
| Lt | WACJ Weerasinghe | Basic Airborne Course | Pakistan |

## FOREIGN COURSE PARTICIPANTS OTHER RANKS

| | | | |
|---|---|---|---|
| S/Sgt | Herath HMPA | Junior Leader Course (JLC) | India |
| S/Sgt | Jayasinghe JMR | Junior Leader Course (JLC) | India |
| S/Sgt | Dushantha KG | Advance Information Technology (All Arms) JCOS/OR No - 32 | India |
| S/Sgt | Vithana SJG | Advance Information Technology (All Arms) JCOS/OR No - 31 | India |
| S/Sgt | Mapalagama NG | Advance Data Processing (JN) Course - 75 | India |
| S/Sgt | Susantha Kumara DWB | Information Technology Database Management JCOS/OR No - 34 | India |
| Cpl | Karunathilaka SDMC | Advance Information Technology Course | India |
| Cpl | Rathnayake EMPC | Network Technical Course | Bangladesh |
| Cpl | Thilakasiri MS | Network Technical Course | Bangladesh |
| Cpl | Sugathapaala WHKA | Advance Information Technology Course | India |
| Cpl | Dissanayake WM | Para Basic Course | India |
| L/Cpl | Silva SMM | Network Assistant Course – 05 | Bangladesh |
| L/Cpl | Welagedara KJB | Physical Training Assistant Instructors Basic Course | India |

# ක්‍රීඩා දක්ෂතාවයන්

## 2019 වර්ෂයේ ශ්‍රී ලංකා සංඥා බලකාය අන්තර් රෙජිමේන්තු ඔරු පැදීමේ ශූරතාවය දිනාගනී




ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි අන්තර් රෙජිමේන්තු ඔරු පැදීමේ තරගාවලිය ප්‍රථමවරට 2019 අගෝස්තු මස 22 හා 23 යන දෙදින දියවන්නා ඔයෙහි පවත්වන ලදි. එහි සමස්ත ශූරතාවය සංඥා බලකා කණ්ඩායම දිනා ගත් අතර, රන් පදක්කම් 5 ක්, රිදී පදක්කම් 2 ක් හා ලෝකඩ පදක්කම් 1 ක් දිනා ගැනීමට සමත් විය.

## 2019 යුද්ධ හමුදා මාර්ග ධාවන තරගයේ ශ්‍රී ලංකා සංඥා බලකා කාන්තා කණ්ඩායම ශූරතාවය දිනාගනී

2019 ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාර්ග ධාවන තරගය කාන්තා මැරතන් ධාවන තරගයෙහි 2019.03.24 වන දින හික්කඩුවෙහි පැවැත්වූ අතර සංඥා බලකා කාන්තා කණ්ඩායම ශූරතාවය දිනාගන්නා ලදි. එහි පිරිමි මැරතන් ධාවන තරගයෙහි ලා/කෝ දිසානායක ඩීඑම්එස්ඩී 2 වන ස්ථානය දිනාගන්නා ලදි.








## 56 වන යුද්ධ හමුදා මළල ක්‍රීඩා තරගාවලියේ ශ්‍රී ලංකා සංඥා බලකා කාන්තා මළල ක්‍රීඩා කණ්ඩායම අනුශූරතාවය දිනාගන්නා ලදී



56 වන යුද්ධ හමුදා මළල ක්‍රීඩා තරගාවලියේ ශ්‍රී ලංකා සංඥා බලකා කාන්තා මළල ක්‍රීඩා කණ්ඩායම අනුශූරතාවය දිනාගන්නා ලදී. 2019 අගෝස්තු මස 21, 26, 27 සහ 28 යන දිනවල කොළඹ සුගතදාස ක්‍රීඩාංගනයේදී පවත්වන ලදී.

## 2019 අන්තර් රෙජිමේන්තු හා රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ චෙස් ශූරතාවයෙන් සංඥා බලකාය ඉදිරියෙන්



2019 අන්තර් රෙජිමේන්තු හා රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ චෙස් ශූරතා තරඟාවලියේ දියතලාව පුහුණු චෙඩික්කරු හා ස්නයිෆර් පුහුණු පාසලේදී ජනවාරි මස 11 වන දින පවත්වන ලදි.

මෙම චෙස් තරඟාවලියේ පිරිමි කණ්ඩායම් ශූරතාව සංඥා බලකා කණ්ඩායම දිනාගත් අතර, සංඥා බලකා කාන්තා කණ්ඩායම අනුශූරතාවය දිනා ගන්නා ලදී.

## ශ්‍රී ලංකා සංඥා බලකාය අන්තර් රෙජිමේන්තු ගෘහස්ත ඔරු පැදීමේ ශූරතාවය ලබාගනී

අන්තර් රෙජිමේන්තු ගෘහස්ත ඔරු පැදීමේ තරඟාවලිය 2018 ඔක්තෝබර් මස 25. 26 වන දිනයන්හි පනාගොඩ යුද හමුදා ජනපදයේ ක්‍රීඩා සංකීර්ණයේදී පැවැත්වුණි. එහිදී ශ්‍රී ලංකා සංඥා බලකාය විසින් සමස්ථ පිරිමි ශූරතාවය දිනාගත් අතර, කාන්තා කණ්ඩායම සමස්ථ කාන්තා ශූරතාවය දිනාගන්නා ලදි.









## ප්‍රවීණත්වයෙන් පිරිපුන් ශූරත්වය

2019 වර්ෂයේදී ශ්‍රී ලංකා ස්කොෂ් සංචිතයේ විවෘත ස්කොව් තරඟාවලියේ ප්‍රවීණත්වයෙන් පිරිපුන් ශූරතාවය ශ්‍රී ලංකා සංඥා බලකායේ කර්නල් එස්එච්පීඩී තිලකරත්න ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් දිනාගන්නා ලදි.



## වසරේ හොඳම මළල ක්‍රීඩකයා සංඥා බලකායෙන් බිහිවිය

55 වන ශ්‍රී ලංකා යුද හමුදා මළල ක්‍රිඩා ශූරතාවලියේ ශ්‍රී ලංකා සංඥා බලකායේ ලාන්ස් කෝප්‍රල් විමලසිරි ඒජීජේපී දුර පැනීමේ ඉසව්වෙහි විශේෂ දක්ෂතා දක්වමින් එහි රන් පදක්කම දිනාගත් අතර, සමස්ථ ශූරතාවලියෙහි හොඳම මළල ක්‍රිඩකයා බවටද තේරී පත්විය.

## මළල ක්‍රීඩා



**ලා/කෝ විමලසිරි ඩීඑ්පීජේපී**

2019 ආසියානු මළල ක්‍රීඩා තරගාවලියේ දුර පැනීමේ තරගාවලියේ3 වන ස්ථානය. 2019 ඕස්ට්‍රේලියාවේ පැවති මළල ක්‍රීඩා තරගාවලියේ 7 වන ස්ථානය.
2019 ආසියානු ඉරාන් ග්‍රෑහස්ථ මළල ක්‍රීඩා තරගාවලිය දුර පැනීමේ තරගාවලියේ 3 වන ස්ථානය.



**සංසෙ(කා) සුගතපාල එම්පීඅයිකේ**

2019 අන්තර් රෙජිමේන්තු ආධුනික මළල ක්‍රීඩා තරගාවලියේ දක්ෂතම ක්‍රීඩිකාව. මීටර්:10000 මීටර්:5000 මීටර්:1500 1 වන ස්ථානය හිමි කර ගැනීම.



**සංසෙ(කා) රත්නායක ආර්එම්එන්එම්**

2019 අන්තර් රෙජිමේන්තු ආධුනික මළල ක්‍රීඩා තරගාවලියේ මීටර් 10000 3 වන ස්ථානය, මීටර් 5000 2 වන ස්ථානය හිමි කර ගැනීම.



**සංසෙ(කා) මධුවන්ති ජේකේසීඑස්**

2019 අන්තර් රෙජිමේන්තු ආධුනික මළල ක්‍රීඩා තරගාවලියේ කණ්ඩායම් 3 වන ස්ථානය දිනා ගැනීම, මීටර් 1500 3 වන ස්ථානය හිමි කර ගැනීම.

## සවි එසවීම



**ලා/කෝ සේනක එම්ඩීඑම්**

2018 අන්තර් රෙජිමේන්තු සවි එසවීම කිලෝ ග්‍රෑම් 105 1 වන ස්ථානය. 2019 අන්තර් රෙජිමේන්තු සවි එසවීම කිලෝ ග්‍රෑම් 105 1 වන ස්ථානය.



**කෝප්‍රල් බණ්ඩාර කේඩීඩීඑස්**

2019 අන්තර් රෙජිමේන්තු සවි එසවීම කිලෝ ග්‍රෑම් 74 3 වන ස්ථානය.

## ඔරු පැදීම



**සංසෙ මධුසර ඩබ්එල්අයිජ්**

34 වන ජාතික ජ්‍යෙෂ්ඨ ඔරු පැදිමේ තරගාවලියේ පිරිමි Coaxless Pair 2 වන ස්ථානය. කාලය 7:26:66.

## කැරම්



**සංසෙ කලල්ඩීන් එම්එස්**

2019 අන්තර් රෙජිමේන්තු කැරම් තරගාවලියේ කණ්ඩායම් තරගය 3 වන ස්ථානය හිමි කරගැනීම.
2019 අන්තර් රෙජිමේන්තු කැරම් තරගාවලියේ කේවල තරගය 2 වන ස්ථානය හිමිකර ගැනීම.

## මාර්ග ධාවන තරග




**ලා/කෝ දිසානායක ඩීඑම්එස්ඩී**

ලා/කෝ දිසානායක ඩීඑම්එස්ඩී අන්තර් රෙජිමේන්තු මාර්ග ධාවන තරගාවලියේ 2 වන ස්ථානය දිනා ගැනීම.

## කායවර්ධන



**කෝප්‍රල් ප්‍රේමතිලක අයිඑම්සීපී**

2018 අන්තර් රෙජිමේන්තු කායවර්ධන කිලෝ ග්‍රෑම් 70 3 වන ස්ථානය.



**සංසෙ සංදීප් ආර්සී**

2018 අන්තර් රෙජිමේන්තු කායවර්ධන කිලෝ ග්‍රෑම් 85 3 වන ස්ථානය.



**සංසෙ පතිරණ ඊඑම්**

2018 අන්තර් රෙජිමේන්තු කායවර්ධන කිලෝ ග්‍රෑම් 65 2 වන ස්ථානය.

## ධාවන පැදි



**සංසෙ සිල්වා ඩීබීකේ**

අන්තර් රෙජිමේන්තු සුපර් ක්‍රොස් තරගාවලිය MX 125cc 1 වන ස්ථානය MX 250cc 1 වන ස්ථානය හා හොඳම ධාවන පැදිකරු.
2018 වසරේ ශ්‍රී ලංකාවේහි පැවති යතුරුපැදි ධාවන තරගයන්ගේ දක්ෂතාවයන්ට අනුව හොඳම ධාවන ශූරයා වශයෙන් සම්මාන ලැබීම.

## කායකින්



**කෝප්‍රල් මධුශාන් ඊඑම්ඊ**

2019 ජාතික කායකින් C4 500 1 වන ස්ථානය
2019 ජාතික කායකින් C4 200 3 වන ස්ථානය
2019 ජාතික කායකින් C4 1000 2 වන ස්ථානය
2019 ජාතික කායකින් C2 500 1 වන ස්ථානය

## ඔරු පැදීම



**ලා/කෝප්‍රල් පෙරේරා පීඅයිපී**

ඉන්දියාවේ පැවති ජාත්‍යන්තර ඔරු පැදීමේ කවුන්සිලයේ විනිසුරුවරුන් සඳහා පැවැත්වෙන දෙවන අධියරයෙහි ඔරු පැදීමේ පාඨමාලාවේ 6 වන ස්ථානය දිනා ගැනීම.

## DIGITAL FORENSICS

Digital forensics, sometimes called computer forensics, is the application of scientific investigatory techniques to digital crimes and attacks. It is a crucial aspect of law and business in the internet age.

Law enforcement was somewhat slow to understand the necessity of applying forensics techniques to computers and high-tech equipment. For the most part, in the 1970s and 1980s early digital forensics pioneers were people who worked at police or federal law enforcement agencies and who happened to also be computer hobbyists. One of the first areas that came to the attention of law enforcement was data storage, as investigators had long worked to seize, retain, and analyze documentation from suspects; it began to dawn on them that much of that documentation was no longer committed to paper. In 1984, the FBI launched the Magnet Media Program to focus on these digital records, the first official digital forensics program at a law enforcement agency.

Meanwhile, many of the techniques used to track down and identify hackers as they intruded into computer systems were developed ad hoc in the private sector. A generally identified seminal moment came in 1986, when Cliff Stoll, a Unixsysadmin at Lawrence Berkeley National Laboratory, tried to figure out a $0.75 discrepancy in an accounting log and ended up fingering a German hacker who was breaking into sensitive systems and selling data to the KGB. Along the way, Stoll created what was probably the first honeypot trap. There are a number of process models for digital forensics, which define how forensics examiners should proceed in their quest to gather and understand evidence. While these can vary, most processes follow four basic steps:

(a) Collection.
(b) Examination.
(c) Analysis.
(d) Reporting.

Depending on the type of devices, media or artifacts, digital forensics investigation is branched into various types.

(a) Computer forensics.
(b) Mobile device forensics.
(c) Network forensics.
(d) Database forensics.

12 SLSC(CS) performing internal forensic investigations with Dte of MI and SIU- SLCMP. Computer and mobile forensic tools are available with Digital Forensic Squadron12 SLSC(CS) and annually conducting more than 20 investigations. Responsibilities of this Squadron as follows:

a. Provide Computer and Mobile forensic investigation support for the Dte of MI and SLCMP.
b. Conducting Digital Forensic training programs for SL Army personals.
c. Malware reveres Engineering.
d. Provide support for Digital Forensic related procurements.
e. Provide support for cyber policy and law developments.

**Major VN Liyanapathirana**

# CYBER DEFENSE

## What is Cyber Defence?

Cyber defense is a computer network defense mechanism which includes response to actions and critical infrastructure protection and information assurance for organizations, government entities and other possible networks.

## What is Cyberattacks?

A cyber-attack is a malicious and deliberate attempt by an individual or organization to breach the information system of another individual or organization. Usually, the attacker seeks some type of benefit from disrupting the victim's network.

## What Are the Most Common Cyberattacks?

**Malware** : Malware is a term used to describe malicious software, including spyware, ransomware, viruses, and worms. Malware breaches a network through a vulnerability, typically when a user clicks a dangerous link or email attachment that then installs risky software.

**Phishing :** phishing is the practice of sending fraudulent communications that appear to come from a reputable source, usually through email. The goal is to steal sensitive data like credit card and login information or to install malware on the victim's machine. Phishing is an increasingly common cyber threat.

**SQL Injection Attack** : A Structured Query Language (SQL) injection occurs when an attacker inserts malicious code into a server that uses SQL and forces the server to reveal information it normally would not. An attacker could carry out a SQL injection simply by submitting malicious code into a vulnerable website search box.

**Cross-Site Scripting (XSS) :** XSS enables attackers to inject client-side scripts into web pages viewed by other users. A cross-site scripting vulnerability may be used by attackers to bypass access controls such as the same-origin policy.

**Denial-of-Service (DoS)** : A denial-of-service attack floods systems, servers, or networks with traffic to exhaust resources and bandwidth. As a result, the system is unable to fulfill legitimate requests. Attackers can also use multiple compromised devices to launch this attack. This is known as a distributed-denial-of-service (DDoS) attack.

**Session Hijacking and Man-in-the-Middle Attacks** : Man-in-the-middle (MitM) attacks, also known as eavesdropping attacks, occur when attackers insert themselves into a two-party transaction. Once the attackers interrupt the traffic, they can filter and steal data.

**Zero-day exploit** : A zero-day exploit hits after a network vulnerability is announced but before a patch or solution is implemented. Attackers target the disclosed vulnerability during this window of time. Zero-day vulnerability threat detection requires constant awareness.

## How to defend cyber attacks

Followings are the three phases should consider when we defending against cyber attacks.

**Prevention** : Conventional defenses, including firewalls and antivirus software, remain an integral part of an organization's security lineup.

**Detection** : Should implement intelligent security management that aggregates information from a variety of sources – and analyzes it in real time to shield systems from attack vectors. To combat these emerging threats security professionals should implement Security Operation Center to monitor imagine threats.

**Reaction** : There is no way to guarantee assets are fully safe. Even when all available mechanisms are in place, hackers may still successfully infiltrate networks. Must be prepared for these scenarios – and have recovery plans ready, and cyber emergency response teams (CERTs) on standby. CERTs identify, verify and counter threats, detect and evaluate vulnerabilities, and manage security architectures.

**Major JMD Nuwan, MSc (Information Security), MBCS, C|EH, C|HFI**

# GEOGRAPHIC INFORMATION SYSTEMS (GIS) FOR MILITARY FORCES

Geographic Information System (GIS) play a pivotal role in military operations as they are essentially spatial in nature. The concept of Command, Control, Communication and Coordination in military operations are largely dependent on the availability of accurate information in order to arrive at quick decisions for operational orders. In the present digital era, GIS is an excellent tool for Military commanders in the operations.

**GIS in Military Operations:** Security forces gathers data on routing, filtering, analyzing and presenting information for decision-making. The regional conflicts, rapid deployment and flexible response imposes heavy burden on military commanders, their staff and supporting system to keep up-to-date situation on the ground about enemy activities. Therefore digital mapping and Geographic Information System (GIS) occupy center stage in activities as diverse as battlefield simulation, mission briefing and communications planning, logistics management and command control.

**Defense Estate Management:** Use of GIS in the management of military bases facilitates maintenance and the tackling of all stores, GIS allows military land and facilities managers to reduce base operation and maintenance costs, improve mission effectiveness.

**Terrain Evaluation:** In land based military operations Military field commanders would like to know terrain conditions, elevations for maneuvering armour carriers, tanks and for use of various weapons. In addition, they need vegetation cover, road networks, and communication lines with pin pointing accuracy for optimizing the resource utilization.

**Viewing Spatial Data:** Most potential users of GIS are viewers. Command staff need access to a geographic picture, map or photograph to help and assess a situation to carry out planned operations.

**Naval Operations:** At sea naval vessels depend largely on indirect methods to navigate when there is no means of establishing their position with visual aids. Global Positioning System (GPS) provides the means of determining the position at sea.

**Air Operations:** Air operations in battle environment require the similar inputs as per land operations along with precise height information for targeting. These include the detailed information about the target location, proximity of civilian areas, and terrain evaluation and meteorological conditions besides navigational data.

**Weather Information:** Weather plays dominant role in the battlefield. Every battlefield commander would like to know the information regarding cloud coverage, wind conditions, visibility, temperature parameters and other related inputs.

**Positional Information:** The computer based Geographical Information Systems can provide automated assistance to military forces terrain analysis function.

**Logistics Management:** GIS plays an important role military logistics because it helps in moving supplies, equipment, and troops where they are needed at the right time and place. By using GIS in determining routes for convoys, forces are able to determine alternative routes if mishaps or traffic jams occur on the most direct route.

**MappingTechniques:** From the above it is evident that Military needs maps for different purposes within its operational command and each requirement is to cater for a specific purpose. The digital base in GIS environment facilitates the creation of different types of maps.

**Major Upul Wawegedara**

# E-COMMERCE READINESS OF SRI LANKA

Electronic commerce (E-Commerce) has emerged with the development of Internet and spread rapidly because of its capability of improving efficiency and productivity in many business areas. Many countries paid attention on developing e-commerce and its usage and benefitting from it today. However the adaptation of developing countries to e-commerce was a challenge because of the infrastructure limitations and other issues related to consumers. Sri Lanka has not yet passed the medium level of e-readiness because of the less coverage of Internet and low computer and Internet literacy levels.

According to eMarketer, retail e-commerce sales in Asia-Pacific for 2016 are predicted to reach $877.61 billion, an increase of 35.7 percent from 2016. Sales in this region are reportedly faster than the average rate worldwide. While bigger players such as China, Indonesia and India are driving the region's growth, countries including Sri Lanka are experiencing growing demand for reliable e-commerce websites. In fact, Southeast Asia is forecast to become the third-largest e-commerce market globally.

The Internet penetration in Sri Lanka is growing, granting more people access to the Web. What's more, this year, Google's Project Loon will provide Sri Lanka with affordable Internet solutions, further boosting the country's connectivity in both urban and rural areas. As a result, Sri Lanka's already growing e-commerce sector is expected to go from strength to strength.

Add to this the staggering growth of Sri Lanka's mobile industry. The country now has a mobile penetration of 115 percent, according to BuddeComm, with the accessibility of smartphones growing rapidly. As the country shifts online, and more time is spent online, both via desktop and mobile, the e-commerce sector becomes more important.

The country's growing middle class, with an increasing disposable income to spend on consumer goods, coupled with improved Internet access, is also boosting the sector. With more money in their pockets, more middle-class Sri Lankans are turning to the Web to purchase everyday items.

2006 saw the introduction of the Electronic Transactions Act, No.19, which facilitates e-commerce by removing legal barriers and ensuring legal certainty both within Sri Lanka and internationally. While awareness of online shopping is growing, financial institutions must develop, to offer reliable online payment services to support the expansion of e-commerce, while creating a competitive marketplace.

The booming tourism sector is expected to contribute to the success of the e-commerce market in Sri Lanka. Currently, traditional methods are used to book trips to and within Sri Lanka; as more bookings are made both domestically and internationally, the country will likely follow its western counterparts in implementing an online system.

However the existing Internet users display comparatively high adaptability to e-commerce transactions. Sri Lankan Internet user has a moderate level of Internet shopping usage while more people pay bills through Internet and access Internet banking application. With this the current level of ecommerce readiness of country can be said as in a higher medium level compared to the world averages and display better performance than other countries in region and similar economic indicators. However the spending on Internet and frequency of online purchases were in very low levels and less availability of buying options coupled with low trust on e-commerce sites created such a behavior.

**Captain DGCP Piyasena.**

## ඔන්ලයින් කාලගුණය දැනගන්න හොඳම ක්‍රමය

කාලගුණික තත්වය කලින්ම දැන සිටීමෙන් තමන්ගේ වැඩකටයුතු සැලැස්මකින් යුතුව සිදුකිරීමට පුලුවන්. අපි මේ හඳුන්වාදෙන වෙබ් අඩවිය මගින් ඔබට ඕනෑම වෙලාවක කාලගුණක තත්වය බලන්න පුලුවන්. අද දවසේ කාලගුණය, හෙට දිනයේ, ඉදිරි දින කිහිපයේ, ඉදිරි සතියේ හෝ මාසයේ කාලගුණය මෙමගින් නිවැරදිව අපට පෙන්වනවා.

www.windy.com




**නි/70572 ලුතිනන් පීජීඩීඩබ්එල් පලිහවඩනගේ ශ්‍රීලංසංබ**

# Li-Fi




Li-Fi යනු Light Fidelity යන පෙළ සඳහා වන කෙටි යෙදුමකි. Wi-Fi (Wireless Fidelity) තාක්ෂණයේදී භාවිතා වන ගුවන් විදුලි තරංග වර්ගයට අයත් ගුවන් විදුලි සහ ක්ෂුද්‍ර යන තරංග වර්ග දෙක අතර සංඛ්‍යාතයක් ඇත. එසේ භාවිතයට හේතුව ද ගුවන් විදුලි සහ ක්ෂුද්‍ර තරංගවලින් සිදුවිය හැකි බලපෑමයි. කෙසේ වුවද මෙම Li-Fi තාක්ෂණයේදී භාවිත වන තරංග වර්ගය නම් සරලවම දෘෂ්‍ය ආලෝකයයි. දෘෂ්‍ය තරංග පරාසය තෝරා ගැනීමට ගුවන් විදුලි තරංග පරාසයේ ඇති තදබදය හේතුවක් වුවා විය හැක.

එහෙත් Li-Fi තාක්ෂණයේ ප්‍රබලම වාසිය එහි සුපිරි වේගයයි. නවතම සොයාගැනීම්වලට අනුව පෙනී ගොස් ඇත්තේ මෙම Li-Fi හට Wi-Fi ද ප්‍රතිස්ථාපනයට තරම් බලයක් ඇති බවයි. මේ සියල්ල ඇරඹුනේ Vemenni නම් සමාගමක් Li-Fi තාක්ෂණයෙන් ක්‍රියාත්මක වන කුඩා පරිමාණයේ විදුලි බල්බයක් නිර්මාණය කිරීමත් සමගය. Li-Fi හි ප්‍රයෝගික මට්ටමේ හි ප්‍රායෝගික මට්ටමේ භාවිතයක් ඉදිරිත් කල ප්‍රථම සමාගම එය වේ.

එය ලොව සුපතලවීමට ප්‍රධානම හේතුව පාරිභෝගිකයාට වැදගත් වන්නේ තාක්ෂණයට වඩා තාක්ෂණයේ ප්‍රායෝගිකත්වය වීමයි. විවිධ අත්හදා බැලීම් සිදුකිරීමේදී සනාථ වී ඇත්තේ 1 Gbps තරම් වන දත්ත සංක්‍රමණ වේගයකට Li-Fi හට ළඟාවිය හැකි බවයි. මෙය ඔබ අප එදිනෙදා පරිහරණය කරන Wi-Fi සංඥාවලට වඩා 100 ගුණයක වේගයකි.

**සෙ/283985 මා/සැරයන් චමිල කුමාර එච්පීඑස් ශ්‍රීලංසංබ**

---

# TDMA තාක්ෂණය

TDMA (Time Division Multiple Access) යනුවෙන් හැඳින්වෙන්නේ ඩිජිටල් ජංගම දුරකථන ජාලවල භාවිතා වන බහුපත (Multiplex) කිරීමේ ක්‍රමවේදයයි. මෙහිදී එක් රේඩියෝ චැනලයක් එකවර ග්‍රාහකයක් කිහිපදෙනෙකුට භාවිතා කල හැක. එකම චැනලය ග්‍රාහකයන් ගණනාවක් එක අවස්ථාවක හවුලේ භාවිතා කරන අතර එක් එක් ග්‍රාහකයා එම චැනලයේ එක් කාල ලිවරයක් (Time Slot) භාවිතයට ගනී. දුර ඇමතුම් කථනය (Voice) ඩිජිටල් දත්ත බවට පත් කර කෙටි කාල සීමාවකදී සම්ප්‍රේෂණය කෙරේ. GSM හිදී එක් චැනලයක් කාල විවර 8 බැගින් බෙදන අතර එකවර ග්‍රාහකයන් 8 දෙනෙකුට චැනලයක් හවුලේ භාවිතා කර සම්බන්ධතාව පවත්වා ගත හැක. සෑම ග්‍රාහකයෙකුම තමන්ට වෙන් කර ඇති චැනලයේ කාල විවරය තුල පමණක් සංඥා සම්ප්‍රේෂණය හා ග්‍රහණය සිදුකරයි. මෙම කාලවිවර මාරු කිරීම නැතහොත් ස්විච් කිරීම ඉතා සුලු කාලයක් වන තත්පරයකින් දහසකින් එකක් වැනි කුඩා කාලසීමාවකදී ස්වයංක්‍රියව කෙරෙන අතර ග්‍රාහකයන්ට තම චැනලය තවත් ග්‍රාහකයන් සමග හවුලේ භාවිතා කරන බව පවා නොදැනෙන තරමට ඉක්මනින් ක්ෂණිකව සිදු කෙරේ.







## චන්ද්‍රිකා දුරකථන (SatPhones)

චන්ද්‍රිකා දුරකථනයක් යනු අභ්‍යාවකාශයේ ඇති චන්ද්‍රිකා ආධාරයෙන් දුර ඇමතුම් ලබාගත හැකි ජංගම දුරකථනයකි. මෙම දුරකථන (SatPhone) ලෙස හඳුන්වයි. චන්ද්‍රිකා දුරකථන සඳහා විශේෂිත වූ චන්ද්‍රිකා පද්ධතියක් අභ්‍යාවකාශයේ රඳවා ඇති අතර චන්ද්‍රිකා දුරකථන එවන් චන්ද්‍රිකා සමග සෘජුවම සම්බන්ධතා ඇති කර ගනී. චන්ද්‍රිකා දුරකථනයකින් ලබාගන්නා දුර ඇමතුම් පෘථිවියේ ඇති ප්‍රවේශ ද්වාර මධ්‍යස්ථානයක් (gateway station) හරහා සාමාන්‍ය දුරකථන පද්ධතිවලට සම්බන්ධ වේ. මෙම ප්‍රදේශ ද්වාර මධ්‍යස්ථාන විශාල ප්‍රමානයේ චන්ද්‍රිකා ඩිෂ් ඇන්ටනා වලින් යුක්ත වන අතර චන්ද්‍රිකා දුරකථන පද්ධති වලට සම්බන්ධ කිරීම මෙම ප්‍රදේශ ද්වාර ස්ථාන මගින් සිදුකෙරේ.චන්ද්‍රිකා දුරකථන දුරස්ථ ප්‍රදේශ වලදී විශේෂයෙන් ප්‍රයෝජනවත් වන අතර සෙලියුලර් වර්ගයේ ජංගම දුරකථන ජාලයක සංඥා ආවරනය නැමැති හා වෙනත් හා සන්නිවේධන පහසුකම් නොමැති ප්‍රදේශ වලදී මෙමගින් දුර ඇමතුම් ලබා ගැනීමට හැකිවීම විශේෂ වාසියකි. මෙවන් චන්ද්‍රිකා දුරකථන පද්ධති GMSS ( Global Mobile Satellite System ) යන නමින් හැඳින්වේ. චන්ද්‍රිකා දුරකථන සාමාන්‍ය භාවිතයේ ඇති සෙලියුලර් වර්ගයේ ජංගම දුරකථන වලට වඩා මිල වැඩි අතර දුර ඇමතුම්ද සාමාන්‍ය ජංගම දුර ඇමතුම් මිලට වඩා වැඩිවේ.

**සෙ/279616 මා/සැරයන් ධර්මසිංහ ඩබ්ජේ - 1 ශ්‍රීලංසංබ**

# කැටපත් පවුර

## The Postman

He wasn't graduated!
Either nor 10 A's.
He rode his black old bicycle.
To see my graduation.
Ringing as,
"Tin Tin Tin"
From one door to another.
Through tuft ways.
Via muddy paths.
Through stops and stops.
With a satchel full of mails!
To see me wearing the clock …

Even when I was late,
